# අප්‍රකට බ්‍රාහ්මී සෙල්ලිපි හා පුරාවස්තු

මහජන පුස්තකාලය

18127

# අප්‍රකට බ්‍රාහ්මී සෙල්ලිපි හා පුරාවස්තු.

—මෙතෙක් කිසිවකු ගවේෂණයකර නැති ලිපි හා පුරාවස්තු සමහරක්—



ගරු එල්ලාවල මේධානන්ද ස්ථවිර,

930

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ප්‍රකාශනයකි.
1984.

පර්යේෂණ ලිපි අංක 11.

මහජන පුස්තකාලය
ආශ්‍රිත ශාඛාව
වැලිගම.

# අප්‍රකට බ්‍රාහ්මී සෙල්ලිපි හා පුරාවස්තු.

Public Library - Weligama
L18127

-- පර්යේෂක —
ගරු එල්ලාවල මේධානන්ද
ස්ථවිරයන් වහන්සේ.

පරිග්‍රහණ අංකය: 18127
L
වර්ග අංකය:

- ප්‍රකාශනය
ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය.

1984

930.15493

විමර්ශන අංශය

විජයරාජ මුද්‍රණාලය - ඇහැලියගොඩ.

# පොතේ පවත.

1961 වර්ෂයේ සිට විවේකයක් ලත් හැම විටකම පුරාවස්තු ගවේශණයක යෙදීම මගේ ජීවිතයේ අනිවාර්‍ය අංගයක් විය. මේ නිසා ලංකාවේ විවිධ ප්‍රදේශවල පිහිටි පුරාවස්තු පිහිටි භූමි බලා කිසියම් අවබෝධයක් ඇතිකර ගැනීමට මට හැකිවිය. මෙතෙක් වගකිවයුතු පරිදි කිසිවකුගේ අවධානය යොමුවී නැති, එසේම කිසිදු ගවේෂණයක් කරනැති ස්ථාන ගැන කරුණු දැන ගැනීමට මේ අවස්ථාවලදී පුළුවන් විය. වලසතුන්ගේ රජදහන්වල ලෙහෙසියෙන් යා නොහැකි දුර්ගවල සැරිසැරීමෙන් පුරාවස්තු පිළිබඳ අවබෝධය මෙන්ම විවිධ බිහිසුණු අත්දැකීම්ද ලබා ගැනීමට හැකිවිය. සමහර විට මේ ගමන්වලදී නියමිත ආහාරයක්, පිපාසයට දියබිඳක් නොලත් අවස්ථා වැඩිවෙයි. ඉතිහාසය පුරාවස්තු, ආදිය පිළිබඳව බොහෝ දෙනා ලිපි ලියන්නේ ඒ පිළිබඳ නිවැරදි අවබෝධයකින් නොවේ. පොතකින් පුවත්පතකින් හෝ ආරංචියකින් දැනගන්නා පුරාවස්තුවක් ගැන මට සෑහීමකට පත්විය නොහැකිය. එය මගේ ඇසින්ම බැලීමට ඇති අතෘප්තිකර ආසාව හැම විටකම මා පොළඹවයි. සැතපුම් දහය පහළොහ, පයින් ගමන්කළ හැක්කේ කටු වන ලැහැබ් ප්‍රීතියෙන් තරණය කළ හැක්කේ මේ නිසාය.

යාල වනය තුළ ඇවිදීමේදී අම්පාර දිසාවේ ගන වනයන් තුළ ඇවිදීමේදී මුහුණපාන්ට වූ බිහිසුණු අවස්ථා පොතක් ලිවීමට ප්‍රමාණවත්ය. මහඔය සිට ඕමුණ හරහා මාදුරුඔය, කන්දේගම කන්දට ගිය ගමනේදී දිවා ආහාරය වූයේ කෙසෙල් ගෙඩි දෙකක් පමණි, පැවිදි කෙනෙකුට එක ආහාර වේලක් වැරදුන විට තුන්වේලක් කුසගින්නේ සිටීමට සිදුවන්නේය. මට මුහුණපාන්නට වූ එබඳු අවස්ථා අපමණය. ගනවනයේ පිහිටි නිලගිරි හෙල නගිද්දී ලෙස්සා ගිය මා නැවතුනේ ගස් දෙබලක හිරවීමෙනි. වැල්එල්ලුගොඩකන්දේ ලෙන් ලිපියක් පිටපත් කරද්දී වැල්පලංචිය කැඩී ගල්ගොඩකට ඇද වැටුණු මා ජීවත්වූයේ මේ පොත ලිවියයුතු නිසායයි සිතමි. බඹරගස්තලාවේ ලෙන් ලිපියක් පරීක්ෂාකරනතුරු ලෙණ තුළ සිටි දරුවන් බැලීමට වැලහින්න නොපැමිණ නුදුරින් බලා සිටියේ අපේ ''මෝඩ'' වැඩවලට අනුකම්පා කරමින් විය යුතුය.

මෙබඳු විවිධ අත්දැකුම් ලබමින් සෙවූ පුරාවස්තු පිළිබඳ වාර්තා අප්‍රමාණව මාළහ තිබේ. මේවා සමහරක් වරින් වර පොත් වශයෙන්ද, පුවත්පත් සගරාවල ලිපි වශයෙන්ද, වාර්තා වශයෙන්ද පළවී ඇත්තේය. මේ වර්ගයේ මගේ ප්‍රථම ග්‍රන්ථය වූයේ මාගම ගැන සම්පූර්ණ අලුත් තොරතුරු රැගත් ''මාගම රාජධානිය'' කෘතියයි. එහි සඳහන් පුරාවස්තු පිහිටි ස්ථාන සියල්ලම මගේ ඇසින් බලා අවබෝධකරගත් කරුණු අනුව

දක්වන ලද්දේය. මේ කෘතිය බිහිවීමෙන් පසු මවිසින් පළකර ඇති අනෙක් සියලු පොත් හා ලියන ලද ලිපිද ප්‍රත්‍යක්ෂය මුල්කරගත් ඒවාම විය. මෙම ගවේෂණ වලදී එක්කරගත් අප්‍රකට සෙල්ලිපි රැසක්ද වරින්වර සුලු වශයෙන් ප්‍රකාශ කරන්නට යෙදුනි.

මගේ පරීක්ෂණ ගැන උනන්දුවක් දක්වමින් මා ධෛර්යයට පත්කළ පිරිස උගතුන් අතර මෙන්ම නූගතුන් අතරද අපමණ ඇත. බොහෝ විද්වතුන් මගේ ලිපි ලේඛන ගැන ප්‍රශංසා කරමින් මා ධෛර්යවත් කිරීම ඒ අතර සතුටට කරුණකි. මගේ ගවේෂණ ගැන සැලකිලිමත්වූ මහාචාර්ය පුංචිබණ්ඩාර සන්නස්ගල මහතා මවිසින් සොයා ගෙන ඇති සෙල්ලිපි; පොතක් වශයෙන් මුද්‍රණය කළ යුතු බවට මුලින්ම මා උනන්දු කරවීය. මේ අතර ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ මාසික දේශන මාලාවේ දේශනයක් පවත්වන ලෙස මට ආරාධනයක් ලැබිනි. මේ අනුව 1983-අප්‍රියෙල් මස 28 දින '' රුහුණේ අප්‍රකට පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික තොරතුරු '' යන මාතෘකාව යටතේ කොළඹ කෞතුකාගාර දේශන ශාලාවේදී දීර්ඝ දේශනයක් මවිසින් පවත්වන ලදී. මෙදින රැස්වීමේ මූලාසනයදැරූ පූජ්‍ය, ආචාර්ය කඹුරුපිටියේ වනරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත්, ආචාර්ය නන්දදේව විජේසේකර ශූරීහුත් මගේ ගවේෂන බෙහෙවින් අගය කළහ. එසේම මෙදින මවිසින් සොයාගත් සෙල්ලිපි සංගමය මගින් ප්‍රකාශ කළයුතු බවටද යෝජනාවක් සම්මත විය. මේ කාර්යය සඳහා විශෙෂ උනන්දුවක් දක්වූ සංගමයේ ලේකම් වරයෙකු වූ පී. වීරසිංහ මහතාත් සාමාජිකයකුවූ නොයෙල් පීරිස් මහතාත් මුදලින් පවා ආධාර කිරීමට කැමති බව ප්‍රකාශ කෙරිනි.

කෙසේ හෝ මේ දිරිගැන්වීම් නිසා මවිසින් සොයාගත් බ්‍රාහ්මී ලෙන්ලිපි ප්‍රමාණයක් මෙසේ ඉක්මනින්ම එක් ප්‍රකාශනයකට එක් කිරීමට අදහස් කෙළෙමි.

මේ කෘතියේදී සෙල්ලිපි පිහිටි ස්ථානය ගැන ඉතා කෙටි හැඳින්වීමක්ද ලිපියේ පෙළ හා පරිවර්තනයද ඉදිරිපත්කර ඇත. සෙල්ලිපි වල වැදගත්ම යයි මට හැඟුණු කරුණු පිළිබඳව ඉතා කෙටියෙන් 'විමර්ශන' කොටසේදී සාකච්ඡා කළෙමි. හබුතගල විහාරය හා පූජකුණාව ගැන මවිසින් රැස්කළ තොරතුරු වෙනම ලිපිදෙකක් වශයෙන් පොතට එක්කළේ එතල ස්ථාන දෙක අද මුහුණ පා ඇති තත්ත්වය, හා ස්ථාන දෙකේ ඇති වැදගත් කමත් සැලකීම නිසාය. මේ ස්ථාන දෙක ගැන වගකිව යුත්තන්ගේ අවධානය යොමුවිය යුතුව ඇත. මේ සියල්ලම ගැන මට කීමට ඇති කරුණු බොහෝ ඇතත් ඒවා තදබල ලෙස සීමා කරන්නට සිදුවූයේ විශාල කෘතියක් බිහි කිරීමට ඇති ආර්ථික බාධක නිසාය.

මවිසින් පිටපත්කර ඇති ලිපි මෙන්ම පිටපත් කිරීමට අවශ්‍ය උපකරණ නොමැති නිසා පරීක්‍ෂාව පමණක් කරණ ලද ලිපි මහත් රැසකි. ඒවා කීපයක් ගැනද සටහනක් මෙහි යෙදුවේ කිසියම් කෙනෙකුට කළහැකි නම් එයට මග පෙන්වීමක් වශයෙනි. විසි වසරකට වැඩි කාලයක් ස්වේච්ඡාවෙන් තමාගේ ධනය, ශ්‍රමය කාලය වැය කරමින් මෙබඳු ගවේෂණයන් මවිසින් කරන ලද්දේ කිසිදු කීර්ති ප්‍රශංසාවක් හෝ ලාභයක් හෝ බලාපොරොත්තුවකින් නොවේ, හුදෙක් බෞද්ධ නෂ්ටාවශේෂයන් මතුකර තැබීමේ වැදගත්කම සලකාගෙනය. මෙබඳු කටයුතු කිරීමට හැම අතින්ම ශක්තිය ඇති උදවිය නිහඬව සිටීම විශාල පාඩුවකි.

මා විසින් සොයාගත් ශිලා ලෙඛන ආදිය පිළිබඳව නොයෙක්වර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවටද දැනුම් දී ඇතත් එයින් කිසිදු ප්‍රතිඵලයක් ලැබී ඇත්දැයි මේ තාක් මට දැනගැනීමට ලැබී නැත. සමහර විට මවිසින් දැන්වූ ස්ථාන හා ලිපි පරීක්‍ෂාකිරීමට මා සමග යාමට එන බව දන්වා ඇතත් මේ තාක් කවුරුවත් ඒදෝයි මම මගබලා සිටිමි. සමහර විට කාර්යබාහුල්‍යය නිසා හෝ මුදල් අගහිඟ නිසා හෝ පමාවනවා විය හැකිය. අවශ්‍ය උපකරණ අපට ඇත්නම් මේ සියලු ලිපිවල සප්‍රශී ලාංඡන ගැනීමට පුළුවන. මේ සම්බන්ධව ත්‍යාගශීලියකුවත් ඉදිරිපත් නොවීම අභාග්‍යයකි. ඇතැම් විහාරස්ථාන වලට පවා ලැබෙන විශාල ධන සම්භාරයන් පෞද්ගලික සුඛ විහරණයට නොයොදා මෙබඳු කාර්යයන් සඳහා යොදවන්නේ නම් ඉතා අගනේය.

මෙහි පළව ඇති සියලු ලිපිවල ඡායාපිටපත් පළ කිරීමේ වැදගත්කම කීපදෙනෙකුන් විසින්ම පෙන්නා දුන් නමුත්, එය මගේද මුලින්ම පැවති අදහස වූ නමුත් එය කිරීමට අධික වියදමක් දැරීමට සිදුවන හෙයින් නොහැකි විය එය අවශ්‍ය වන අයෙකුට මෙහි දක්වා ඇති විස්තර අනුව පරීක්‍ෂාකර පිටපත් ගැනීම අපහසු නොවේ.

පොතෙහි සියලු කටයුතු නිම වෙමින් පවතිද්දී සෙල් ලිපියක් ඇති තැනක් ගැන දැනගන්නට ලැබිනි. රත්නපුර මූලස්ථාන උපදිසාපති බන්දුල ලියනගේ මහතාට දැනගන්නට ලැබුනු මේ තොරතුර අනුව, ඒ මහතාත් මමත් එය පරීක්‍ෂා කළෙමු. එය පිහිටියේ රත්නපුර දිසාවේ කඳුකර කොටසට අයත් කිරිබත්ගලකන්දේ බටහිරි බෑවුමේ පිහිටි ලෙණකය. එරබද්ද විදුහලේ ආචාර්ය නිමල් ජයකොඩි මහතාගේ මග පෙන්වීම පරිදි ඉතා දුෂ්කර තැනක පිහිටි ලිපිය පිටපත්කර ගැනීමට මට හැකිවිය. මේ ලිපිය ඉතිහාසඥයන්ගේ අදහස් නව මගකට යොමු කරවන්නක් විය හැකිය. මේ ප්‍රදෙශයෙන් මෙබඳු වර්ගයේ ලිපි මෙතෙක් ලැබී නැත. වෙස්සගිරි, රිටිගල වැනි ලෙන් තරම්ම පැරණි කටාරම් කලාවට අයත් කටාරමක් සහිත මේ ලෙණ එතරම් විශාල වූවක් නොවේ. එහි පිහිටුවා තිබුනු ලිපිය මෙසේ කියවේ.

පරුමක රෙත පුතහ පරුමක පුශහ ලෙණෙ ශගශ.
(ප්‍රමුඛ රේවතගේ පුත්‍ර ප්‍රමුඛ පුශගේ ලෙණ සංඝයාට දෙන ලදී.)

රත්නපුර දිසාවේ මධ්‍යකඳුකර කොටසේද ඉපැරණි ආර්ය ජනාවාස තිබූ බවට මෙය ඉතා දුර්ලභ මෙන්ම වැදගත් සාධකයකි. ක්‍රි: පූර්ව දෙවන ශතකයේ මුල් කොටසට අයත් බ්‍රාහ්මී අක්ෂරයෙන් ලිපිය පිහිටුවා තිබේ.

මේ කාර්යයන්හිදී මට නන් අයුරින් සහාය දැක්වූ පහත සඳහන් හැමදෙනාටම මගේ ආදරස්තුතිය පිරිණැමිය යුතුවේ. වටිනා ප්‍රස්තාවනාවක් ලියාදීමෙන් ග්‍රන්ථය සැරසූ මහාචාර්ය **පුංචිබණ්ඩාර සන්නස්ගල මහතා** බලන්ගොඩ ප්‍රදේශයේ පර්යේෂණ වලදී අනුග්‍රහ දැක්වූ ගරු මහවැලි නියෝජ්‍ය අමාත්‍ය ඇම්.ඇල්.ඇම්. අබුසාලි මැතිතුමා බොහෝ පර්යේෂණ කටයුතු වලට සහාය දුන් ''ඉසුර'' සඟරාවේ ප්‍රධාන කර්තෘ මහතා, අම්පාර මහදිසාපතිව සිටි වයි.ඩබ්. ගුණවර්ධන මහතා, පොතේ පිටපත කියවා බැලූ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සෝමපාල ජයවර්ධන මහතා, මා දිරිමත්කළ කෞතුකාගාරයේ මානව විද්‍යාඥ පණ්ඩුල ඇඳගම; ගුවන් විදුලි සාරසමීක්ෂා මගින් මගේ පර්යේෂණ එළිදැක්වූ මහාචාර්ය ජේ.බී. දිසානායක, රාජා,ධර්මපාල, යන මහත්වරු; පූජකුණාවේ පරීක්ෂණවලදී සහායවූ අම්පාර සහකාර පොලිස් අධිකාරී බී.ඇම්.ලියනගේ උහන පොලිස් ස්ථානාධිපති ඩබ්ලිව්. ඇම්. ඇස්. වීරසිංහ යන මහත්වරු රිටිගල පර්යේෂණ රජරට ගුවන් විදුලි සේවයෙන් ප්‍රචාරය කළ රජරට ගුවන් විදුලි සේවයේ ස්වර්ණ ශ්‍රී බණ්ඩාර මහතා. කුඩුම්බිගල තපෝවනාධිපති ගරු තාඹුගල ආනන්දසිරි ස්වාමීන්වහන්සේ, පියංගල තපෝවනයේ ටී. සුභූති ස්වාමීන්වහන්සේ, බලංගොඩ දකුණ මා:අ:නි: එම්. දිවාකර බලංගොඩ උපදිසාපති කාර්යාලයේ මාණ්ඩලික සහකාර හේමසිරි විජේවර්ධන යන මහත්වරු, වැලිපතයාය විදුහල්පති ඩබ්ලිව්. යූ. ඒ. පියදස මොලමුරේ විදුහල්පති කේ. ඩී. ඩී. ගුණවර්ධන, ටිකිරි බණ්ඩාර යන මහත්වරු, අම්පාර දිසාවේ පර්යේෂණ වලට මගපෙන්වූ උහන කේ.සාමෙල් මහතා, මගේ පර්යේෂණ පිළිබඳ වාර්තා, ලිපි ලෙබන පළකළ ලංකාදීප කර්තෘ මණ්ඩලයේ රත්නපාල විතාන, දිවයින කර්තෘ එඩ්මන් රණසිංහ, දිනමිණ කර්තෘ මණ්ඩලයේ බකුල ශ්‍රී සරච්චන්ද්‍ර, බුදුසරණ කර්තෘ ප්‍රේමසිරි අබේසිංහ යන මහත්වරු හා සිළුමිණ,දවස,රිවිරැස පත්‍රවල කර්තෘ මහත්වරු 'ඉසුර' ජ්‍යෙෂ්ඨ උප කර්තෘ මහතා.-

විශෙෂයෙන් මෙම ග්‍රන්ථය ශ්‍රී ලංකා පුරා විද්‍යා සංගමයේ ප්‍රකාශනයක් ලෙස පළ කිරීමට උත්සුකවූද මා නිතර ධෛර්යවත් කළාවූද සංගමයේ ගරු ලේකම් විද්වත් පී.වීරසිංහ මහතාට හා එහිලා අවසරය දුන් සංගමයට මා බෙහෙවින් කෘතඥ විය යුතුය. පොතේ මුද්‍රණය සපරගමු ඉතිහාස පුරා විද්‍යා පර්යේෂණ ආයතනය මගින් කළ අතර පොතේ අයිතිය සම්පූර්ණ කර්තෘ සතුවේ. මෙහි පළවන කරුණු පොතේ නම සඳහන් කරමින් උපුටා දැක්වීමට ඉඩ තිබේ.

මෙම කෘතිය කිරීමෙන් ජනිත ගෞරවයක් වේනොත් එය මා ගුරුදේව අතිගරු නාපාවල සෝරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට හිමිවේ.

අවසාන වශයෙන් පොත ලියන අවස්ථාවේදී සහායවූ කිරිදිගල සේනක නාරංගොඩට; මගේ බොහෝ ශාස්ත්‍රීයලිපි පැහැදිලි අකුරෙන් ලියා දෙනුවා මෙන්ම මෙම ග්‍රන්ථයේ අත්පිට පතද හොඳින් ලියා දුන් මගේ විද්‍යාලයේ හිටපු ශිෂ්‍ය නායිකාවක වූ සුනන්‍දා ද සිල්වාට; කවදත් මගේ කෘති හොඳින් මුද්‍රණය කරදෙන ඇහැලියගොඩ විජයරාජ මුද්‍රණාලයේ කාර්ය මණ්ඩලයට; මගේ ආශිර්වාදය පිරිණැමේ.

එල්ලාවල මේධානන්ද,

ශ්‍රී සුමංගලාරාමය,
නාපාවල - ගැටහැත්ත.
1984. 01. 28



# අප්‍රකට බ්‍රාහ්මී සෙල්ලිපි හා පුරාවස්තු ප්‍රස්තාවනා.

ලංකාවේ පවතින ශිලා ලිපියක අගය කියා නිම කළ නොහැකිය. මෙරට වැසි ජනතාවගේ අතීත සංස්කෘතිය හෙළි කරවීමෙහි මේ ලිපියකින් ලැබෙන ආලෝකය තවත් තැනකින් නොලැබිය හැකිවීම ඊට හේතුවයි ඉතිහාසයට, භාෂාවට හා සමාජයට මෙම ලිපියක අගය තුලාබරට පවතී

වර්තමාන භාෂා පර්යේෂණ කටයුතු මෙරට ඇරඹී ආවේ ඉංග්‍රීසි පාලන කාලයේදීය, වියත් ඉංග්‍රීසි ජාතිකයෝ ආසාවකින් එම කාර්යයෙහි යෙදුණෝය. එයින් ලත් ආභාසයෙන් ජේම්ස් අල්විස් වැනි දේශීය වියත්හු එම පර්යේෂණ කටයුතුවල නිරතවූහ. මේ නිසා 19 වන සියවසේ මුල් භාගයේ සිටම මෙරට ඉතිහාසය, පුරාවිද්‍යාව, ශිලා ලේඛන වැනි ක්ෂේත්‍රයන්හි පර්යේෂණ කටයුතු ඇරඹී වර්ධනය වන්නට පටන් ගැනිණ. ඒ පර්යේෂණ ක්ෂේත්‍රයෙහි සෑහෙන ප්‍රතිඵල අද අප හමුවෙහි පවතී,

ලංකාවේ පුරාවිද්‍යාව හා ඉතිහාසය ගැන මහත් ආසාවකින් කටයුතු කළ එවක විසූ ඉංග්‍රීසි වියතුන් දෙදෙනෙකි, කොඩ්රින්ටන් හා බෙල් මහත්වරු, ඒ මහතුන් ගත් මගෙහි ගමන් කළ සිංහල මහ වියතා සෙනරත් පරණවිතානය. පැරණි ලේඛන සම්බන්ධයෙන් එතුමන් කළසේවය අනුපමව පවතී, එතුමා කළ විවිධ පොත්පත් රැස අතර, ලංකා ශිලා ලේඛන සංග්‍රහයෙහි පවතින ලිපි ගණයත්, සිගිරි ගී ප්‍රකාශනයත් උත්තරීතරව පවතී.

ලංකාවේ සෑම බිම් අහලකම ඓතිහාසික අගයක් පවතී. අවුරුදු දහස් ගණනක සිට වැඩී ආ එය ලාංකිකයා සතු පරම දායාදයයි. එය මතුකරවනා තරමට ලංකාවේ අගයත් වැඩිවේ. එම කාර්යය ඒ ඒ ක්ෂේත්‍රයන්හි ආසාව ශක්තිය හා දැනුම ඇති වියතුන් විසින්මකළ යුත්තකි.

දැන් මෙරට විවිධ ක්ෂේත්‍රයන්හි වැජඹෙන වියතුන් රැසක් ඇතත්, ශිලා ලිපි අංශයෙහි කැපී පෙනෙන වියතුන්ගේ ගණන අතලොස්සක්වත් නැති තරම්ය. මීට හේතුව එම විෂයෙහි රුචිය දක්වන පිරිස් අඩු කමයි. ඕනෑම වැඩක් කවරකුට හෝ කළ හැක්කේ ඒ ගැන තමන් තුළ පවතින රුචියත්, ශක්තියත් දැනුමත් උඩයි. මෙම සියවසේ මේ රටේ පුරාවිද්‍යාඥයන් කීප දෙනෙකු ඇතිවී සිටියත් මහාචාර්ය සෙනරත් පරණවිතාන අභිභවා යෑමට අනිත් කෙනෙකුට බැරිවූයේ එතුමන් තුළ පැවති එම ගුණ සම්භාරය තව කෙනෙකු තුළ නොපැවති නිසයි. කරන කියන කොයි කටයුත්තකදී වුවත් බලපාන්නේ යථෝක්ත ගුණ සම්භාරය මැයි.

මේ බව මට හොඳින් පැහැදිලිව ආ තැනකි. ගරු එල්ලාවල මේධානන්ද හිමියන් කලක සිට නොකඩවා කරගෙන එන ශිලා ලිපි පර්යේෂණය. මේ හිමියන් විසින් මෙම විෂය ක්‍ෂේත්‍රයෙහි මෙතෙක් කරගෙන ගොස් ඇති කටයුතු සම්භාරය කවර කෙනෙකු තුළ වුවද ප්‍රසාදජනක වූ හැඟීමක් දනවයි.

මේධානන්ද හිමියන් විසින් පසුගිය අවුරුදු කිහිපය තුළ සපරගමු පළාතේ ඓතිහාසික වටිනාකමක් ඇති ස්ථානයන්හි මෙතෙක් පළවී නැති ශිලා ලිපි ගණනාවක් කුඩා පොතක් හැටියට, ඒ ලේඛනයන්හි ඡායාරූප සහිතව පළකරන ලදී. මෙහි අගය දුටු මම, මේ ලිපි එක්රැස්කර පොතක් හැටියට පළකරවීමේ ප්‍රයෝජනය මතක්කර සිටියෙමි. එහි ප්‍රතිඵලයක් නිසා හෝ මේ පොත පළකර තිබීම මගේ අප්‍රමාණ සන්තෝෂයට කාරණයකි.

අප රටේ, පුරා ලේඛන සම්බන්ධයෙන්, ඒ ඒ අවස්ථාවන්හි රජය මගින් පළකරවන ලද අගනා ශාස්ත්‍රීය කෘතියකි; ලංකා ශිලාලිපි සංග්‍රහය මෙතෙක් ඒ මගින් පළවී ආ ලේඛන ගණයට වඩා ලිපි සංඛ්‍යාවක් තවමත් ප්‍රකාශයට පත්ව නැත. මේ ලිපි ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධයෙන් ගරු එල්ලාවල මේධානන්ද හිමියන් විසින් අවුරුදු ගණනාවක් තුළ බලන්ගොඩ ප්‍රදේශයේ කරගෙන ආ සෙවීම්, සපරගමුවේ සිට නැගෙනහිර ප්‍රදේශ කරා මෙහෙයවා ඇත. එහිදී ඒ හිමියන්ට අසුවූ මෙතෙක් එළි නොවූ ශිලාලිපි 136ක් පළකළ කෘතියකි. මෙම "අප්‍රකට බ්‍රාහ්මී සෙල්ලිපි හා පුරාවස්තු" සංග්‍රහය. මේ ලිපි ගොන්න අනුරාධපුර මුල් කාලයට අයත්ය. ඒවායේ අර්ථ කථනය හා ඓතිහාසික පසුබිම දක්වමින් මේ කෘතිය සකස් වී තිබේ. මෙය විධිමත් ලෙස පළක්රවීම සඳහා මේධානන්ද හිමියන් ගෙන ඇති ආයාසය, මෙම අධ්‍යාපන ක්‍ෂේත්‍රයෙහි මේ කාලයේ සවත් වියතකු විසින් නොගෙන ඇති තරමට උදරව ඇති බව නොමසුරුව කිව යුතුය.

ස්ථාන 35 කට ආසන්න තැන්වලින් සොයාගත් මේ ලිපි සිංහල භාෂාවෙහි මුල් යුගයේ තොරතුරු පරීක්‍ෂණයෙහිලා අතිශයින් ප්‍රයෝජනවත් වේ.

1927 සිංහල මහා ශබ්දකෝෂකරණය කළ ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මැතිතුමා සිංහල භාෂාව පිළිබඳ ලියූ අගනා ශාස්ත්‍රීය ලිපියක් සිංහල ශබ්දකෝෂයේ මුල් කලාපයෙහි පවතී. එතුමාගේ එම පර්යේෂණ අනුව, මේධානන්ද හිමියන් සොයා පළ කළ මේ ලිපි ගණය සිංහල ප්‍රාකෘත යුගයට ඇතුළත්වේ. එහි විශේෂ ලක්‍ෂණය භාෂාව ස්වරත්ව පැවතීමයි. වැකිවල ව්‍යංජන හා මහා ප්‍රාණාක්‍ෂර විරලවීම එහි ස්වභාවයයි. මේ සඳහා නිදසුන් කොට ගතහැකි ලිපි කිහිපයකට වඩා ලංකා ශිලා ලේඛණ සංග්‍රහයෙහි

නොමැත. ඒ අඩුව පිරිමැසීමේ ලා මෙම කෘතියෙන් ලැබෙන රැකුල විද්වතුන් අගය කරනු ඇත. මේ ලිපිවල ඡායාරූප සටහනුත් ඒ අයුරින්ම මෙහි ඇතුළත් කිරීමට මෙධානන්ද හිමියන්ට අවසථාවක් ලැබී නැත. තනි පුද්ගලයකුට එය කිරීමෙහිලා පැවති බාධක ඊට හේතුවූවාට සැක නැත මෙවැනි පයෙඨෂණ කටයුතු සඳහා රජයේ ආධාරවල අවශ්‍යතාම මෙබඳු තැන්වලදී ඉහලින්ම පෙනී යයි.

ලංකා ශිලා ලිපි ක්‍ෂෙත්‍රයෙහි මෙම සෙවීම මේ අයුරින්ම කරගෙන යෑමට මෙධානන්‍ද හිමියන්ට කාගේත් සහාය ලැබිය යුතුව ඇත. මෙම විෂය සම්බන්ධයෙන් සෑහෙන සේවයක් කිරීමට, මෙධානන්‍ද හිමියන් තුළ රුචිය, ශක්තිය හා දැනුම පවතී. ලංකා ශිලා ලේඛන ක්‍ෂෙත්‍රයට මෙවැනි වියතුන්ගේ සේවය අද අත්‍යවශ්‍යව පවතී, අවශ්‍ය පහසුකම් සහිත සුදුසු පරිසරයක් මේ හිමියන්ට උදකර දිය හැකි නම්, ලංකා ශිලා ලේඛන ක්‍ෂෙත්‍රයෙහි අමරණීය සේවයක් මෙධානන්‍ද හිමියන්ට කළ හැකි බව මට පෙනේ. එවැනි අවසථාවක් ලැබීමේ භාග්‍යය නුදුරු කාලයේදී උන්වහන්සේට උදාවේවායි මම ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

පුඤ්චිබණ්ඩාර සන්නස්ගල,
සිංහල ශබ්දකෝෂයේ
(ප්‍රධාන කර්තෘ පදවියේ කටයුතු ආවරණයකරන)
නියෝජ්‍ය කර්තෘ
සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සිංහල ශබ්දකෝෂ කාර්යාලය,
46, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 7.

1983 දෙසැම්බර් මස 27 අඟහරුවාද

— පටුන —


| | | | |
|---|---|---|---|
| 1. | විමසීන | පිට | 1 - 9 |
| 2. | අප්‍රකට බ්‍රාහ්මී සෙල්ලිපි | ... | 9 - 37 |
| 3. | හබුතගල විහාරය | ... | 37 - 52 |
| 4. | පුළුකුණාව | .. | 52 - 61 |
| 5. | පිටපත් නොකළ අභිලේඛන ඇති ස්ථාන | ... | 62 - 65 |
| 6. | අංකිත ස්ථාන (විමසීන) | ... | 65 - 67 |
| 7. | ලේඛක හිමියන් පළකර ඇති විවිධ -පුරාවස්තු පිළිබඳ වාර්තා | ... | 67 - 71 |
| 8. | අංකිත ස්ථාන (හබුතගල විහාරය) | ... | 71 |
| 9. | අංකිත ස්ථාන (පුළුකුණාව විහාරය) | ... | 71 - 72 |

# කර්තෘගේ වෙනත් ග්‍රන්ථ,

1 මාගම රාජධානිය.
2 ගිරිනුවර රාජධානිය හඳගිරියද,
3 සුවර්ණමයූර සංදේශය.
4 සෝකයේ ගීතය.
5 පියංගල වන සෙනසුන.
6 සම්බුද්ධ වන්දනාව.
7 මෛත්‍රී භාවනාව,
8 අතවැසි අස්න.
9 සමන්ගල මහ අරණ.
10 බුද්ධංගල තපෝවනය,
11 හඳගිරිය හෙවත් සඳගනානුවර.
12 බුදුගල්ලෙණ තපෝවනය.
13 කුඩුම්බිගල තපෝවනය.
14 රිටිගල ආඩියාකන්ද තපෝවනය.
15 මණිනාග පබ්බත බෝධිගිරි විහාරය.
16 පර්යේෂණ ලිපි අංක 12 ළඟදී නිකුත්වේ.

# විමර්ශන.

ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් හා වෙනත් විවිධ ගවේෂකයන් විසින් මෙතෙක් පිටපත්කර ඇති සෙල්ලිපි වලට අමතරව තවත් විශාල සංඛ්‍යාවක් ගවේෂණයන්ට හසු නොවී ඇත. ඓතිහාසික අංශයෙන් බොහෝ සෙයින් වැදගත් විය හැකි මෙම ලිපි පිටපත්කර ගැනීමට අදල අංශ වලින් මෙතාක් උනන්දුවක් දක්වා ඇති බවක් නොපෙනේ. මවිසින් පිටපත්කර ඇති එබඳු ලෙන් ලිපි 135 ක් මෙහි අන්තර්ගත කර ඇත. මෙම ලිපි අතුරින් සමහර ලිපි රෝහණ ඉතිහාසය හදරන්නන්ට ඉතා වැදගත්වනු නොඅනුමානය. මෙම ලිපි වලින් සමහරක මහානාග යුවරජුගේ සිට සද්ධාතිස්ස රජු දක්වා රජවරුන් පිළිබඳ ඇතැම් තොරතුරු අනාවරණය කරනු පෙනේ.

මහානාග යුවරජු රෝහණයට පලා අවුත් මාගම අගනුවර කර ගත් අයුරු වංශ කථාවල[2] විස්තර කර ඇත. එද රෝහණය යනුවෙන් අදහස් කර ඇත්තේ අද එනමින් සැලකෙන මුළු ප්‍රදේශයම නොවේ. සීමිත බිම් තීරුවකි. එය කුඹුක්කන්ඔය - ගල්ඔය අතර කොටසේ පිහිටා තිබූ බව පෙනේ. ලාහුගල මගුල් මහා විහාරයෙන් ලැබුණු ලිපියක[3] එය "රුණු මහා විහාරය" ලෙසට නම් ලබා ඇති බව සටහන් කර තිබේ. තෙල විහාරය මුලින්ම කරවන ලද්දේ ධාතුසේන[4] රජු විසිනි. රුහුණට අයත් ප්‍රදේශයේ කොතෙකුත් වැදගත් පූජනීය ස්ථාන තිබියදී මේ කොටසේ පිහිටි මගුල් මහා විහාරය රුණු මහා විහාරයයි නම් ලබා ඇත්තේ පැරණි රුහුණු දනවිය මේ කොටසේ පිහිටා තිබු නිසා විය යුතුය. මහානාග මුළු මහත් රෝහණයේම පාලකයා වී යැයි වංශකථාවල[5] කියැවෙනුයේ මේ කොටසේ ඔහු බලය පිහිටුවා ගත් නිසා විය යුතුය. එසේ නොවන්නේ නම් සමකාලීන ප්‍රාදේශීය පාලකයන් වූ කතරගම ක්ෂත්‍රියයන් හා චන්දනගාම[6] ක්ෂත්‍රියයන් පිළිබඳ අර්ථ විවරණයක් කිරීම අපහසු වනු ඇත. අද සීමාකොට සැලකෙන මුළු ප්‍රදේශය රොහණයට අයත්ව ගියේ මීට ටික කලකට පසුව බව සැලකීමට පුලුවන. මේ නිසා මහානාග බලය පිහිටුවාගත් ප්‍රදෙශය අද අම්පාර - මොණරාගල දිසා වලින් කොටසකට අයත් වන බව පෙනේ. මෙතාක් හමුවී ඇති සෙල්ලිපි වලින් මේ අදහස බොහෝ දුරට තහවුරුවන බව කිව යුතුව ඇත.

විමර්ශන අංශය

මෙහි මලයඩිකන්ද ලිපි අතුරින් එකක සඳහන් වන රජ පරපුර සැලකිල්ලට ලක් කරනු වටනේය. "ගමිණී නග" ඔහුගේ පුතා "අය අබය" ඔහුගේද පුතා "අයතිස" . නිසැක ලෙස පිළිවෙලින් මහානාග ගොඨාභය හා කාවන්තිස්ස යන අය ලෙස හඳුනාගත හැකිය. මහාචාර්ය පරණවිතාන කියවා ඇති කුසලාන්කන්ද හා කඩුළුපොතානමලේ[7] බ්‍රාහ්මී ලිපි අනුව ගොඨාභය මහානාග ගේම පුතකු බවට කරුණු ඉදිරිපත් කර තිබේ. එම අදහස මෙම ලිපියෙන් වඩාත් තහවුරු වනු ඇත. මෙහිදී ඉතා වැදගත්වනුයේ නගරජු "ගමිණී" පදයෙන් හඳුන්වා තිබීමයි. වංශකථා අනුව රජවරුන් කීපදෙනකුට පමණක් සීමාකර තිබූ "ගමිණී" ව්‍යවහාරය සෙල්ලිපි අනුව සැහෙන රජුන් සංඛ්‍යාවකට යෙදූ බව පැහැදිලි කරයි. මුටසීව රජුගේ පුතන් අතුරින් දෙවානම්පියතිස්ස හා උත්තිය යන දෙදෙන සඳහන්වන බ්‍රාහ්මී ලිපිවල ඔවුන් "ගමිණී" පදයෙන්ද සම්භාවනාකර තිබේ.[8] එහෙත් මහානාග යුවරජුට එවන් ව්‍යවහාරයක් තිබූ බවට දැනට හමුවී ඇති එකම සාධකය මලයඩිකන්ද ලෙන් ලිපියවීම ඉතා වැදගත් කොට සැලකිය යුත කරුණකි. සමන්ගල ලිපියේ ඔහු සඳහන්කර ඇත්තේ "උපරජ" වචනයෙන් පමණි. පලවී ඇති කුසලාන් කන්ද. මොට්ටයාකල්ලු[9] හා කිරිවැල්ගොඩ[10] බ්‍රාහ්මී ලිපිවල 'උපරජනග' "නග අය" (නගයහ රජයශි) වශයෙන් සඳහන් වී තිබේ.

මොට්ටයාකල්ලු ලිපියේ මහානාගරජුට විශෙෂ අභිධානයක් දී ඇත. "දශබතික රන ජවකනය" යනුවෙන් එය සඳහන්වේ. මේ අනුව මහානාග කතරගම දශබෑරජුන්ගේ නාවික හමුදාවක නායක තනතුරක් දරන්නට ඇත යන අදහස මහාචාර්ය පරණවිතාන පළකර ඇත. මහානාගරජු මෙබඳු මට්ටමකට පත්වූහයි සිතියහැකි නොවේ. එබන්දකට තුඩුදෙන කිසිදු සහවනක් මූලාශ්‍රවල දක්නට නොලැබේ මේ ලිපිය පිහිටුවා ඇත්තේ කාවන්තිස්ස රජු විසිනි. දශබෑරජුන් මරාදමු ඔවුන් සමග වෛරයෙන් සිටි ගොඨාභය රජුගේ පුතයා තමාගේ සීයා ගැන කරන සඳහනක ඔහු දශබෑයන් යටතේ සිටියෙකැයි ගෞරවයෙන් සඳහන් කිරීම නොවිය හැක්කකි. අනෙක් අතට මුටසීව රජුටද පුත්‍රයෝ දශදෙනෙක්වූහ. "දශබතික" යන්න ඔවුනටද යෙදීම අපහසු නැත. (ඇත්ත වශයෙන් බෝවත්තේගල ලිපිවල එන "ගමිණී" මුටසීව රජුද? දශබතිකයන් ඔහුගේ පුත්‍රයින් දශදෙනාද? පණ්ඩුකාභය අනුරපුර රජකරද්දී මුටසීව කතරගම සිට රුහුණු පාලනය කළේද" පියා මළ පසු මුටසීව අනුරාධපුරයට පැමිණියෙන් "ශවජෙට" එනම් මුටසීවගේ වැඩිමහලු පුත්‍රයා රුහුණේ පාලකයාවී ද? මුටසීවගෙන් පසු දෙවන පුත්‍රයා වූ තිස්ස අනුරාධපුරයේ රජවූයේ (අදසමනිසා යැයි වංශකථා කියතත්) ඔහු රුහුණේ සිටි නිසාද? ආදී ප්‍රශ්න නිරාකරණය කරගත හැකිනම් ඉතිහාසය අළුතින් ලියවීමට සිදුවනු ඇත. පණ්ඩුකාභය රජු පිළිබඳ ගෞරවයෙන් කරන සිහිකිරීම් පසු යුගයේ පවා කතරගම් පෙදෙසේ තිබුණු බව පැවසෙන සෙල් ලිපි සාධක වුවද නැත්තේ නොවේ.) අනෙක් අතට කොල්ලාදෙනිය වැනි ලිපි

පිහිටුවීමේදී උපරජුගේ රාජ්‍ය කාලයක් දක්වීමද විමතියට හේතුවෙයි. එහි "නගයහ රජයහි" යන යෙදුම යටතේ "උපරාජ" කථාව ප්‍රතික්ෂේප කරයි. "උපරජනග" රෝහණයේ කොටසක ස්වාධීනව පාලනය කළ බවට නොයෙක් සාධක ඇති හෙයින්ද මහාචාර්ය පරනවිතානගේ අදහස සැක කිරීමට තුඩුදෙයි. ඇත්ත වශයෙන් දශබතිකරන+ජවක+නය යන වචන තුන වෙන් කරන විධියද සැකයට හේතුවේ, "දශබතිකන" වියයුතු වචනය "දශබතිකරන" වූයේ සංස්කෘත තද්භවයක් ලෙසට නම් මෙතෙක් ලිපිවල සඳහන්ව ඇති තත්කාලීන භාෂා ලක්ෂණ වලට එය අමුත්තකි.

මහානාග රෝහණයට පලා ආවේ වලස්වැව කරවමින් සිටි අවධියේදී බව වංශකථා[11] පකාශ කරයි. මහා වංශය මේ සඳහා යොදන වචනය "තරච්ඡ" යන්නයි. ථූපවංසකරු හා සද්ධර්මාලංකාරකරු එය "තරස්නා[12] විසින් හෙළ බසට නගති. "අච්ඡ" "තරච්ඡ" යන වචන වලස් විශෙෂයන් සඳහා පාලිපොත්වල යෙදී තිබේ. පුත්තලම් දිසාවේ පරමාකන්ද විහාරයට ආසන්න තෝනිගල ලිපිවල අච්ඡගිරි තිස්ස පබ්බත විහාරයක් ගැනත්[13] එයට පිදූ වැවක් ගැනත්, අච්ඡ නගරයක් ගැනත් සඳහන්වේ. වැවේ නම සඳහන් නොවින නමුත් "ඉමවපි" (මේ වැව) යන වචනය සඳහන් වේ. වැවේ නම "වලස්වැව" විය යුතුය. තෙල ස්ථානයට තරමක් දුරින් පිහිටි පිච්චින්දියාව ලිපියක[14] උපරජකුගේ මහා සෙන නම් අමාත්‍යයකු ගැන සඳහන් වී තිබේ. ලිපියේ අක්ෂර අනුව සමකාලයට අයත්වන "උපරජ" මහානාග යුවරජ බව පෙනේ. මේ සටහන් අනුව පෙනියන්නේ මහානාග රෝහණයට පලා ඒමට ප්‍රථම අනුරාධපුරයට නිරිත දිගින් පිහිටි ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතුවල නිරතව සිටි බවකි. ඔහු රොහණයට එද්දී අතරමග ඔහුගේ බිසවට යටාලතිස්ස පුත්‍රයා ලැබුනේය. වංශකථාවල හා පශ්චාත් කාලීන සෙල්ලිපි වල[15] යටාලතිස්ස ගැන සඳහන් වෙතත් සමකාලීන සෙල්ලිපිවල ඔහු ගැන කිසිම සටහනක් දක්නට නොලැබේ. මෙයට හේතුව සමහරවිට ඔහුගේ පරම්පරාවක් නොවූ නිසා වන්නට ඇත.

හැම විටකම සෙල්ලිපිවල දක්වෙන්නේ උපරජ නගගේ පුතා "අය අබය" බවයි. මලයඩිකන්ද සමන්ගල ලිපිවල "අය අබය", ලෙසට සඳහන්වන අතර කඩුළුපොතානමලය ලිපියේ "අයබය" (සන්ධි වී) ලෙසද කුසලාන්කන්ද ලිපියේ "රජ අබය" ලෙසද සඳහන්වේ. මොට්ටයාකල්ලු ලිපියක "මහ පසදික අබයරජ" විසින් සඳහන්වේ. වංශකථාවල ඔහු දක්වා ඇත්තේ ගොඨාභය වශයෙනි. මිටිවීම නිසා "ගොඨ"වී යයි එහි අර්ථකථනයද දක්වේ. "ගොඨ" වචනය බ්‍රාහ්මී ලිපිවල වෙනත් නම් සමග යෙදී තිබේ. මලයඩිකන්ද ලිපියකම "ගොටක සුමන" යනුවෙන් දක්වේ. මෙහි අර්ථය "මිටි" යන්න නොවිය හැකිය . එය "ගොෂ්ටි" සදින් භින්නවූවකි. පර්ෂදයක්, ගොෂ්ටියක් යන අර්ථයක් එහි විය යුතුය.

මහාචාර්ය පරණවිතානද මේ අදහස දරයි. මොට්ටයාකල්ලු ලිපියේ "මහපසදික" යන්න මේ අදහස වඩාත් තහවුරු කරන බව පෙනේ. එහෙත් "ගොට" වචනය අභය රජුට යෙදූ සෙල්ලිපියක් මේතාක් හමුවී නැත.

කාවන්තිස්ස රජු ගැන මලයඩිකන්ද හා සමන්ගල ලිපිවල "තිශ අය" වශයෙන් සඳහන් වී ඇත. කඩුළුපොතාමලය ලිපියේ නම නොදක්වෙන අතර කුසලාන් කන්ද හා මොට්ටයාකල්ලු ලිපිවල "ගමිණිතිශ" වශයෙන් සඳහන් වෙයි. පශ්චාත්කාලයට අයත් ලිපියක[16] ඔහුගේ නම "කකවණතිස" වශයෙන් දක්වෙයි. මුලින් සඳහන් කරනලද ලිපි වල මේ රජවරු "අය" වශයෙන් සඳහන් වුවද ඔවුන්ගේ රාජ්‍යකාලයන් ගැන එම ලිපිවලම සඳහන්වන බැවින් පාලකයන්වූ බවට සැක නැත. මලයඩිකන්දේ ලිපිය පිහිටුවන ලද්දේ කාවන්තිස්ස රජු විසිනි. එමනිසා පරපුර විස්තරය ඔහු දක්වා පමණක් දක්වෙයි. සමන්ගල ලිපියේ දයකයා සඩාතිස්ස රජුය. මොට්ටයාකල්ලු හා කුසලාන්කන්ද ලිපිවල දයකයාද කාවන්තිස්ස රජුම වෙයි. සඩාතිස්ස රජු තෙල ලිපිවල "තිශඅය" ලෙය දක්වෙන අතර ප්‍රකාශයට පත්කර ඇති රාස්සහෙල ලිපිවල "දෙවනපිය මහරජ ගමිණිතිශ" වශයෙන් සඳහන්වේ. ඒ ඔහු අනුරාධපුරයේ රජවූපසු ව්‍යවහාර කළ අයුරුය. මාගම පාලකයන් කිසිවකු මාගම පාලනයේ සිටිතාක් "දෙවනපිය" උපාධිය ව්‍යවහාරකර නැත. "මහරජ" යන්නද සමකාලීන ලිපිවල යොද නැති නමුත් පශ්චාත් කාලීන ලිපිවල සටහන්කර තිබේ[17]. රෝහණයේ සිටි ප්‍රබල රජපෙළපතක් වූ කතරගම ක්ෂත්‍රිය වරුන්වද කිසිවිටක "මහරජ" හෝ "දෙවනපිය" යන ව්‍යවහාර ලැබීනැත.

පියන්ගලින් ලැබී ඇති ලිපි ඉතා වැදගත් වන්නේ දුටුගැමුණු රජු පිළිබඳ අලුත් තොරතුරු රැසක් ඒවායේ සඳහන්වන හෙයිනි. දුටුගැමුණු රජු වංශකථාවල[18] සඳහන් වන්නේ "දුට්ඨගාමණී" වචනයෙනි. එහෙත් ඔහුට තබනලද නාමය "ගාමිණී අභය" යන්නවේ. ප්‍රකාශයට පත්වී ඇති සීලවකන්ද, කොරවග්ගල, කොස්සගම කන්ද වැනි ලිපිවල[19] "ගාමිණී අබය රජ" "දෙවනපියරජ අබය" මහ රජහ ගමිණි අබයහදෙවනපියශ (දෙවනපිය මහරජගමිණි අබය) වශයෙන් දක්වේ. පියන්ගල සටහන් වී ඇති ලිපි දෙකක "දෙවනපියමහරඩහ ගමිණි අබහ" යනුවෙන් සඳහන් වී තිබේ. සෙල්ලිපි ලියවෙන්නට පටන්ගත් මහින්දගමනයෙන් පසු ක්‍රි: පූ: යුගයට වැටෙන අභය රජවරු තිදෙනෙක් වෙති. එනම් දුටුගැමුණු වළගම්බා, භාතිකාභය යන තිදෙනායි. මෙ අය ගැන සෙල්ලිපිවල සඳහන් වේ. පියන්ගල ලිපිවල අක්ෂර කලාව අයත්වන්නේ වඩාම ගැමුණු යුගයට බරවය. වළගම්බා රජු රෝහණයට සම්බන්ධයක් තිබුනද ඔහු ගැන සඳහන්වන ලිපිවල අක්ෂර හා ආකෘතිය මීට සුළු හෝ වෙනසක් දක්වයි. භාතිකාභය රජුගේ යුගයට එනවිට අක්ෂර තරමක නව්‍ය

මුහුණුවරක් ගනී. එපමණක් නොව ඔහු සෙල්ලිපිවල සඳහන් වන්නේ "ඛතියමහරජ" හා තිසරජ, ලෙසිනි. දීගාමඩුලු කොටසේ මෙතෙක් හමුවූ සෙල්ලිපි වලින් දුටුගැමුණු රජු ගැන සටහන් ලැබී නැත. එය පුදුමයට කරුණකි. මහානාග යුවරජුගේ සිට සඩාතිස්ය රජු දක්වා අනෙක් සියලු පාලකයන් ගැන සඳහන් වන්නේ නම් දුටුගැමුණු රජු ගැන සඳහන් නොවීමට හේතු නැත්තේය. එම අඩුව පියන්ගල ලිපිවලින් සම්පූර්ණවෙයි. මේ අනුව මෙහි සඳහන් වන "දෙව නපියමහරඣ ගමිණි අබ" දුටුගැමුණුරජු බවට හඳුනා ගැනීමට හැකිවේ.

මේ ලිපිවල දුටුගැමුණු රජුගේ බිසව ගැනත් ඇයගේ මව ගැනත් සඳහන් වන අතරම රජුගේ දියණිය ගැනත්, ඇයගේ සැමියා හා ඔවුන්ගේ පුත්‍රයා ගැනත් සඳහන්වේ. දුටුගැමුණු රජුගේ බිසව රාජිතාය. ඇයගේ මව අබිතිස්සාය. රජුගේ දියණියද අබිතිස්සාය. ඇයගේ සැමියා "ප්‍රමුඛ තානාපති සුමනය." ඔහු ප්‍රමුඛ මිත්‍රගේ පුත්‍රයෙකි. අබිතිස්සා - සුමන දෙදෙනාගේ පුත්‍රයා පරුමක අභය වේ. මේ තොරතුරු අනුව ඉතිහාසයට අලුත් කරුණු රැසක් එක්වෙයි. දුටුගැමුණු රජුගේ බිසව පිළිබඳව විවිධ මත පවතී. ඔහු කොත්මලයට පළාගිය අවධියේ පාවාගත් ගැමිලියක එතුමාගේ භාර්යාව වීයයි බොහෝ දෙනා සලකති. මෙය සැබැවීමට ඉඩ ඇතත් සථිර සාධක නැත. දනට ලැබී ඇති සෙල්ලිපිවල දක්නට ලැබෙන කරුණු අනුව දුටුගැමුණු රජුට බිරියන් කීපදෙනෙකු සිටි බව පෙනේ. මුලින් කී කොස්සගම කන්දේ ලිපියක එක් බිසවකවූ කති (කෘත්තිකා) ගැන සඳහන් වේ.

මිහින්තලයේ අංක 18 හා 29 දරණ ලෙන් ලිපිවල[20] සඳහන් අභය රජු හඳුනාගැනීමට නොහැකි අයකු හැටියට මහාචාර්ය පරණවිතාන දක්වතත් ඒද දුටුගැමුණු රජුසේ සැලකීමට ඒවායේ සටහන් අප පොලඹවන සුලුවෙයි. මිහින්තලයේ ලිපියේ සඳහන්වන "දෙවනපිය මහරජ ගමිණි අබය"ගේ පුත්‍රයාවූ "ලොණපි අයශිව" මුතුගල්ල[21] ලිපියක සඳහන් වන "අයශිව"ම විය යුතුය. මිහින්තලයේ අනෙක් ලිපියේ සඳහන්වන "ගමිණි අබය"ගේ භාර්යාව "අබිකණ" (අභිකෘෂ්ණා) නමින් හැඳින්වේ. මේ ලිපිවල "අබය" දුටුගැමුණු රජුම යයි ගතහොත් ඔහුගේ තවත් බිසවක කෘෂ්ණා නමින් වූ බවත් පුත්‍රයකු සිව නමින්වූ බවත් සැලකීමට හැකිවේ. "කෘෂ්ණා" රජකුමරියක බව "අබි" උප පදයෙන් පෙනේ. "කති"ට එබඳු තත්වයක් තිබූ බව සෙල්ලිපියෙන් අනාවරණය නොවන අතර ඇය හඳුන්වා ඇත්තේ (රමනී) බරිය (භාර්යා) වශයෙනි. පියංගල ලිපියේ දක්වෙන රජිතා (රාජිතා) ඔහුගේ අභිෂේක බිසව වියයුතුවේ. ඇයද රාජකුමාරිකාවකි. මේ දෙදෙනාට ලැබුණු දියණිය 'අබිතිශ' (අබිතිස්සා) නමි. ඇය පාවාගෙන සිටි "සුමන" "දූත" තනතුරින් වෙසෙසා ඇත. මින් සැලකෙන්නේ තානාපති ධූරයට සමාන වැදගත් තනතුරකි. තානාපති කාර්යය පුරාතනයේ සිටම තිබූ බවට සාධක ඇති අතර එහි රජපවුලට ළඟම සම්බන්ධකම් ඇති අයම යෙදවූ බවද පැහැදිලිවේ.

"දුත ගුමන" "පරුමක මිත"ගේ පුත්‍රයෙකි. "පරුමක මිත" මේ ලිපියේ එන කරුණු අනුව පැහැදිලි නැත. ප්‍රකාශයට පත්කර ඇති ලිපි කීපයක[22] "ශෙනපති පරුමක මිත" කෙනෙකු ගැන සඳහන්වේ. කුඩුම්බිගල හා ඒරුපොතාන් යන ස්ථාන දෙකේ ලිපිදෙකක "පරුමකමිත" කෙනෙකු ගැන සඳහන් වෙයි. මොහු "පරුමක නදික"ගේ පුත්‍රයකු හැටියට ඒවායින් කියවේ. මේ නම් දුටුගැමුණු රජුගේ අග්‍රසේනාපති නන්දිමිත්‍ර බවට හඳුනාගෙන ඇත. මවිසින් පිටපත්කර මෙහි දක්වා ඇති ඔමුණුගල 1 වන ලිපියේ ඔහු "නදිකමිත" ලෙසට සටහන්ව තිබේ මෙලෙස දැක්වෙන කිසිදු ලිපියක් මේ තාක් සොයාගත නැත. එහිම සඳහන්වන අන්දමට ඔහුගේ දියණිය "ගුත්තා" නම්. ඇයගේ සැමියා "පරුමක තිලකනය." (තිලකන + අය) නම්, පරුමක අභිධානධාරීන් රාජ වංශයට සම්බන්ධ අය බව පෙනේ. එබඳු අය රාජකුමරියන් පාවාගෙන සිටි බවට සාධක තිබේ. සැස්සේරුව ලිපියකින්[23] පෙනෙන පරිදි "දෙවනපියමහරජ ගමණි අබය" (වළගම්බා රජු) ගේ දියණියක පාවාගෙන ඇත්තේ "පරුමකරති" නමැත්තෙකි. "පරුමක පුශදෙව"ගේ දියණියවූ "අබි අනුරදි" පාවා ගෙන සිටියේ "අය පුශදෙව" නමැති කුමාරයෙකි.

ඇරත් නන්දිමිත්‍ර සෙනෙවියා මාගම් රජ පවුලේ ළඟම විශ්වාසවන්තයකු ලෙසට ක්‍රියාකර ඇත. මේ අනුව සලකන කළ පියංගල ලිපියේ සඳහන් "මිත්‍ර" නන්දිමිත්‍ර සෙනෙවියා හැටියට හඳුනාගැනීම සාවද්‍ය නොවේ. එය එසේම වී නම් දුටුගැමුණු රජුගේ දියණිය පාවාගෙන සිටියේ නන්දිමිත්‍රගේ පුත්‍රයකු බව නිගමනය කළ හැකිය. "දුන ගුමන"ගේ පුත්‍රයකු හැටියට සඳහන්වන "පරුමක අබය" පරමාකන්ද හා තෝනිගල ලිපිවල දුටුගැමුණු රජු සමග සඳහන්වන "පරුමක අබය" බවත් ඔහුගේ පුත්‍රයා "පරුමකතිශ" බවත් පැහැදිලි කරගත හැකිය. මහානාග යුවරජුට තෙල පෙදෙසේ පැවති අයිතිය කලක් යන තුරුම ඔහුගේ පරපුරට අයත් උදවියගේ ප්‍රයෝජනය පිණිස යෙදී තිබුණු ආකාරයද එයින් පැහැදිලි වෙයි.

කුඩා වුවත් බුදුපැටුන් කන්දෙන් සොයාගත් ලිපිය අලුත් තොරතුරු සොයා යාමට අනුබල දෙයි. තෙල ලිපියේ "රජඋති" ඔහුගේ පුත්‍රයා වූ "අය අබය" ඔහුගේ දියණිය "දෙවිතිශය" ගැන සඳහන්වනු පෙනේ. මේ ලිපියේ එන "රජඋති" හැරෙන විට රොහණ දෙශයට අයත් කොටසින් ලැබෙන තවත් එක ලිපියක රජඋති කෙනෙකු ගැන සඳහන්වේ. ගමිණිගේ පුත්‍රයින් දශදෙනාගෙන් කෙනෙකු වූ ඔහු බෝවත්තේගල ලිපියක[24] සඳහන්කර ඇත්තේ මෙසේය.

**ගමිණි පුතෙ රජ උති රජ උති පුතෙ අය අබයශ**
**ඣිත අබි අනුරදිය.**

තෙල ලිපියේ එන තොරතුරු පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ ලිපි දෙක්හිම සඳහන් ''රජ උති'' එක් අයකු බවයි. බෝවත්තේගල හා කොට්ටදාමුහෙල ලෙන් ලිපිවල සඳහන්වන රජපරපුර මහාවංශයේ දැක්වෙන කතරගම ක්ෂත්‍රිය වරුන් හැටියට හඳුනා ගෙන ඇත. ධාතු වංශයේ ''කතරගම දසබෑරජවරුන්'' ලෙස හැඳින්වෙන්නේද මේ අයමය.[25] කතරගම ක්ෂත්‍රිය වරුන්ගේ ප්‍රභවය අප්‍රකටවූවත් ඔවුන්ගේ මූලිකයා (පියා) ''ගමිණී'' නමින් හැඳින්වෙයි. මෙම රජපරපුර සහ මාගම රජපරපුර අතර වැඩුනු භෙදය ගැන කිසිත් තොරතුරක් මූලිකව දක්නට නැතත් ගොඨාභය අතින් ඔවුන් විනාශවීමෙන් පෙනියන්නේ එබන්දක් තිබුණු බවකි. මේ අය අනුරාධපුර රජ පෙළපතට සම්බන්ධයක් තිබූ බවට කිසිදු සාධකයක් හමුනොවේ. මහාචාර්ය පරණවිතාන; කාවන්තිස් හා විහාරදේවී විවාහය මේ දෙපෙලපතේ සම්බන්ධයක් සේ දක්වා ඇතත්[26] එය ගැන මතභෙද තිබේ. කොට්ටදාමුහෙල ලිපිවල එන ''අබිශවෙර'' විහාර මහා දෙවිය යනු එතුමාගේ අදහස පිළිගැනීමට අපහසුවී තිබේ. මහාචාර්ය සිරිමල් රණවැල්ලද[27] මේ මතය නොපිළිගනී.

එහෙත් රොහණයට ආ අනුරාධපුර රජ පෙළපතේ අය සමග සම්බන්ධකම් පවත්වා ඇත්තේ කැළණි රජපෙළපතේ උදවියයි. කැළණියේ සිටි ''සිව'' රජුගේ බෑණා වූ ''අභය'' කාවන්තිස් රජුගේ සහෝදරිය සමග විවාහ විය.[28] කැළණිතිස් රජුගේ දියණිය සමග කාවන්තිස් රජු විවාහ විය. කැළණි රජ පෙළපතේ ප්‍රභවය ගැනද මතභෙද තිබේ. මහාවංශටීකාව[29] දක්වන හැටියට කැළණිතිස් හා ආයසිඋත්තියගේ පියා මුටසීව රජුගේ පුතුයකවූ උත්තිය රජුගේ පුත්‍රයෙකි. මෙම අදහස දෙන ටීකාපාඨය ඓතිහාසිකයන් විසින් එතරම් සැලකිල්ලට ගෙන නැත. කැගලුදීසාවෙ යටහ ලෙණ හා ලෙණගල ඇති බ්‍රාහ්මී ලෙන් ලිපිවල[30] රජ පරපුරක් ගැන තොරතුරු දැක්වේ. තෙල පරපුරේ ආදීතමයා ''දෙවනපිය''ගේ සොයුරක (බතික) වන ''අයදූහතර''ය. මොහු කවරෙක්දැයි හඳුනා ගැනීමට ආධාරයක් නැතත් ''දෙවන පිය'' නම් දෙවානම්පියතිස්ස රජු බවට සැලකිය හැකිය. ''දූහතර'' නමින් ඔහුගේ සහෝදරයකු සිටිය බවට වංශකථාවල නම් කිසිවක් සඳහන් නොවේ. එය සම්භරවිට ''උත්තිය'' රජුටම තිබූ අපර නාමයක් වීමටද බැරි නැත. ඔහුගේ පුත්‍රයා ''අයශිව'' වන අතර ඔහුගේ පුත්‍රයා ''අයදූහතර'' නම්. ඔහුටද ''ශිව'' නමින් පුතෙක් විය. සෙල්ලිපියේ ඔහු ''ගමිණී'' උප පදයෙන් වෙසෙසා ඇත. ධාතු වංශයේ සඳහන් ''සිව'' මින් එක්කෙනෙකු විය යුතුය.

කෙසේ වෙතත් කැළණි රජ පෙළපත සමග කතරගම රජපෙලපතේ කිසියම් සම්බන්ධයක් තිබූ බවට ඉඟියක්ද මේ ලිපි වලින් ලැබේ. මා දන්නා තරමින් ''කතරගම'' ගැන ප්‍රථම වතාවට සටහනක් එන්නේ යටහලෙණ ලිපියකය. එහි ''කචරගම'' යන්න සඳහන් වී තිබේ.

කතරගම රජපෙලපත කුඹුක්කන්ඔය දක්වා බලය විහිදුවා ගෙන සිටි ජනප්‍රිය පාලක පිරිසකි. බෝවත්තේගල ලිපි වලට අලුත් තොරතුරු එක්කරන බුදුපැටුන්කන්ද ලිපිය අනුව කතරගම ක්‍ෂත්‍රියවරුන්ගේ පැතිරීම හැඩඔයේ උතුරු ඉවුර තෙක් විහිදී බව පෙනේ. තෙල ලිපියේ එන පරිදි රජ උතිගේ පුත්‍ර අය අබයට "දේවීතිස්සා" නමින් තවත් දියණියක සිට ඇත. ඇය "අබි අනුරදි"ගේ සහෝදරියකි.

වැලියායේ ඇති ලිපියක සටහන්වන "අය අබය" හඳුනාගත නොහැකි අයෙකි. ඔහුගේ පියාගේ නම අපැහැදිලිය. ලෙණ කඩා වැටී කටාරමද පසින් වැසී ඇති නිසා ලිපිය පිටපත්කර ගැනීම අතිශය දුෂ්කර වූවකි. ඔහු සමහරවිට මොනරාගල ප්‍රදේශය පාලනය කළ ප්‍රාදේශීය කුමාරයකු හැටියට සැලකිය හැකිය. කිරිමකුල්ගොල්ල ලිපි තවත් රජපරපුරක් ගැන තොරතුරු සටහන් කරයි. මෙහි මහාචාර්‍ය පරණවිතාන කියවා ඇති ලිපියේ "අයකෙර" හා ඔහුගේ පුත්‍ර "අයමහශිව" ගැන සඳහන් කෙරේ. "අයකෙර"; "උපශොණ" වැවේ අයිතිකාරයාවේ. "අයකෙර" මුටසීවරජුගේ පුතෙකු හැටියට දීපවංශයේ දක්වෙන "කීර" වශයෙන් ගතහැකිදැයි එතුමා සලකා ඇතත් මවිසින් සොයාගත් ලිපියේ එන සටහන් අනුව එයට බාධා පැමිණේ. තෙල ලිපිය අනුව "අයකෙර" "අයතිශ්"ගේ පුත්‍රයෙකි. මේ රජපරපුර හඳුනා ගැනීමට ප්‍රබල සාධක නැතත් වලවේ කටුපත් ඔයත් නිම්නයන්හි පැතිර තිබූ චන්දනගාම රාජ්‍යයේ පාලකයින්ගේ තොරතුරු මෙයින් අනාවරණය වෙතැයි සැලකීමට හැකිය යනුමගේ අදහසයි.[31]

මෙම ලිපිවලින් ලැබෙන අනෙක් තොරතුරු අතර අමාත්‍යවරුන් කීපදෙනකු ගැන සඳහන්වී තිබීම මීළඟට සැලකිය යුතුවේ. හිඟුරාන ලිපියේ සඳහන් වන "උතර" මහාමාත්‍යයෙකි. හෙතෙම කුමන රජකුගේ මහ ඇමතිදැයි කීමට සාධක නැතත් ඔහුගේ දියණියවූ "චිත්‍රා" බුද්ධංගල ලිපියේ සඳහන් "චිත්‍රා දේවිය" වීමට හොඳටම ඉඩ තිබේ. කුඩිම්බිගල 3❈ ලිපියේ සඳහන් වන දයකයා වූ "තිශ" ද ඇමතියෙකි. ඔහුද හඳුනා ගැනීමට සාධක නැත. පියංගල ලිපියක "දිග මඣිමබණක" තනතුර දැරූ අයෙකු ගැන සඳහන් වෙයි. මහාචාර්‍ය පරණවිතාන බ්‍රාහ්මී ලිපි අතර දීඝ නිකාය භාණක තනතුරු දැරූවෙකු සටහන්වනු දක නැත. මේ අනුව මෙහි දීඝනිකාය මෙන්ම මජ්ඣිම නිකාය පිළිබඳව භාණක තනතුරු දැරූ අයකු සටහන්ව තිබීම වැදගත් තොරතුරකි.

දිඝවාපිය අසලින් සොයාගත් ලිපි 3 අමුතු වැදගත් කමක් පෙන්නුම් කරයි. එහි ලිපි පිහිටුවා ඇත්තේ දුනුවායෙකි. ඔහු "ගුත" නම්. "තුබ" "විහර" , "ලෙණ" යන වචන තුන එහි සඳහන්කර තිබේ. පැරණි ආරාමික අංග පිළිබඳ කරුණු මේ තුළ ගැජ්ව ඇත.

අනෙකුත් ලිපිවලින් පිළිබිඹු කරන කරුණු සරලය. ලෙන් පිදීම් ගැන සඳහන් කරන මේවායේ විශෙෂ වූ වැදගත් තොරතුරු අඩංගු නොවේ. ප්‍රාකෘත සිංහල භාෂා ලක්‍ෂණ දක්වන අතර සංස්කෘතිය හා රචනා රටාව අතින් මෙතෙක් පළකර ඇති ලිපිවලට වඩා අමුත්තක් නැත.

# අප්‍රකට බ්‍රාහ්මී සෙල් ලිපි.

## පියන්ගල:

පියන්ගල යනු පැරණි ස්ථානයකට මෑතක සිට ව්‍යවහාර කරනු ලබන නමකි. අම්පාර දිසාවේ වැවගම් පත්තුවේ උහන උපදිශාපති කොට්ඨාශයට මෙම ස්ථානය අයත්වේ. මහඔය - අම්පාර ප්‍රසිඩ මාර්‍ගයේ බක්කි ඇල්ලට කි: මී: 2 ක් උතුරින් පිහිටියේය. ප්‍රසිඩ රජගල හෙවත් රාස්සහෙල කඳුවැටියටම සම්බන්ධ පියන්ගල කන්ද එහිම නැගෙනහිරි කොටස හැටියට සැලකිය හැකිය. මහ වනයෙන් වැසුණු වල්සතුන් බහුල ගල්තලා සහිත ජලසම්පත් දුලබ කන්දකි. එක එක තරාතිරමෙ ගිරි ලෙන් රැසක් මෙහි වෙයි. පර්වත කීපයක් මත පැරණි ගඩොළු ගොඩවල් කීපයක් දක්නට ලැබේ. මේවා ස්තූප හෝ සොහොන්කොත් හෝ විය හැකිය. කන්දේ තැන තැනද ගඩොළු මෙන්ම පැරණි උළු කැබලිද, ගල් බැම්ම වල ශෙෂ ද බෙහෙවින් දක්නට ලැබේ. ඇතැම් විට ඒවා ලෙන් කර්මාන්ත වලට අයත් ඒවා ලෙස සැලකීමට පුළුවන. පැරණි සඳකඩ පහණක්ද මෙහි ඇත. ගොඩනැගිල්ලක් තැනීමට බිම ගෙපල කැපීමේදී හමුවී ඇති පැරණි ආයුධ කැබලි හා ඇණ වර්‍ග කීපයක්ද මවිසින් මෑතදි පරීක්‍ෂා කරන ලදී.

වර්තමානයේ (1963 සිට) අරණ්‍යසේනාසනයක් හැටියට පවත්වා ගෙන එනු ලබන මෙහි පැරණි ලෙන් ගණනාවක්ම කුටි හැටියට සකස්කර තිබේ. දැනට මෙහි මූලිකව කටයුතු කරනු ලබන්නේ පූජ්‍ය මාණික්කාවේ චූලාභය ස්වාමීන් වහන්සේ හා ටී. සුභූති හිමිතුමා වෙති. ඡත්‍ර ලෙණක්ද සමග මෙහි ලෙන් සිය ගණනක කටාරම් කොටා ඇත. එයින් පහත සඳහන් අභිලෙඛන මවිසින් පිටපත්කර ගන්නා ලදී. තවත් කන්දේ අපට හමු නොවූ අභිලෙඛන හා නටබුන් කොතෙකුත් තිබිය හැකිය. මෙම ලිපි මවිසින් පිටපත් කිරීමට පළමු කිසිවකු පරීක්‍ෂා කර නැත.

අම්පාර - මහඔය මාර්‍ගයේ අසලම පිහිටි නිසා මෙහි
ගමනා ගමනය අපහසු නොවේ.

1* **උතරගුත තෙරශ ලෙණෙ.**
උත්තර ගුප්ත ස්ථවිරයන් වහන්සේගේ ලෙණ
(පුදන ලදී.)

2* **ගමික අගිනිය ලෙණෙ.**
ගම්පති අග්නීගේ ලෙණ (පුදන ලදී.)

3* **බත ශුමන ගුතශ ලෙණෙ - බත ශුමන ගුතශ ලෙණෙ ශග(ශ)**
ස්වාමි සුමන ගුප්තගේ ලෙණ - ස්වාමි සුමන ගුප්තගේ ලෙණ සංඝයාට (පුදන ලදී.)
මේ ලිපිය දෙවරක් කොටවා ඇත,

4* **බත තිශ මිතශ ලෙණෙ.**
ස්වාමි තිෂ්‍ය මිත්‍රගේ ලෙණ (පුදන ලදී.)



5* **දෙවනපිය මහරජහ ගමිණි අබහඣිත පරුමක දුත ශුමනහ ඣය - ලඣක ලෙණෙ.**
දෙවානම්ප්‍රිය ග්‍රාමණී අභය මහරජුගේ දියණියවූ ප්‍රමුඛ ත්‍රානාපති සුමනගේ භාර්‍යාවගේ දැකුම්කළු ලෙණ (පුදන ලදී.)

6* **බත තිශ මහ++++ලෙණෙ.**
සවාමි තිෂ්‍යමහ++++ලෙණ (පුදන ලදී.)

7* **බත වශු බුතිය ලෙණෙ.**
සවාමි වශුභූතිගේ ලෙණ (පුදන ලදී.)

8* **පරුමක දුත ශුමන පුත පරුමක අබය ලෙණෙ**
ප්‍රමුඛ තානාපති සුමනගේ පුත්‍රයාවූ ප්‍රමුඛ අභයගේ ලෙණ (පුදන ලදී.)

9* **පරුමක මිත පුත පරුමකදුත ශුමන හ ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ දිනෙ**
ප්‍රමුඛ මිත්‍රගේ පුත්‍රයාවූ ප්‍රමුඛ තානාපති සුමනගේ ලෙණ පැමිණි - නොපැමිණි සිවුදිග සංඝයාට දෙන ලදී.

10* **දෙවනපිය මහරජහ ගමිණි අබහ ජය රජිතය මතය අබි තිශය ලෙණෙ**
දෙවානම්ප්‍රිය ග්‍රාමිණී අභය මහ රජුගේ භාර්‍යාවවූ රාජිතාගේ මව වන අබිතිෂ්‍යාගේ ලෙණ (පුදන ලදී.)

11* **බත ශුමනහ ලෙණෙ.**
සවාමි සුමනගේ ලෙණ, (පුදන ලදී.)

12* **බත චුඩි තිශහ ලෙණෙ දශහගම+ + ශගශ.**
සවාමි චූලතිෂ්‍යගේ ලෙණ, දශහගම — —
සංඝයාට (පුදන ලදී.)

13* **පරුමක තෙළු වෙළු උති මරුමකණ පරුමක උති සුතහ රමක වෙළුහ ලෙණෙ මහ ශුදශනෙ.**
ප්‍රමුඛ තෙළු වෙළු උත්තියගේ මුණුපුරුවූ ප්‍රමුඛ උත්තියගේ පුත්‍රවූද රම්‍යකවෙළුගේ මහ සුදර්ශන ලෙණ (පුදන ලදී.)

14* **බමණ බගනන ජිතය පරුමක වෙළුහබරිය පරුමකළු තිශය ලෙණෙ මනපදශනෙ.**
බමුණු බගගේ දියණියවූද ප්‍රමුඛ වෙළුගේ භාර්‍යාවවූ ප්‍රමුඛ තිෂ්‍යාගේ මනාප දර්ශන ලෙණ (පුදන ලදී.)

15* **පරුමක මුකතිශ පුත පරුමක තිශහ ලෙණෙ ශගශ.**
ප්‍රමුඛ මුක තිෂ්‍යගේ පුත්‍ර ප්‍රමුඛ තිෂ්‍යගේ ලෙණ
සංඝයාට (පුදන ලදී.)

16* **බත ශිවබුතිය ලෙණෙ**
සවාමි ශිවභූතිගේ ලෙණ (පුදන ලදී.)

**17* දිගමඣිම බණක බත තිශහ ලෙණෙ.**

දීඝ නිකාය, මජ්ඣිම නිකාය, භාණකවූ ස්වාමී තිෂ්‍යගේ ලෙණ (පුදන ලදී.)

**18* සමුදගුත තෙරශ අතිවශිත උගහ ලෙණෙ.**

සමුද්‍රගුප්ත තෙරුන්ගේ අන්තේවාසික උග්‍රගේ ලෙණ (පුදන ලදී.)

**19* + + + + ශුමනහ ලෙණෙ.**

- - - - සුමනගේ ලෙණ (පුදන ලදී.)

# සමන්ගල:

අම්පාර දිසාවේ උහන උපදිසාපති කොට්ඨාශයට අයත් සමන්ගල තරමක කඳුගැටයකි. තනි තනිව පිහිටි විවිධ ප්‍රමාණයේ ලෙන් සමූහයක් මෙහි ඇත. සියලු ලෙන් කටාරම් කොටා ඇතත් අභිලේඛන සමහර ලෙන්වල පිහිටුවා නැත. කන්දේ තැන තැන ස්තූප කීපයක ගඩොළු හැරෙන විට වෙනත් නටබුන් කිසිවක් නැත. එක් ලෙණක ස්තූපයක සටහනක්ද තවත් ලෙණක වැදි චිත්‍ර රසක්ද දක්නට ලැබේ. කන්දේ එක පැත්තක බැවුමේ දෙළ පාරක් පිහිටීම නිසා ජලය එතරම් හිඟ නොවේ. බටහිර පැත්තේ පාමුල ස්තූපයක ශේෂ හා ගල්කණු කීපයක්ද දක්නට ලැබේ.

අම්පාර - මංගල ඔය මාර්ගයේ 28 කොලනි හන්දියෙන් ඇරඹෙන බණ්ඩාරදූව ගුරුපාරේ කි: මී: 6 ක් පමණ ගොස් නැවතත් නැගෙනහිරි අතට කි:මී: දෙකක් පමණ යාමෙන් සමන්ගලට යා හැකිවේ. දැනට ගන වනයෙන් ගැවසුණු මේ ස්ථානය අම්පාරේ බුද්ධංගල අරණ්‍යසේනාසනයේ ශාඛාවක්ලෙස පවත්වාගෙන යන්නේය. මෙතෙක් කිසිම පරීක්ෂණයක් කර නැති මෙහි මවිසින් පිටපත්කරගත් ලිපි පහත පළවෙයි.

**1* + + මඣ + + + + + ශහ ලෙණෙ.**

අර්ථයක් ගත නොහැකිය.

**2* තිශ තෙරශ ශුදශනෙ.**

තිශ්‍ය ස්ථවිරයන් වහන්සේගේ සුදර්ශන (ලෙණ පුදනලදී.)

**3* බත (අ) මරශ.**

ස්වාමි (අ) මුරගේ (ලෙණ පුදන ලදී.)

**4* බත චුඩතිශශ අචරිය දතශ ලෙණෙ**

ස්වාමී චූලතිෂ්‍යගේ ආචාර්යවූ දත්තගේ ලෙණ (පුදන ලදී)

**5* උප රඣහ පුත අය අබය පුත අයතිශහ**
**පුත තිශ අයත කරිතෙ මහ ලෙණෙ අගත**
**අනගත චතුදිශ ශගශ දිනෙ.**

උපරජුගේ පුත්‍රයාවූ අබය කුමරුගේ පුත්‍රයා වූ තිෂ්‍ය කුමාරයාගේ පුත්‍රයාවූ තිෂ්‍ය කුමාරයා විසින් කරවන ලද මහලෙණ පැමිණි නොපැමිණි සිවුදිග සංඝයාට දෙන ලදී.

**6* + + + + + + + ශම + + + + +**

ලිපිය විනාශ වී ඇත.

**7* පරුමඣ ගුතහ මහ ලෙණෙ.**

ප්‍රමුඛ ගුප්තගේ මහ ලෙණ (පුදන ලදී.)

**8* බරත දම ගුතශ ලෙණෙ.**

භරත ධර්ම ගුප්තගේ ලෙණ (පුදන ලදී.)

මේ ලිපිය දකුණේ සිට වමට කියැවෙනසේ කොටා ඇත.

**9* උතශච පුශ ගුතශ ච ලෙණෙ අගත අනගත**
**චතුදිශ ශගශ.**

උතගේද පුෂ්‍යගුප්තගේද ලෙණ පැමිණි-නොපැමිණි සිවුදිග සංඝයාට (පුදන ලදී)

**10* + + + + + + ලෙණෙ ශගශ**

\- - - - - - ලෙණ සංඝයාට (පුදන ලදී.)

**11* දමරකිත තෙරශ ලෙණෙ චතුදිශ ශගශ**
**පිදියතෙ**

ධර්මරක්ෂිත ස්ථවිරයන් වහන්සේගේ ලෙණ සිවුදිග සංඝයාට පුදන ලදී.

**12* අද (ෙ)නර පුතශ උපශක ගුතතිශහ (ලෙ) ණෙ**
**ශගශ.**

අදලකරගේ පුත්‍රයාවූ උපාසක ගුප්ත තිෂ්‍යගේ ලෙණ සංඝයාට දෙනලදී.

පරිග්‍රහණ අංකය: 18127 දිනය: අංකය:

**13* වෙශ තෙරශ ලෙණෙ.**
**අමරශ ලෙණෙ.**

වෛශ්‍ය ස්ථවිරයන් වහන්සේගේ ලෙණ (පුදන ලදී.)
අමරගේ ලෙණ (පුදන ලදී.)

**14* + + + + තිශහ ලෙණෙ අගත අනගත චතුදිශ**
**ශගශ**

\- - - - තිෂ්‍යගේ ලෙණ පැමිණි නොපැමිණි සිවුදිග සංඝයාට (පුදන ලදී.)

**15* ශොම ගණ නගලිය බගිනිය පරුමඣ**
**බුඩකලශ ලෙණෙ.**

මෙය තරමක් අපැහැදිලි ලිපියකි.

**16*** ඛත දම ගුතශ ලෙණෙ.

සවාමි ධර්මගුප්තගේ ලෙණ (පුදන ලදී.)
මෙයද දකුණේ සිට වමට කියැවෙනසේ කොටා ඇත.

## මලයඩිකන්ද:

අම්පාර දිසාවේ හිඟුරාන සීනි කම්හලට කි:මී: 2 පමණ දුරින් පිහිටි මලයඩිකන්ද පැරණි නටබුන් වලින් ගහණ ස්ථානයකි. මෙහි කන්ද පාමුළ ස්තූපයක නටබුන් හා ගොඩනැගිලි කීපයක ගල්කණු ආදියද දක්නට ලැබේ. කන්දේ සෑම තැනකම කටාරම් කොටන ලද ලෙන් තිබේ. කන්ද අබියස තැනිබිමේද ලෙන් ගණනාවක් ඇත. මිහින්තලයේ මිහිඳු ගුහාව හා සමාන ලෙණක්ද ඇත. සමහර ලෙන්වල අභිලේඛන කොටා නැත. ඇතැම් ලෙන් කටාරම සහිත කොටස් කැඩී වැටී තිබේ. මෙහි කිසිදු ගවේෂණයක් කර නැත. මවිසින් සොයාගත් ලිපි මෙහි දක්වනු ලැබේ. මෙහි වර්තමානයේ භික්ෂූන් වහන්සේලා වැඩ සිටිති. එක් ලෙණක බුදුමැඳුරක් කරවාගෙන යයි. එම ලෙණේ වැදි චිත්‍ර රූසක්ද දක්නට ලැබේ.

හිඟුරානේ සීනිකම්හල අසලින් ඇති ගුරුපාරෙන් හෝ දමන විදුහල අසලින් නැගෙනහිරට වැටී ඇති ගුරුපාර දිගේ යාමෙන් හෝ තෙලකී ස්ථානයට යාමට හැකිය. ලෙන් සහිත කන්ද තවම ගන වනයෙන් වැසී ඇත.

**1*** ගමිණි නග පුත අය අබය පුත අය
තිශෙන කරිතෙ ශගශ දිනෙ.

ග්‍රාමණී නාගගේ පුත්‍රයාවූ අභය කුමරුගේ පුත්‍ර
තිෂ්‍ය කුමරු විසින් කරන ලද (ලෙණ) සංඝයාට දෙන ලදී.

**2*** අශි නග දතහ ලෙණෙ ශගශ.

ආයුෂ්මත් නාග දත්තගේ ලෙණ සංඝයාට (පුදන ලදී.)

**3*** ශුමිය ච පුශහ ලෙණෙ අශි ශතග ලෙණෙ.

සූයර්ගේද පුෂ්‍ය ගේ (ද) ලෙණ. ආයුෂ්මත් ශප්තගේ ලෙණ (දෙන ලදී.)

**4*** ගොති මක ශිවරකිතහ ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ.

ගෞප්තිමාත්‍ය ශිවරක්ෂිතගේ ලෙණ පැමිණි නොපැමිණි සිවුදිග සංඝයාට (පුදන ලදී.)

**5* බුඩිතිශ තෙරශහ දිවිගරිය අශරහ ලෙණෙ.**
චූල තිෂ්‍ය ස්ථවිරයන් වහන්සේගේ (ද) දේවගිරියේ අසරගේ (ද) ලෙණ (පුදන ලදී.)

**6* බුඩතිශතෙරශච අශියශුමනහ ලෙණෙ.**
චූලතිෂ්‍ය ස්ථවිරයන් වහන්සේගේද ආයුෂ්මත් සුමනගේ(ද) ලෙණ (පුදන ලදී.)

**7* ගපති නද පුත බුඩතිශහ ලෙණෙ උපශික ශුමහ ලෙණෙ.**
ගෘහපති නදගේ පුත්‍රයා වූ චූලතිෂ්‍යගේ ලෙණ (ද) උපාසිකා සුම්මාගේ ලෙණ (ද) (පුදන ලදී.)

**8* පරුමක ගොටක ශුමනහ බරිය උපශික අයදගෙ ලෙණ ශගශ.**
ප්‍රමුඛ ගොෂ්ටික සුමනගේ භාර්‍යාව වූ උපාසිකා ආර්‍යධාත්‍රීගේ ලෙණ සංඝයාට (දෙන ලදී.)

**9* ගමික උතිය බත උතරශ ච+ + + + + + +**
ගම්පති උත්තියගේ (ද) ස්වාමී උත්තරගේ ද + + + + + + + +

## කුඩුම්බිගල:

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ පානම පත්තුවට අයත්ව පොතුවිල ආදයම් පාලක කොට්ඨාශයේ සීමාවේ පිහිටි කුඩුම්බිගලට නැගෙනහිරි වෙරළේ සිට කි: මී; 1½ ක් පමණ දුරවෙයි. ක්‍රි: පූ: යුගයේ ආරණ්‍යයක් සේ ආරම්භව ගිය කුඩුම්බිගල ස්තූප හා ලෙන් කර්මාන්තයෙන් සරු ස්ථානයකි. මෙහි සෑගිරි බැලුම්ගලේ පිහිටි ස්තූපය භාරතයේ ධර්මරාජික ස්තූපය සේ නිර්මිත වූවකි. එය සිලින්ඩරාකාර බව හෝකාට් ශූරීන් පවා සඳහන් කර තිබේ. නටබුන් තලාවේ විවිධ ගොඩනැගිලි ගණනාවකම ශේෂ දක්නට ලැබේ. මෙහි තැන තැන පිහිටි ස්වාභාවික ගල්කෙමි: 18 පුදුම එලවන සුලුවේ. බොහෝ ප්‍රදෙශ්යක පැතිරී ඇති ලෙන් රැස පැරණි යුගයේ මහ රහතන් වහන්සේලාගේ වාම් කුටි විය. වර්තමාන යුගයේ [1954] සිට නැවතත් භික්ෂූන් වහන්සේ වාසය කරන තපෝවනයක් සේ පවත්වාගෙන එයි. දැනට තපෝවනාධිපති ධුරය දරනු ලබන්නේ ගරු තාඹුගල ආනන්දසිරි ස්ථවිර පාදයන් වහන්සේ විසිනි.

මෙහි පිහිටි ලෙන් සියල්ලම කටාරම් කොටා ඇත. ඒවායින් සමහරක අභිලෙඛන පිහිටුවා නැත. මින් ලිපි පහක් පමණක් මහාචාර්‍ය පරණවිතාන ගේ INSCRIPTION OF CEYLON Vol. 1 P. 38 අංක 498 සිට 502 දක්වා හා JRASCB - NS. V P 147- ද පළකර ඇත. අනෙක් ලිපි මෙතාක් පරීක්‍ෂණ කර නැත්තේය.

මොනරාගල පොතුවිල් මාර්ගයේ පොතුවිලට ගොස් එහි සිට පානමට යා යුතුය. පානම සිට වනසතුන් ගහණ වනයේ හා වෙල්එළි මැදින් කි:මී: 12 පමණ ගමන් කිරීමෙන් කුඩුම්බිගලට පැමිණිය හැකිවේ.



1* **බත + + + + + දෙදශ පදග + නි.**
සවාමි+ + + + + පියගැට දෙළස දෙන ලදි.
මේ ලිපිය පියගැට පෙළ අසල කොටා ඇත්තකි.

2* **තිශ තෙරහ ලෙණෙ මනොරමෙ**
තිෂ්‍ය ස්ථවිරයන් වහන්සේගේ මනෝරම්‍ය ලෙණ (පුදන ලදි.)

3* **අමත තිශහ ලෙණෙ ශගශ.**
තිෂ්‍ය අමාත්‍යයාගේ ලෙණ සංඝයාට (පුදන ලදී.)

4* **සුමන කුටෙ ලෙණෙ.**
සුමනකුට ලෙණ (පුදන ලදී.)

5* **උපශක වෙළිශ ලෙණෙ ශගශ.**
උපාසක වෙළුගේ ලෙණ සංඝයාට (පුදන ලදී.)

6* **පරුමක අශි සුමනහ ලෙණෙ ශගශ.**
ප්‍රමුඛ ආයුෂ්මත් සුමනගේ ලෙණ සංඝයාට (පුදන ලදී.)

7* **ගපති දෙවරකිත පුත පරුමක තිශහ ලෙණෙ ශගශ දිනෙ.**
ගෘහපති දෙවරක්‍ෂිත ගේ පුත්‍රයාවූ ප්‍රමුඛ තිෂ්‍යගේ ලෙණ සංඝයාට දෙන ලදී.

8* **බුදරකිත තෙරශ ලෙණෙ ශගශ දිනෙ**
බුද්ධරක්ඛිත ස්ථවිරයන් වහන්සේගේ ලෙණ සංඝයාට දෙන ලදී.

9* **+ + දපුශ දුටශ + + +**
**ගතන ගතන + + + + + +**
+ + දපුශ දුටගේ + + +
පැමිණි නොපැමිණි + + + + + +

10* **බ (ත) දමරකිතශ ලිණෙ.**
ස්වාමී ධර්මරක්‍ෂිතගේ ලෙණ (පුදන ලදී.)

11* **— ශොණ ගුත තෙරශ ලෙණෙ ශගශ.**
ශෝණගුප්ත ස්ථවිරයන් වහන්සේගේ ලෙණ සංඝයාට (පුදන ලදී.)

12* **බත ශගරකිතශ ලෙණෙ පටිබණ කුටෙ + + + + ශනෙ.**
ස්වාමි සාගරකීර්තිගේ ප්‍රතිභාණ කූට ලෙණ + + + + දෙන ලදී.

13* **පරුමක නදික පුතශ පරුමක මිතශ ලෙණෙ මහ ශුදශනෙ ශගශ දිනෙ.**
ප්‍රමුඛ නන්දික ගේ පුත්‍රයාවූ ප්‍රමුඛ මිත්‍රගේ මහා සුදර්ශන ලෙණ සංඝයාට දෙන ලදී.

මෙම ලිපියට මුලින් සංකෙතයකි. සමහරු එය නන්දිමිත්‍රගේ පියාගේ අත්සන ලෙසටද සමහරු ත්‍රිරත්න සංකෙතය ලෙසටද සලකති.

14* **බත පුශගුතශ මහ ලෙණෙ මනපදශනෙ ලෙණ ශගශ දිනෙ.**
ස්වාමී පුෂ්‍ය ගුප්තගේ මහ ලෙණ වූ මනාප පදර්ශන ලෙණ සංඝයාට දෙන ලදී.

**15*** **ගමික නග පුතෙ ගමික ති (ශ) ශ කරපිතෙ ඉ (ෙ) ම ලෙණෙ ශෙනපිති අවය ශගශ දිනෙ**

ගම්පති නාගගේ පුත්‍රයාවූ ගම්පති තිෂ්‍ය කරවූ මේ ලෙණ සේනාපති අවය විසින් සංඝයාට දෙන ලදී.

මෙ ලිපියේ "අවය" යන්න එස්. පරණවිතාන මහතා "ජුව" වශයෙන්ද සී. ඩබ්ලිව්. නිකලස් මහතා "තිව" වශයෙන්ද කියවා ඇත.

**16*** **බත දමගුතශ අටදශ පදග + +**

සවාමී ධර්මගුප්තගේ පියගැට දහ අට (දෙන ලදී.)

මෙහි 12 සිට 16 දක්වා ලිපි පහ මුලින් සඳහන්කළ පරිදි පරීක්ෂාකර ඇති ලිපිවේ.

## බඹරගස්තලාව:

යාල අභයභූමියට සම්බන්ධ ගන වනාන්තරයේ අක්කර සිය ගණනක පැතිරීගිය විවිධ නටබුන් වලින් ගහණ බඹරගස්තලාව පැරණි නාගපබ්බත සෙනාසනයයි. මෙය කුඩුම්බිගල සැගිරි බැලුම් හලට පෙනෙන ස්ථානයකි. නිබඳවම වන සතුන් ගැවසෙන බඹරගස්තලාවේ සිය ගණන් ලෙන් වන සතුන්ගේ නිවාස වී තිබේ. මෙහි ලෙණක ඇති සුවිසාල බුද්ධ ප්‍රතිමාව විනාශවෙමින් පවතී. ස්තූප පියගැටපෙළවල් ආසනඝර, ගල්කෙමි, විවිධ ගොඩනැගිලිවල ශෙෂ මෙහි දක්නට ලැබේ. කුඩුම්බිගල සිට කි: මී: 4 ක් පමණ දුරින් පිහිටි බඹරගස්තලාවේ බුදුලෙණට ජීප්රියකින් යා හැකිය. මේ මාර්ගයේ නොයෙක් වන සතුන් ගැවසෙන හෙයින් එහි යාම ඉතා අනතුරු දයකවේ.

මෙහි ලිපි 20 ක් මහාචාර්ය පරණවිතානගේ INSCRIPTION OF CEYLON Vol. I ග්‍රන්ථයේ 503 - 522 දක්වා ලිපි ලෙස පළකර ඇත. මෙහි මවිසින් සොයාගත් ලිපි 17 පමණක් දක්වනු ලැබේ. ගිරිලිපි කීපයක්ද මෙහි ඇතත් ඒවාද මෙතාක් පරීක්ෂාකර නැත.

**1*** **පුශ මපිකශ ශ + ම + + ශ.**
තේරුමක් ගැනීම අපහසුය.

**2*** **බ + + ය + + + ඛ + + + + + + ශශශ.**
ලිපිය විනාශවී ඇත.

**3*** **+ + + + තශ + + ර + + ශ + + +**
ලිපිය විනාශවී ඇත.

4* **බත ශුමන බුතිය (ලෙණෙ) ශගශ.**
සවාමී සුමන භූතිගේ (ලෙණ) සංඝයාට (පුදන ලදී.)

5* **බත + + + + මිත ශමුද + + + ත**
ලිපිය විනාශවී ඇත.

6* **පුශ ගුතහ ලෙණෙ ශගශ.**
පුෂ්‍ය ගුප්තගේ ලෙණ සංඝයාට (පුදන ලදී.)

7* **ශගරකිතහ ලෙණෙ ශුදශනෙ.**
සාගරකීර්තිගේ සුදර්ශන ලෙණ (පුදන ලදී.)

8* **බත ශමුද ගුතශ ලෙණෙ ශගශ**
සවාමී සමුද්‍රගුප්තගේ ලෙණ සංඝයාට (පුදන ලදී.)

9* **බත තිශගුතහ ලෙණෙ ශගශ**
සවාමී තිෂ්‍යගුප්තගේ ලෙණ සංඝයාට (පුදන ලදී.)

10* **බත මෙරු දතශ ලෙණෙ.**
සවාමී මෞර්‍ය දත්තගේ ලෙණ (පුදන ලදී.)

11* **බත තිශහ ලෙණෙ ශගශ.**
සවාමී තිෂ්‍යගේ ලෙණ සංඝයාට (පුදන ලදී.)

12* **ගමික ශමුදහ පුතහ ගමික පුශහ**
**ගමික රතිශහ පරුමක ශුමන.**
ගම්පති සමුද්‍රගේ පුත්‍රයාගේද ගම්පති පුෂ්‍යගේද
ගම්පති රතිශගේද ප්‍රමුඛ සුමන (ගේද ලෙණ පුදන ලදී.)

13* **තිශ තෙරශ ලෙණෙ ශගශ.**
තිෂ්‍ය ස්ථවිරයන් වහන්සේගේ ලෙණ සංඝයාට (පුදනලදී.)

14* **පුශගුත තෙරශ ලෙණෙ අගත අනගත චතුදිශ**
**ශගශ.**
පුෂ්‍යගුප්ත ස්ථවිරයන් වහන්සේගේ ලෙණ පැමිණි
නොපැමිණි සිව්දිග සංඝයාට (පුදන ලදී.)

15* **උති තෙරහ බතික තිශ තෙරහ ලෙණෙ ශගශ.**
උත්තිය ස්ථවිරයන් වහන්සේගේ සහෝදර තිෂ්‍යස්ථවිරයන්
වහන්සේගේ ලෙණ සංඝයාට (පුදන ලදී.)

16* **විනයදර පුශ තෙරහ මතය උපශික සිවලය**
**ලෙණෙ ශගශ නියතෙ දෙවරමනෙ ලෙණෙ.**
විනයධර පුෂ්‍ය ස්ථවිරයන් වහන්සේගේ මව වූ
සිවලී උපාසිකාවගේ ලෙණ සංඝයාට දෙන ලදී.
දෙවරමණ ලෙණයි.

17* **බත වෙශහ ලෙණෙ ශගශ.**
සවාමී වෛශ්‍යගේ ලෙණ සංඝයාට (පුදන ලදී.)

## කරඳහෙල:

අම්පාර දිසාවේ, ලාහුගල උපදිසාපති කොට්ඨාශයට අයත් කරඳහෙල විහාරය; කාවන්තිස් රජු විසින් කරවන ලද හබුතගල විහාරය ලෙස සැලකේ. මෙහි කඳුපාමුළ ස්තූප හා විවිධ ගොඩනැගිලිවල නටබුන් සමූහයක්ම ඇත. කන්දේ පිහිටි ලෙන් රුහුණේ ඇති සියලුම ලෙන් අබිබවා යන තරම් සුවිශාලය. මීන් එකක විශාල සැතපෙන පිළිමයක් නිර්මාණයකර ඇත. එය අද විනාශ වෙමින් පවතී. සමහර ලෙන්වල කොන් සතරක් සහිත ආධාරකයක සිටුවා ඇති ස්වස්තිකය පිළිබිඹු කරන සංකෙතය මනාව කොටා ඇත. මෙහි මුලින්ම පරීක්‍ෂණ කළ සී. ඩබ්ලිව්. නිකලස් මහතා පර්වත ලිපි දෙකක් පමණක් පිටපත්කර JRAS (CB) Vol. V P2 PP 140 හි පළකර ඇත. එහෙත් එතුමාට ලෙන් ලිපි හමුවී නැත. අද්‍ද වලසුන්ගෙන් ගහණ කරඳහෙල පරීක්‍ෂණ කිරීම අවදානම් කටයුත්තකි. මේතාක් වෙනත් ක්‍රමික පරීක්‍ෂණයක් කර නැත. මවිසින් සොයාගත් ලෙන්ලිපි කීපය පහත සටහන්වේ.

මොනරාගල - පොතුවිල මාර්ගයේ හුලංනුගේ හන්දියෙන් හැරී මිරහල දක්වා වැටී ඇති ගුරුපාරේ කි:මී: $1\frac{1}{2}$ පමණ ගියපසු මෙම ස්ථානයට පැමිණිය හැකිය. දැනට මෙහි කුටියක් තනා ගෙන ගරු දියලපේ ඉන්ද්‍රානන්ද ස්වාමීන් වහන්සේ වැඩ සිටිති. (මුන්වහන්සේ 1983 ජූනි 28 දින අපවත්වූහ. එය සිංහල ජාතියේම අභාග්‍යයකි. වීරොදාර අදහස් ඇති උන්වහන්සේ ජාතික ආගමික සටනක යෙදී මේ ස්ථානය ආර ා කළහ.)

1* බදත ශොමදෙවහ ලෙණෙ
හදන්ත ශෝමදෙවගේ ලෙණ (පුදන ලදී.)

2* අචිරිය උතිය ලෙණෙ.
ආචාර්ය උත්තියගේ ලෙණ (පුදන ලදී.)

3* කුබකල තිශශ ලෙණෙ ශගශ
කුම්භකාර තිෂ්‍යගේ ලෙණ සංඝයාට (පුදන ලදී.)

මේ ලිපිය සමග සංකෙත 3 ක් විය.

## දීඝවාපිය;

අම්පාර දිසාවේ දීඝවාපි ප්‍රදෙශයේ ඇති ඉතා කුඩා ගොඩැල්ලක් වුවද පැරණි පුරාවස්තු වලින් ගැවසී තිබේ. මේවා කිසිදු ගවේෂණයකට භාජනය වී නැත. සමහර නටබුන් ස්ථානවලට වර්තමානයේ වුවද ව්‍යවහාර

කරන නමක් සොයා ගැනීම අපහසුය. පුරාවස්තු ගවේෂණයකට ආ බව දැනුනොත් එබඳු ස්ථාන ගැන දන්නා සිංහල බෞඩයින් පවා තොරතුරු සඟවනු අප නොයෙක් විට අත් දැක ඇත. මෙහි කියන ස්ථානයද නමින් අඥතවූවකි. දීඝවාපියෙන් කි: මී; 5 පමණ නැගෙනහිරට හා අක්කරපත්තුවෙන් කි: මී: 5 පමණ බටහිරට හා වන්නට පිහිටි වෙල්යායක් මැද කන්දකි. මේ නටබුන් වලට ආසන්නව ඇති කඳු හතරකි. එයින් එකක් මුල්ලිකුලම්මලේ නමින් හැඳින්වේ. කඳුහතරේ මෙන්ම මේ කොටසේ හැම තැනකම නොයෙක් විධියේ නටබුන් දක්නට ලැබේ. ගල්ලෙන් රැසක්ද ඇත මේ සියල්ලම කටාරම් කොටා ඇති අතර සමහරක අභිලේඛන පිහිටුවා තිබේ. පර්වත ලිපි කීපයක්ද මේ අතර වේ. මේ ලිපි සමග හඳුනාගැනීමට නොහැකි සංකෙත කීපයක්ද දක්නා ලැබේ.

මේ ස්ථාන වලට යාමට මාර්ගය නොදන්නා අයට අපහසුවේ. අම්පාර - දීඝවාපි මාර්ගයේ එරගම උළුකම්හල අසලින් නැගෙනහිරි අතට කි:මී: 2 පමණ ගොස් ගැ:නි:ස:ම: උක්වත්තේ ඇළවේල්ල දිගේ කි:මී: 7 පමණ යන විට තැන තැනදී මේ නටබුන් බැලිය හැකිවේ. මේ කොටසින් සොයාගත් අභිලේඛන පහත සඳහන්වේ. තව බොහෝ ලේඛන ඇති බවත් ක්‍රමික ගවේෂණ කළයුතු බවත් සටහන් කරමි.

වෙල මැද කඳුගැටයේ ලෙණක ගල්බිතේ එක පෙළට කොටා ඇති ලිපි 3කි· මේ සමග ඉහළින් සංකෙතයකි·

1* **දනුගය ගුතහ තුබෙ**.
ධනුර්ධර ගුප්තගේ ස්තූපයයි· (පුදන ලදී·)

2* **දනුගය ගුතහ විහර ශගශ**.
ධනුර්ධර ගුප්තගේ විහාරය සංඝයාට (පුදන ලදී.)

3* **දනුගය ගුතහ ලෙණෙ**.
ධනුර්ධර ගුප්තගේ ලෙණ (පුදන ලදී·)

මුල්ලිකුලම්මලේ කොටසේ ලෙණක පහත සඳහන් ලිපිය කොටා ඇත.

1* **නදිගිරිය මත උපශික තිශය**
**තිශ ගුතහ ඣිත උපශික තිශය**.
නන්දිගිරිගේ මවවූ උපාසිකා තිෂ්‍යාගේ (ද)
තිෂ්‍යගුප්තගේ දියණියවූ උපාසිකා තිෂ්‍යාගේ (ද)
(ලෙණ පුදන ලදී.)

"නන්දිගිරිගේ මවවූ තිෂ්‍යගුප්තගේ දියණියවූ තිෂ්‍යා උපාසිකාවගේ" යන අර්ථයද ගත හැකිය.

## හිමිදුරාව;

අම්පාර දිසාවේ කොන්ඩවටවන වැව ඉහළ කොටසට අයත් පරගහ කැලේ හා හිමිදුරාව ජනපද ආසන්නව පිහිටි දිගටි කඳු වැටියකි. මේ ප්‍රදෙශයේද බොහෝ සෙයින් පුරාවස්තු ඇතත් ගවේෂණකර නැත. තෙල කඳුවැටියේ ලෙන් රැසක් තිබේ. පර්වත ලිපිද කීපයක් දක්නට ලැබේ. පිටපත් කරගත හැකිවූ ලිපි කීපය මෙසේය.

1* **උපශිකය ශුඩය ලෙණෙ.**
උපාසිකා සුජාගේ ලෙණ (පුදන ලදී.)

2* **ගපති උතරශ ලෙණෙ.**
ගෘහපති උත්තරගේ ලෙණ (පුදන ලදී.)

3* **ගපති ශුමන කුලශ ලෙණෙ.**
ගෘහපති සුමන කුලයේ ලෙණ (පුදන ලදී.)

4* **ගපති ගණක තිශශ ලෙණෙ.**
ගෘහපති ගණක තිෂ්‍යගේ ලෙණ (පුදන ලදී.)

මේ ලිපියේ ගණක යනු "ගණකාධිකාරී" අර්ථය විය යුතුසේ පෙනේ.

## හිඟුරාන:

අම්පාර දිසාවේ හිඟුරාන සීනි කම්හල පිටුපස ඇති පංසලේ කුඩා ගල්ලෙන් කීපයක් තිබේ. මෙහි එක ලෙණක පහත සඳහන් ලිපිය කොටවා තිබේ.

1* **මහමත උතර ධිත චිතය ලෙණෙ.**
මහාමාත්‍ය උත්තරගේ දියණියවූ චිත්‍රාගේ ලෙණ
(පුදන ලදී.)

## මූලගම:

අම්පාර දිසාවේ පිහිටි මුලගම පෙදෙසද කිසි දිනක ගවේෂණයකර නැති බව පෙනේ. පැරණි දිගාමඩුළු රාජධානියේ බොහෝ තොරතුරු මේ පෙදෙසේ කඳුවල ඇති නටබුන් අතර සැඟවී තිබේ. මෙහි කන්දේ ලෙන් හා වෙනත් නටබුන් බොහෝ තිබේ. ලෙන් සියල්ල කටාරම් කොටා

ඇති නමුත් හමුවූයේ එක අභිලේඛනයකි. එහෙත් තවත් තිබීමට හොඳටම ඉඩ තිබේ. වන්‍යසතුන් බහුල නිසා මෙහි ගමන අනතුරු දායකවේ. අම්පාර ඉඟිනියාගල පාරේ පන්සල් හන්දියෙන් මුල්ලේගමට යන පාරේ කි: මී: 6½ පමණ ගොස් නාමල්ඔය වේල්ල දිගේ වැවේ පිටවාන ළඟින් වමට හැරී කි: මී: 5½ පමණ ගිය විට මුලගම ඔය හමුවේ. ඔය ළඟ සිට කි: මී: 1 පමණ කන්දට දුරවේ. මෙහි විශාල ලෙණක භිත්ති හා උළුවහු පවා දක්නට ලැබේ. අමාරුවෙන් පිටපත්කර ගත් ලිපිය පහත සඳහන්වේ.

1* තිශ තෙරශ ලෙණෙ.
තිශ්‍ය ස්ථවිරයන් වහන්සේගේ ලෙණ (පුදන ලදී.)

## බුද්ධංගල:

අම්පාර දිසාවේ අම්පාර නගරයට කි: මී: පහක් පමණ උතුරින් පිහිටි බුද්ධංගල ආරණ්‍යය ඉතා ප්‍රකට තැනකි. බුද්ධ ප්‍රමුඛ අග්‍රශ්‍රාවක ධාතූන් මෙහි තිබී හමුවීම ඉතා වැදගත් සිද්ධියකි. මෙහි ලෙන්වල තිබූ ලිපි කීපයක් පිටපත්කර මහාචාර්ය පරණවිතාන විසින් INSCRIPTION OF CEYLON Vol. I ග්‍රන්ථයේ සඳහන්කර ඇත. එහි දක්වා ඇත්තේ ස්ථාන නාමය මල්වත්ත වශයෙනි. දැනට මෙහි අධිපති ධුරය දරණ පූජ්‍ය කළුතර ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ වැඩ සිටින කුටිය පිහිටි ලෙණේ ලිපිය කිසිවෙකු දැක නැත. එහි අකුරු කීපයක් අඩුවේ.

1* ගමිකා ශිවපුත දිගමිත + + + + හ
ගම්පති ශිවගේ පුත්‍රයාවූ දීර්ඝමිත්‍ර + + + + හ

## බණ්ඩාරදූව:

අම්පාර දිසාවේ පිහිටි බණ්ඩාරදූව පැරණි ගම්මානයකි. මහ වනයෙන් වටවී තනිව පිහිටි මෙහි පවුල් කීපයක් පදිංචි වී සිටිති. මෙම ප්‍රදේශයේ කිසිදක පුරාවිද්‍යාගවේෂණ කර නැත. බණ්ඩාරදූවට කි: මී 4 පමණ දුරින් ගන වනයේ පිහිටි පුරාණ ස්ථානයක විවිධ නටබුන් ඇති අතර අභිලේඛන රැසක්ද තිබේ. අම්පාර මහඔය පාරේ 28 කොළනිය හන්දියෙන් වැටී ඇති ගුරුපාරෙන් බණ්ඩාරදූවට යාහැකිවේ. පිටපත් කරගත් ලිපි කීපය හැර තවත් ලිපි තිබෙන බව පෙනේ.

1* බත නුගදතශ ලෙණෙ.
ස්වාමි න්‍යග්‍රොධ දත්තගේ ලෙණ (පුදන ලදී.)

**2* දෙවගුතහ ලෙණෙ.**
දෙවගුප්තගේ ලෙණ (පුදන ලදී.)

**3* බත තිශමිතශ ලෙණෙ.**
ස්වාමි තිෂ්‍ය මිත්‍රගේ ලෙණ (පුදන ලදී.)

## ඕමුණගල:

අම්පාර දිසාවේ මහඔය උපදිසාපති කොට්ඨාශයට අයත් ඕමුණගල කන්ද විවිධ නටබුන් වලින් ගහණ ස්ථානයකි. මාදුරාඔය වර්තමාන වැඩ බිමට ඕමුණගල කන්ද ඉතා දකුම්කලුව පෙනේ. මෙහි විශාල ස්තූපයක ශෙෂ, හා විශාල බුදුමැදුරු ලෙණේ ශෙෂ විශේෂ තැනක් ගනී. දිය පොකුණක් අසල ගලක කොටන ලද නාගරූපය සැලකිල්ලට ලක්කළ යුතු වූවකි. කන්දේ ඉහළම කොටසේ පිහිටි විශාල ලෙණ දඹුල්ල සිහිගන්වයි. මේ ලෙණ බුදුමැදුරකි. බුදු පිළිම, චිත්‍ර සියල්ල විනාශ වී ගොස් ඇත. කඳු මුදුනේ පර්වතයේ සිට විහාර ලෙණ අබියස පසෙකට ඇද වැටෙන දිය ඇල්ල ඉතා වටිනා වස්තුවකි. කන්දේ සෑම තැනකම ලෙන් තිබේ. මේවා කටාරම් කොටා ඇති අතර සමහරක ලිපි නැත. පුරා විද්‍යා දෙපාර්ථමේන්තුවෙන් පිටපත්කර ඇති එක ලිපියක් පමණක් INSCRIPTION OF CEYLON Vol. I ග්‍රන්ථයේ අංක 403 යටතේ පළකර තිබේ. මෙහිද ක්‍රමිකව කිසිදු ගවේශණයක් කර නැත. නන්දිමිත්‍ර යොධයා හා දුටුගැමුණු රජුට සම්බන්ධ විවිධ ඓතිහාසික පුරාවෘත්ත මෙහි වැදි ජනතාව අතර ප්‍රචලිතව ඇත. මෙහි ඇති ලිපියකින්ද මේ කථා තහවුරුවන සාධක හමුවේ. මවිසින් පිටපත් කරගත් ලිපි පමණක් මෙහි දක්වේ.

බදුල්ල-මඩකලපුව මාර්ගයේ මහඔය නගරයේ සිට මාදුරාඔය දක්වා විහිදෙන කරත්තපාරේ කි: මී: 15 ක් පමණ ගමන් කිරීමෙන් තෙලකී ස්ථානයට පැමිණිය හැකිය. මේ මග වනය මැදින් වැටී තිබේ. පායන කාලයට ජීප්රියක් අමාරුවෙන් යා හැකිය. මේ ගමන මා ගියේ අධික වර්ෂා කාලයක පයිනි. දනට ස්ථානයේ ගල්ලෙන් කීපයක් කුටියේ සකසා දිඹුලාගල ආරණ්‍යායතනයේ ශාඛාවක් ලෙස පවත්වාගෙන යනු ලැබේ.

**1* බත සොමහ ච බත අභ ක හ ච ලෙණෙ මනපදශනෙ.**
ස්වාමි සෝමගේද ස්වාමි අභක (අශෝක) ගේද මනාපදර්ශනා ලෙණ - (පුදනලදී,)

මේ ලිපිය සමග නෙළුම් මලක සංකෙතයක්ද විය.

2* **පරුමක නදික මිත ඣිතය පරුමක තිලකනයහ ඣය උපශික ගුතය ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ.**

ප්‍රමුඛ නන්දිමිත්‍රගේ දියණිය වූ ප්‍රමුඛ ත්‍රිලක්ෂණ කුමරුගේ භාර්‍ය්‍යාව වූ උපාසිකා ගුප්තාගේ ලෙණ පැමිණි නොපැමිණි සිවුදිග සංඝයාට (පුදන ලදී.)

3* **බත සිවලිය කුමෙ + +**

ස්වාමි සීවලීගේ කුටිය + + (පර්‍වතය)

## පුළුකුණාව:

අම්පාර දිසාවේ බක්කි ඇල්ලට කි: මී: 6 ක් පමණ දුරින් පිහිටි පුළුකුණාව විහාරකන්ද නමින්ද හැඳින්වෙන ඉතා වැදගත් නටබුන් රැසකින් පිරිගිය ස්ථානයකි. මෙහි සමහර පුරාවස්තු සොරාගෙන ගොස් ඇත. මෙහිවූ කවාකාර ආසනඝරය දුර්ලභ ගනයේ නිර්මාණයකි. විවිධ ගොඩනැගිලි වලට අයත් ගල්කණු, ස්තූප, පොකුණු ආදී නෂ්ටාවශේෂ ගැන සලකන කළ අතීතයේ ඉතා දියුණු බෞද්ධ ආරාමයක් මෙහිවූ බව පැහැදිලි වේ. කන්ද පුරාම විසිරී ඇති ලෙන් කර්මාන්තය විවිධාකාරය. සමහර ලෙන් ස්වාභාවික ඒවා වන අතර සමහරක් කෘත්‍රිම ඒවා වේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙහි තරමක් පරීක්ෂාකර ඇත. ලෙන් ලිපිද 14 ක් පිටපත් කර පළකර තිබේ. මෙහි දක්වනු ලබන්නේ පිටපත්කර නැති මවිසින් සොයාගත් ලිපි පමණි.

අම්පාර - මංගල ඔය පාරේ පියංගල අරණ්‍ය සේනාසනයට කි: මී: 1½ ක් පමණ දුරින් නැගෙනහිරි අතට ඇති ගුරුපාරේ කි: මී: 2 පමණ ගමන් කිරීමෙන් පුළුකුණාවට පැමිණීමට පුළුවන. දැනට මෙහි භික්ෂු නමක්ද නැවතී සිටිති.

1* **ශොණ ශමණිය ලෙණෙ.**

ශොණා ශ්‍රමණියගේ ලෙණ (පුදන ලදී.)

2* **(එකඋ) නර බණක බත ශොණහ ලෙණෙ. මනපදශන නමෙ.**

අංගුත්තර නිකාය භාණක ස්වාමි ශොණගේ ලෙණ මනාපදශීන නම් (පුදන ලදී.)

3* **උපශික රෙවය ලෙණෙ ශගශ.**

උපාසිකා රේවාගේ ලෙණ සංඝයාට (පුදන ලදී.)

## කොටවෙහෙර:

අම්පාර දිසාවේ ලාහුගල අසල යල් පොත වනගත ගමේ පිහිටි නටබුන් රසක් ඇති ස්ථානයකි. මෙහි විශාල ගිරි ලිපියක් මැකී ඇත. දිගටි විශාල පර්වතයේ පියගැට පෙළ අසල තනි පේළියට කොටා ඇති කෙටි ලිපිය මෙසේය.

**වව්ගමකශි තෙරස - - - - -**
වැව්ගමේ ස්ථවිරයන් වහන්සේගේ (පියගැට පෙළයි.)

## ශාස්ත්‍රවෙල:

අම්පාර **දිසාවේ පානම පත්තුවේ** පොතුවිල උපදිශාපති කොට්ඨාශයට **අයත් ශාස්ත්‍රවෙල** හැඩඔය මුවදොරට ආසන්නව පිහිටි දර්ශනීය තැනකි. **මෙහි බොහෝ නටබුන්** තිබේ. ස්තූප විවිධ ගොඩනැගිලි **වල ශෛෂ මුලු කන්ද පුරාම දක්නට** ලැබේ. මෙහි මුලින්ම පරීක්‍ෂණ කළ **සී. ඩබ්ලිව්.** නිකලස් මහතා පර්වත ලිපියක් පිටපත්කර JRAS (CB) **Vol. V** හි පළකර තිබේ. මෙහි බුදුලෙණ (මෙහි පිළිමය සහ චිත්‍ර **මුලුමනින්ම** විනාශ වී ඇත.) ඇතුළු ලෙන් ගණනාවක් ඇතත් එකම **ලෙන් ලිපියක් පමණක් ඇත.** මෙයද පරීක්‍ෂාකර නැත. මේ ලිපිය ක්‍රි:ව: 1 සියවසට පමණ අයත්වේ.

## පොතුවිල:

පානම මාර්ගයේ 7 කණුව අසලින් මුහුදු වෙරළ දක්වා වැටී ඇති ගුරුපාරේ කි: මී: 1 පමණ ගියපසු ශාස්ත්‍රවෙල විහාරය හමුවේ. මෙහි පැරණි නම මණිනාග පබ්පත බොධිගිරි විහාරය වේ. දැනට මෙහි ගරු කේ. සරණපාල හිමියෝ වැඩ සිටිති.

**1* බෙන පුත බුදරකිත තෙරහ නගය**
**ජනපදනික උපසික බගුය ලෙණෙ දෙව පුතහ**
**තිණ් බිතහ සපතිකහ චතුදිස ශගශ දිනෙ.**

බෙනගේ පුත්‍රයාවූ බුදුරක්‍ෂිත ස්ථවිරයන් වහන්සේගේ (ද)
නාගාගේ (ද) ජනපද නායිකා උපසිකාබගුගේ (ද) ලෙණය
දෙව පුත, තිණිබිත, සපතික යන අයගේ ලෙණ
සිවුදිග සංඝයාට දෙන ලදී.
අර්ථකථනය සැකසහිතයි.

## බුදුගල්ලෙණ:

බුදුගල්ලෙණ මොනරාගල දිසාවේ බුත්තල උප දිශාපති කොට්ඨාශයේ මැදගම ග්‍රාමසේවා වසමට අයත්ව පිහිටියේය. දුටුගැමුණු රජු අනුරාධපුරය ජය ගැනීමට මාගම සිට ගිය ගමන් මග ලෙස සැලකෙන බුත්තල කතරගම හරහා මාගමට වැටී ඇති පැරණි මාර්ගය දනට යන්තමින් ලකුණුකර ඇති අතර බුත්තල සිට කතරගම දක්වා වෙනම මාර්ගයක්ද එකී මාර්ගයට සමාන්තරසේ කපා තිබේ. මෙම මාර්ගයේ කන පෙතියන් ආර සෙව්වේ සිට එනම් 18 සැතපුම් කණුව පමණ සිට මාර්ගයට සමාන්තරසේ දකුණේ සිට උතුරට විහිදී දිගටි කඳු වැටියකි. මෙය ප්‍රදෙශවාසීන් විසින් හඳුන්වනු ලබන්නේ රහතන්කන්ද නමිනි. සද්ධාතිස්ස-ගැමුණු දෙකුමරුවන්ගේ සටනේදී දෙපිරිස වෙන්කිරීමට රහතුන් විසින් මවනලදැයි වංශකථා වල සඳහන් කන්ද මේ යයි සමහරු පවසති. උල්ගල හා බඹරකෝට්ට--හෙල නමින් උස් මුදුන් සහිත කොටස් දෙකක් මේ කන්ද සතුකර ගෙන සිටී. බුදුගල්ලෙණ පිහිටියේ මෙම කඳුවැටියේම උල්ගලට උතුරිනි.

ක්‍රි: පූ: යුගයේ ආරන්‍යසේනාසනයක්සේ ඇරඹී ඇති මෙහි කටාරම් කොටන ලද ලෙන් සියගණනක් දකිය හැකිය. මේ ලෙන් අතුරින් සමහරක් කටාරම් දක්වා පසින් වැසී තිබේ. මෙහි එක ලෙණක් බුදුමැදුරකි, එහි විශාල බුදු පිළිමය විනාශකර ඇත. ගොඩනැගිලි පහක පමණ ශෙෂ හා ගඩොළු දකින්නට ලැබේ. විහාර ලෙණ තුළ දමා තිබූ මෙරට කිරිගරුඬ ගලින් කරන ලද බෝසත් පිළිම හා බුදුපිළිම කීපයක්ද මෙහි දකින්නට ලැබිනි. මහායාන යන්ත්‍රයයි සැලකිය හැකි සටහන් සහිත ගඩොළු වර්තමාන පතිසංස්කරණ වැඩවලදී විනාශ වී ඇත. විශාල පියගැට පෙළක්ද වෙනත් විවිධ වර්ගයේ නටබුන් රැසක්ද මෙහි වේ. නාගරී අක්ෂර සහිත මැටිකැට කීපයක්ද මෙහි තිබී හමුවී ඇත. මෙම ස්ථානයේ පූර්ණ ගවේෂණයක් මේතාක්කර නැත.

විහාර ලෙණ වර්තමානයේ දර්ශනීය බුදුමැදුරක් බවට පත්කර තිබේ. ඝන වනයට බිලිව තිබූ බුදුගල්ලෙණ 1975 සිට ආරණ්‍යසේනාසනයක්සේ පවත්වාගෙන යනු ලැබේ. ලෙන් කීපයක් වර්තමාන කුටි බවට සකස්කර ඇති අතර පැරණි ගොඩනැගිලි ශෙෂ වෙනස්කර නවීකරණයට භාජනය කර තිබේ.

සමහරු මේ ස්ථානය කෝන්කැටි විහාරය නමින් හඳුන්වා ඇත. මෙහි ඇති අභිලෙඛන එකක් පමණක් CEYLON JOURNAL OF SCIENCE G. II කලාපයේ INSCRIPTION OF CEYLON Vol. I ග්‍රන්ථයේ අංක 711 ලෙසද පළකර තිබේ. එය විහාරලෙණේ ඇති

''ගපති කුණක තිශ පුත උපශක යහශිය ලෙණ'' යන්නවේ. මේ හැර මෙහි ලෙන් ලිපි රැසක් ඇත. විහාර ලෙණ අබියස ගෙවී යන ගිරිලිපියක්ද වේ. කන්දේ ඇති ලෙන් සමහරක තිබී මෙතෙක් පිටපත්කර නොතිබූ ලිපි මවිසින් පිටපත් කළ පරිදි මෙහි පළවේ.

බුත්තල කතරගම මාර්ගයේ වගුරුවෙල අසල සැ: 14 කණුව සමීපයෙන් හැරී කි. මී. 1 පමණ නැගෙනහිරි අතට ගමන් කිරීමෙන් මෙතැනට පැමිණීමට පුළුවන.

**1*** **ගපති වලක ශුමන පුත ශුමහ ලෙණෙ**
ගෘහපති වලක සුමනගේ පුත්‍රයාවූ සුම්මගේ ලෙණ (පුදනලදී.)

**2*** **බත ගුතශ.**
**බත තිශහ දුත ලෙණෙ.**
සවාමී ගුප්තගේ (ද) සවාමි තිෂ්‍යගේ (ද) දෙන ලද ලෙණයි.

**3*** **අය ගමකශි උපශක කුමරශ ලෙණෙ**
අයගමෙහි උපාසක කුමාරගේ ලෙණ (පුදන ලදී.)

**4*** **ගහපති ශුමන ඣිතය උපශික ශුමනය ලෙණෙ**
ගෘහපති සුමනගේ දියණියවූ උපාසිකා සුමනාගේ ලෙණ (පුදන ලදී.)

**5*** **ගපති ශෙට ශුමන හ ලෙණෙ චතුදිශ ශගශ දිනෙ**
ගෘහපති ශ්‍රෙෂ්ඨ (ශ්‍රෙෂ්ටී) සුමනගේ ලෙණ සිවුදිග සංඝයාට දෙනලදී.

**6*** **ගපති ශගු ඣිත උපශික රකි (ය ලෙ) ණෙ**
ගෘහපති ශප්තගේ දියණියවූ උපාසිකා රක්ඛාගේ ලෙණ (පුදන ලදී.)

**7*** **පරුමක කශබ පුත ශොණශ ලෙණෙ**
**අගත අනගත ශගශ (දිනෙ)**
ප්‍රමුඛ කාශ්‍යපගේ පුත්‍රයාවූ ශොණගේ ලෙණ පැමිණි - නොපැමිණි සංඝයාට (දෙනලදී.)

**8*** **ගපති + + ය + ග උපශික ශුමනය ලෙණෙ**
**ශගශ දිනෙ**
ගෘහපති + + ය + ග උපාසිකා සුමනාගේ ලෙණ සංඝයාට දෙන ලදී.

**9*  ගපති කණිය ගුත ලෙණෙ.**
ගෘහපති කණී ගුප්තගේ ලෙණ (පුදන ලදී.)

**10*  පරුමක මිත පුතහ පරුමක උතිය (ලෙණෙ.)**
ප්‍රමුඛ මිත්‍රගේ පුත්‍රයාවූ ප්‍රමුඛ උත්තියගේ (ලෙණ)
(පුදනලදී.)

**11*  ගපති ශගතශ හ ලෙණෙ.**
ගෘහපති සාගතගේ ලෙණ (පුදන ලදී.)

**12*  අශි ශුමිලුය ලෙණ ශගශ දිනෙ.**
ආයුෂ්මත් සුමිලාගේ ලෙණ සංඝයාට දෙනලදී.

**13*  ගපති තිශපුත උපශක + + හ + + ලෙණ.**
ගෘහපති තිෂ්‍යගේ පුත්‍රයාවූ උපාසක + + හ + + ලෙණ
(පුදන ලදී.)

බුදුගල්ලෙණට කි:මී: 2 දකුණින් වෙහෙරගල නමින් හැඳින්වෙන ගරා වැටුනු විශාල ස්තූපයක නටබුන් දක්නා ලැබේ. මේ කොටසේ බොහෝ පැරණිදේ තිබේ. වෙහෙරගලට යාර 30 ක් පමණ දකුණින් කඳු පාමුල සෙවිවේ කුඩා ලෙණක පහත සඳහන් ලිපිය කොටා ඇත.

**1*  ද + ම පුගියන ලෙණ.**
ද + ම වෙළඳ ශ්‍රේණියේ ලෙණ (පුදන ලදී.)

## වැලියාය:

මොනරාගල දිස්ත්‍රික්කයේ මොනරාගල නගරයට කි: මී: 5 පමණ දුරින් පිහිටි ස්ථානයකි. මෙය මොනරාගල කඳුවැටියටම සම්බන්ධවේ, තෙල කඳුවැටිය මුලුමනින්ම නටබුන් වලින් ගහණවේ. එසේ වතුදු මෙහි ගවේෂණකර නැති තරම්. මෙහි සියගණන් ගල්ලෙන්, බුදුමැදුරුවල ශෙෂ ගොඩනැගිලි, පියගැට පෙළවල් හා ස්තූප ශෙෂ නොයෙක් තැන දක්නට ලැබේ. මයුරගිරි රජමහා විහාරයද පිහිටියේ මේ කන්දේය. වැලියායේ අභිලේඛන කීපයක් සී. ඩබ්ලිව්. නිකලස් මහතා පිටපත්කර ඇත. මෙහි තවත් බොහෝ අභිලේඛන තිබිය හැකිය. මවිසින් සොයාගත් ලිපි පමණක් මෙහි දැක්වේ.

මොනරාගල – පොතුවිල මාර්ගයේ කි: මී: 5 පමණ දුරගිය පසු හමුවන මො/ සිරි පියරතන පිරිවෙණ අසළ බෝක්කුව ලඟින් ඇති අඩි පාරේ මද දුරක් යාමෙන් ලෙන් පිහිටි කොටසට යා හැකිවේ. මෙහි දැනට මදූනාගල ආරණ්‍යයට සම්බන්ධ භික්ෂූහු වැඩ සිටිති.

**1*** **පුශගුත ථෙරෙන මපිතෙ ලෙණෙ ධශ දිශ ශ ශගශ පරිබොගශෙ ධිනෙ.**
පුෂ්‍යගුප්ත ස්ථවිරයන් වහන්සේ විසින් (නි) —
මවන ලද ලෙණ දස දිසායෙහි සංඝයාගේ
පරිභොගය පිණිස දෙන ලදි.

**2*** **බත දිනශ ලෙණෙ චතු දිශ ශගශ.**
ස්වාමි දින්නගේ ලෙණ සිව්දිග සංඝයාට (පුදන ලදී.)

**3*** **අගිදෙව පුත උපශක ශුමනහ ලෙණෙ ශගශ.**
අග්නිදෙවගේ පුත්‍රයා වූ උපාසක සුමනගේ ලෙණ
සංඝයාට (පුදනලදී.)

**4*** **බත නගලිය ලෙණෙ ශගශ දිනෙ**
ස්වාමී ලාංගලීගේ ලෙණ සංඝයාට දෙන ලදී.

**5*** **නශ තෙරෙන කරපිතෙ චතුදිශ ශගශ ලෙණෙ**
නාග ස්ථවිරයන් වහන්සේ විසින් කරවන ලද ලෙණ
සිවුදිග සංඝයාට (පුදන ලදී.)

**6*** **මේ ලිපිය කටාරම දක්වා පසින් වැසී තිබූ ලෙණක තිබුනකී. මෙහි මුල් අක්ෂර තුනක් අපැහැදිලිය.**

**+ + + චමර පුත අය අබයෙන කරපිතෙ ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ**
+ + + චමරගේ පුත්‍රයාවූ අබය කුමරු විසින් කරවන ලද
ලෙණ පැමිණි නොපැමිණි සිවුදිග සංඝයාට (පුදනලදී.)

මේ ලිපි සමහරක අනවශ්‍ය ලෙස මහා ප්‍රාණාක්ෂර යොද තිබේ.

## බුදුපැටුන්කන්ද:

මොනරාගල දිසාවේ සියඹලාන්දුව උපදිසාපති කොට්ඨාශයට අයත් මහ කලුගොල්ලෙන් කි: මී: 3 පමණ දුරින් ගත වනයේ පිහිටි නටබුන් තැනකි. මෙහි පියගැටපෙළවල්, ගොඩනැගිලිවල ගල්කණු, ස්තූපයක ගඩොළු දක්නට ලැබේ. ළඟ ඇති ලෙන් දෙකක කටාරම් කොටා ඇතත් ලිපි ඇත්තේ එකකය. එය කටාරමට ඉහළින් කොටා ඇත. මේ ස්ථානය කිසිවකු පරීක්ෂාකර නැත. මවිසින් සොයාගත් ලිපිය පහත සඳහන් වේ.

මොනරාගල - පොතුවිල මාර්ගයේ 18 කණුව අසල සිට හැඩඔය ව්‍යාපාරයට වැටී ඇති ගුරුපාරේ මදක් දුරගොස් දකුණට හැරී ගත වනයේ කි: මී: 2½ පමණ යාමෙන් මෙහි ළඟා විය හැකිය.

**1*  රඣ උනි පුත අබය අශහ ඣිග දෙවිතිශය ලෙණෙ.**

උත්තිය රජුගේ පුත්‍රයාවූ අභය කුමාරයාගේ දියණිය වූ දෙවිතිෂ්‍යාගේ ලෙණ (පුදන ලදී)

## ඕළුවා පොකුණ කන්ද:

මොනරාගල දිසාවේ සියඹලාන්දූව උපදිසාපති කොට්ඨාශයේ මහකලු ගොල්ලෙන් කි:මී: 4 පමණ දුරින් පිහිටි ගල්තලා සහිත ස්ථානයකි. මෙහිද ස්තූප කීපයක ශෙෂ පියගැට, ආදිය දක්නට ලැබේ. ලෙන් කීපයක් ඇතද ලිපි ඇත්තේ ඉන් එකක පමණි. එය ඡත්‍ර ලෙණකි. මෙහිද කිසි පරීක්ෂණයක් කර නැත ලිපියේ අකුරු ඉතා අපැහැදිලිය.

**1*  ගමික ශබනි තරනහ ලෙණෙ**

ගම්පති ශබනි තරනගේ ලෙණ (පුදන ලදී.)

## රහත්කන්ද:

මොනරාගල දිසාවේ බුත්තල නගරයට කි: මී: $1\frac{1}{2}$ පමණ දුරින් පිහිටි ගල්ලෙන් සහිත ස්ථානයකි. බෙරගල සිට මොනරාගල බලා ගමන් කරන කෙනෙකුට බුත්තල නගරයට එපිටින් දුරදීම පෙනෙන කඳු වැටියක් වේ. මෙය හැඳින්වෙනුයේ රහත්කන්ද නමිනි. ගල්ලෙන්, ස්තූපවල නටබුන් කන්දේ තැන තැන ඇත. කටාරම් කොටන ලද ලෙන් දෙකක එකම ලිපිය කොටා තිබේ.

බුත්තල - මොනරාගල මාර්ගයේ බුත්තල නගරයට කි:මී: $1\frac{1}{2}$ පමණ දුරින් වූ නාමණ්ඩියෙන් වැටී ඇති ගුරුපාරේ කි: මී: 1 පමණ ගමන් කිරීමෙන් ආරණ්‍ය සේනාසනය පිහිටි තැනට පැමිණිය හැකිය. දනට මෙහි වතුරුවිල ගාබාවට සම්බන්ධ භික්ෂූන් වහන්සේලා වැඩ සිටිති.

**1*  මහ තිශහ ලෙණෙ.**

**2*  මහතිශගහ ලෙණෙ.**

මහා තිෂ්‍යගේ ලෙණ (පුදනලදී.)

## බුජ්ජම:

මොනරාගල දිශාවට අයත් බුජ්ජම රජමහා විහාරය වැදගත් ස්ථානයකි. බුඩගාම බුජ්ජම වූසේ පෙනේ. මෙහි ලෙන් කීපයක් හා

වෙනත් නෂ්ටාවශෙෂ තැන තැන දක්නට ලැබේ. ගවේෂණ කර නැති නිසාත් බොහො දේ යටවී ඇතැයි කිවහැකි නිසාත් මෙහි තොරතුරු අනාවරණය වී නැත. අම්පාර සියඹලාන්දූව පාරේ 9 වන කණුව අසල පල්ලෙවෙලින් දකුණට කි: මී: 4 පමණ ගියපසු මෙතැනට පැමිණිය හැකිය. මෙහි තිබී ලෙන්ලිපි 3 ක් හමුවිය. මෙහි ලිපිදෙකක් පරණවිතාන මහතාගේ ග්‍රන්ථයේ පළකර ඇත. මා සොයාගත් ලිපිය පහත පළවේ.

**3* අශ ශිවශ ලෙණෙ.**
ආයුෂ්මත් සිවගේ ලෙණ (පුදන ලදී.)

## හුණුවල විහාරය:

කැගලු දිසාවට අයත් හුණුවල ගල්ලෙන් විහාරය වැදගත් තැනකි. එච්. සී. පී. බෙල් මහතාගේ කැගලු වාර්තාවේ හා CJS. G. II ග්‍රන්ථයේ ද INSCRIPTION OF CEYLON Vol. I. ග්‍රන්ථයේ අංක 700 හැටියටද මෙහි ලිපියක් පළකර තිබේ. එය බුදුමැදුර ඇති ලෙණේ ලිපියේ කොටසකි. බිත්තියට වැසීම නිසා ඉතිරි කොටස ගැනීම අපහසුවන්නට ඇත. විහාර ලෙණ අසල රබර්වත්තේ ලෙන් කීපයකි. මේවාද කටාරම් කොටා ඇත. එයින් එකක තිබී කෙටි ලිපියක් මට හමුවිය.

අඹේපුස්ස - කුරුණෑගල මාර්ගයේ නාත්ගල්ල හන්දියේ සිට වැටී ඇති ගුරුපාරේ කි: මී: 1 පමණ ගිය පසු මෙහි පැමිණීමට පුළුවන.

**1* ගමික (අ) ශලිය ලෙණෙ.**
ගම්පති (අ) සේලගේ ලෙණ (පුදන ලදී.)

## දනගිරිගල:

කැගලු දිසාවේ මාවනැල්ල නගරයේ සිට කි:මී: කීපයක් දුරින් පිහිටි දනගිරිගල විශාල ගල්තලාවක් ඇසුරුකර පිහිටි ලෙන් විහාරයකි. මෙය මෑත යුගයේ ප්‍රතිසංස්කරණය කරන ලද්දේ ලෙව්කේරාල විසිනි. ලෙන් විහාරයේ වටිනා චිත්‍ර හා ප්‍රතිමා විනාශ වෙමින් පවතී. මෙහි ඇති එක ලිපියක් INSCRIPTION OF CEYLON Vol. I ග්‍රන්ථයේ අංක 708 යටතේ පළකර තිබේ. මේ ලිපිය පිහිටියේ බුදුලෙණේය. එය අද හොඳටම මැකී ඇත. එච්. සී. පී. බෙල් මහතාගේ කැගලු වාර්තාවේ මේ ලිපිය පළකර නැත. බුදුලෙණ ළඟින් පර්වතයට නැග එහි දකුණු පැත්තේ බැවුමට යාමට හැකිවේ. මෙහි කටාරම් කෙටූ ලෙන් දෙකක් මට හමුවිය. එයින් එකක් තරමක් විශාලවේ. එහි ලිපිය කිසිවකු දැක නැත.

මාවනැල්ල - ගල් අතර, මාගීයේ පාවටගොඩ හන්දියෙන් වැටී ඇති අඩිපාරේ කි:මී: 1 ක් පමණ ගියපසු දනගිරිගල හමුවේ,

**1*** **පරුමක නදක ලෙණෙ.**
ප්‍රමුඛ නන්දකගේ ලෙණ (පුදන ලදී.)

## කන්ජිකුඩි ආරු:

මඩකලපුව දිසාවේ පිහිටි කන්ජිකුඩිආරු පැරණි නටබුන් ගැවසුණු ස්ථානයකි. මෙහි නටබුන් බොහෝ ඉක්මනට විනාශවී යා හැකි ලකුණු පහලවී තිබේ. මඩකලපුව පොතුවිල් පාරේ 218 කණුවෙන් හැරී රූපස් කුලමට යන පාරේ කි:මී: 4 පමණ ගොස් වම් අතට ඇතිපාරේ නැවත කි:මී: 5 ක් පමණ ගියපසු කන්ජිකුඩි ආරු හරස්කර කරනලද වැව හමුවේ. තෙල වැව අසල ලෙන් ගණනාවකි. වෙනත් නටබුන් ද තැන තැන දක්නට ලැබේ. මෙහි ලෙන් ලිපි දෙකක් පමණක් ගැනීමට හැකිවිය.

**1*** **පරුමක වශබ පුත වශ + + + +**
ප්‍රමුඛ වසභගේ පුත්‍රයාවූ වස: . .

**2*** **පරුමක පුනශ ගුත පුත මහතිශහ ලෙණෙ**
ප්‍රමුඛ පුනස ගුප්තගේ පුත්‍රයා වූ මහා තිෂ්‍යගේ ලෙණ (පුදන ලදී.)

## ආඩියාකන්ද: (රිටිගල)

අනුරාධපුර දිසාවේ කැකිරාව උප දිශාපති කොට්ඨාශයට අයත් රිටිගල කන්දේ එක කොටසක් ආඩියාකන්ද නමින් හැඳින්වේ. මෙහි ලෙන් විශාල සංඛ්‍යාවක් ඇත. මේවායේ විවිධ අභිලේඛන පිහිටුවා තිබේ. මින් බොහෙවක් පිටපත්කර පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් පළකර තිබේ. ඒවා ප්‍රසිද්ධය. මෙහි දක්වන්නේ ඒවාට අයත් නොවන මවිසින් සොයාගත් ලිපියකි. මේ ලිපිය තිබූ ලෙණට 1895 වන්නිහාමී නමැත්තෙක් පැමිණ නම ලියා ඇත.

කැකිරාව සිට ගනේවල්පොල හරහා – හබරණ යන මාගීයේ ගලපිටගල හන්දියේ සිට වැටී ඇති කරත්ත පාරේ කි: මී: $\frac{1}{2}$ පමණ ගොස් ගලපිටගල වැව අසලින් ඇති අඩිපාරේ කි: මී: $3\frac{1}{2}$ පමණ ගමන් කිරීමෙන් තෙල අරණට පැමිණිය හැකිය.

**1* බත ශුමන ගුතහ ලෙණෙ.**

සවාමි සුමන ගුප්තගේ ලෙණ (පුදන ලදී.)

මේ ලිපිය දකුණේ සිට වමට කියැවෙනසේ ලියා ඇත.

## සංවැල්ල රජමහා විහාරය:

කුරුණෑගල දිසාවේ කුඩාගල්ගමුව අසල පිහිටි සංවැල්ල රජමහා විහාරය අතීතයේ ඉතා දියුණුව පැවති පූජනීය සථානයකි. ප්‍රසිඩ යක්දෙස්සාගල පාමුල මෙය පිහිටියේය. මෙහි තනිව පිහිටි පර්වතය වටාම කටාරම් කොටන ලද ලෙණකි. මෙහි නුවර යුගයේ කරවනලද බුදුමැදුරක් වේ. ගල්කණු ආදී පැරණි ශෙෂයන් බොහෝ දක්නට ඇත. කෙටි ටැම් ලිපියක්ද, කැබලි වලට කැඩුණු ටැම්ලිපියක කොටස්ද මෙහි ඇත්තේය. බුදු මැදුර පිහිටි ලෙණේ පිහිටුවා ඇති ලිපිය අඩු පාඩු සහිත වූවකි. මෙය පරීක්‍ෂාකර නැත. මේ අසල කන්දපාමුල ලෙණකද පශ්වාත් බ්‍රාහ්මී ලිපියක් තිබේ.

කුරුණෑගල - පුත්තලම පාරේ තිත්ත වැල්ල හන්දියෙන් ගෝණගම දක්වා වැටී ඇති මාර්ගයේ කි: මී: 8 පමණ ගිය පසු මේ සථානයට පැමිණිය හැකිය. දැනට මෙහි විහාරාධිපති පදවිය දරනු ලබන්නේ අතිගරු ශ්‍රී සුමංගල බුඩ රක්ඛිතාභිධාන නාපාවල සොරත නායක සවාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

**1* ගිරිකුචි බොඩික + + + + + කව + +**

අර්ථයක් පැහැදිලිව ගැනීම අපහසුය.

## බලන්ගොඩ:

බලන්ගොඩ හා රක්වාන ආසන වලට අයත් අභිලෙඛන ඇති කොටස රත්නපුර දිසාවේ බලංගොඩ, හා වැලිගෙපල උපදිශාපති කොට්ඨාශ දෙකට අයත්වේ. මේ ලිපි පිහිටි ප්‍රදෙශය ක්‍රමානුකූල ගවේශණයකට කිසිදිනෙක භාජනයකර නැත, මෙහි හඳගිරිය කොටසේ ක්‍රි: පූර්ව යුගයේ ආයර්‍ය ජනාවාශයක් ඇසුරෙන් පැන නැගුණු රාජධානියක් තිබූ බවටද සාධක පෙනේ. කල්තොට කොටස මධ්‍යතන යුගයේ ඉතා දියුණුව තිබිනි. මෙතෙක් පිටපත්කර නැති අභිලෙඛන පිහිටි සථාන විස්තරද සමග පහතින් පළවේ.

## මොලමුරේ - දෙහිපිටිය:

බළංගොඩ කල්තොට මාගීයේ කණුව අසල මොලමුරේ විදුහල අසලින් ගලන මොලමුරේ ආර දිගේ කි:මී: $2\frac{1}{2}$ පමණ ඉහලට ගමන් කළ පසු හමුවන විශාල ගල්තලයක බෑවුමෙ පිහිටි ලෙණකි. ලෙණට ඉහතින් පුරන්ව ගිය කුඹුරු හා කුඩා වැවක ශෙෂ දක්නට ලැබේ. දැනට ගල්ලෙණ අකුරු කෙටූ ගල්ගේ නමින් හැඳින්වේ. ලිපිය අග කොටස පතුරු ගැලවී විනාශව ඇත.

**1*** **ගමික වශ පුතන ගමික වල පුතන වහය**
**+ + හ + + + + + + + + + +**
**ග + + + උග + + + + ශ + + ය ශත + + +**
ගම්පති වෛශ්‍යගේ පුත්‍රයන්ගේද ගම්පති ව්‍යාලගේද
වහය— —හ— — — — — — — — — —ග
— — —උග— —ශ— —යශක— — —
තේරුමක් ගැනීම අපහසුය.

## සටිමල්කඩුව:

හඳගිරිය - වැලිගෙපොල පාරේ කටුපත්ඔය අසල පිහිටි කුඩා කඳු ගැටයක ලෙන් කීපයක් වේ. මෙය අබියස ගරා වැටුණු ස්තූප දෙකක ශෙෂද ඇත. ලෙන් දෙකින් එක ලෙණක ලිපියක් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් ප්‍රකාශකර තිබේ. අනෙක් ලිපිය මෙසේය.

**1*** **+ + + + චද දෙවශ පුත පරුමක නුගු දනෙ ශශශ.**
— — — —චද දෙවගේ පුත්‍රයාවූ ප්‍රමුඛ න්‍යග්‍රොධ ගේ දනය (ලෙණ) සංඝයාට (පුදන ලදී.)

## සොණගල්ගේ:

කල්තොට - දියවින්න මාගීයේ බුදුගල විහාරයට කි:මී: 1 ක් දුරින් මග අසල පිහිටි ලෙන් කීපයකි. මින් එක ලිපියක් බුදුගල ලිපි ලෙස සී. එච්. කොලින්ස් මහතාද, කූරගල ලිපි ලෙස එස්. පරණවිතාන මහතාද දක්වා ඇත. අනෙක් ලිපිය පිහිටි ලෙණේ පැරණි ගඩොළු අත්තිවාරම දැනටද ශෙෂව තිබේ. ලිපිය මෙසේය.

**1*** **බත ශොණහ.**
සවාමි ශොණගේ (ලෙණ පුදන ලදී.)

## ඉඳුරුගහයාය:

කල්තොට - දියවින්න මාර්ගයේ දියවින්නට කි: මී: දෙකක් පමණ මොබින් මහමගට පෙනෙන දකුම්කලු ලෙන් කීපයකි. දැනට මෙහි එක ලෙණක බුදුමැදුරක් තනවා ඇත. මෙහි පැරණි ගඩොළු හා පිළිමයක පාද ආසනයක් දක්නා ලැබේ. ලෙන් තුනක අභිලේඛන ඇත.

1* **පරුමක රොණ ඝිතය පරුමක ශුදෙව ඣය පරුමකලු රොණිය ලෙණෙ මහශුදශන නමෙ චතුදිශ ශගශ**

ප්‍රමුඛ රෝහණගේ දියණියවූද, ප්‍රමුඛ ශුදෙවගේ භාර්යාවවූද ප්‍රමුඛ රෝහිණීගේ මහා සුදර්ශන නම්වූ ලෙණ සිවුදිග සංඝයාට (දෙන ලදී.)

2* **ගමික බ+ + + + තිශහ ලෙණෙ.**

ගම්පති බ+ + + + තිෂ්‍යගේ ලෙණ (පුදන ලදී)

3* **පරුමක ශොම දෙවහ ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ දිනෙ මනොරමෙ.**

ප්‍රමුඛ සෝමදේවගේ ලෙණ පැමිණි - නොපැමිණි සිවුදිග සංඝයාට දෙන ලදී. මනොරම්‍ය ලෙණයි

## කිරිමකුල්ගොල්ල:

කල්තොට - දියවින්න මාර්ගයේ කල්තොටට කි: මී: 10 පමණ දකුණින් පිහිටි බොහෝ නටබුන් ඇති තැනකි. මෙහි සටාරම් කෙටූ ලෙන් රැසක් ඇත. ඉන් කීපයක අභිලේඛන පිහිටුවා තිබේ. මෙයින් ලිපි දෙකක් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් කියවා ඇතත් ඒවායේ අඩු පාඩු තිබේ. මවිසින් ගත් පිටපත් අනුව ලිපි මෙසේ කියැවේ.

1* **තිශරකිත තෙරහ මහලෙණෙ අපරිමිත ලොක දතුයෙ අගත අනගත චතුදිශ ශගශ.**

තිෂ්‍ය රක්‍ෂිත ස්ථවිරයන් වහන්සේගේ මහලෙණ අප්‍රමාණ ලොකධාතුවෙහි පැමිණි නොපැමිණි සිවුදිග සංඝයාට (පුදන ලදී.)

2* **ගපති කශබ (හ)**

ගෘහපති කාශ්‍යපගේ (ලෙණ පුදන ලදී.)

**3* අයතිශ පුත අය කොරශ පුතශ අය**
**මහ ශිවශ ලෙණෙ ශුපදිටෙ චතුදිශ ශගශ**

තිෂ්‍ය කුමාරයාගේ පුත්‍රයාවූ, කිර කුමාරයාගේ පුත්‍රයාවූ
මහාසිව කුමාරයාගේ සුප්‍රදිෂ්ට ලෙණ
සිවුදිග සංඝයාට (පුදන ලදී.)

මෙහි පරණවිතාන් මහතා කියවා ඇති ලිපියේ සඳහන් උපශොණ වැවේ අයිතිකරුවන තෙර කුමරුගේ පියා ගැන සඳහන්ව නැත. මා සොයාගත් ලිපිය අනුව ඔහුගේ පියා අයතිශ නම් වේ. මේ ලිපිය බොහෝ වැදගත් වේ.

## හබුතගල විහාරය:

**පිහිටීම:—**

නැගෙනහිර පළාතේ අම්පාර දිසාවේ පානම පත්තුවට අයත් හුලංනූගේ වසමේ පිහිටි කරඳහෙල කඳුගැටය මුහුදු මට්ටමින් අඩි 633 ක් උස්වේ. එයට දකුණු පසින් ඉඹිලන් ආරද නැගෙනහිරට බර ඊශාන දිගින් කරඳ ඔයද ගලා බසී. බටහිරින් හා උතුරින් ඝන වනයෙන් ගැවසියේය. දකුණින් කන්දට මදක් ආසන්න වනසේ කරඳහෙල වැව පිහිටි අතර කඳු ගැටිය වටා අබලන් වූ වැව් ගණනාවක්ම පිහිටියේය. දිගටි හැඩය ගත්තා කරඳහෙල කන්දද ප්‍රදේශයේ සෙසු කඳු මෙන්ම පොළොවෙන් එකවිට නැගී සිටුනා ආකාරය පෙන්නුම් කරයි. කන්ද පාමුළ මෑත භාගයක පදිංචි වූ පවුල් කීපයක් හැරෙනවිට සැතපුමක් පමණ දුරට ජනතාවගේ ගැවසීමෙක් හමුනොවේ. පාලු වනගත බියකරු පෙනුමක් දක්වන මුළු කඳු ගැටියම රුදුරු වල සතුන්ගේ නිවහනක්ව ඇත්තේය. පර්වත තල කීපයකින් හා අතරින් පතර දක්නට ලැබෙන බිහිසුණු බෑවුම් ද සහිත කන්දට පහසුවෙන් පිවිසීමට හැකි නොවේ.

දකුණු පස සිට උතුරට නැගෙනසේ පිහිටි හෙයින් කඳු මුදුනට පිවිසීමේදී දකුණේ සිට උතුරට ගමන් කිරීම පහසුවේ. කන්ද වටා හේන් කොටා පුරන්වූ පාමුළ පෙදෙසේ වැඩුනු ලඳු වැවිල්ල මූලික බාධකයක් වුවද වනය තුළට පිවිසි පසු මනා සිසිලෙන් ගත සිත සනහමින් වැඩි විඩාවක් නොමැතිව මුලු කඳුවැටියේම ඇවිදීමට හැකි, වන සතුන් විසින් නිමහම් කරනලද මාර්ගයෝ කොතෙකුත් ඇත්තාහ. එහෙත් අඳුරු ගුහාවල නිසංසලේ වැතිරී සිටිය හැකි අපා දෙපා සිවුපා සතුන් අප ගැන නොදන්නා හෙයින් උන්ගෙන් වන ගැහැට කොයි මොහොතේ කඩා වැටිය හැකිදැයි කීම අපහසුය. මෛත්‍රී සහගත සිතින් ගමන් කිරීමෙන් මේ සියල්ල වලකා ගත හැකි හෙයින් දහම්හී හැසිරෙන්නා දහමින් රැකේ යන බුදු වදන සියක් වරකටද වඩා වනගත හැසිරීම් වලදී මා පසක් කර ඇති බැවින් එය දිව ඕතුරක් බව පමණක් මට සහතික කළ හැකිය.

**ගමන් මග:—**

මොණරාගල පොතුවිල් මාර්ගයේ 13 කණුව අසළ හුලංනුගේ හන්දියේසිට බක්මීටියාව, මිරහල දක්වා වැටී ඇති කරත්ත පාරේ සැතපුම් එකහමාරක් පමණ ගොස් දූන්ට අස්සැද්දෙන වෙල්යායේ කෙළවරින් බටහිරට හැරී ලඳු කැලය අතරින් සැතපුම් භාගයක් පමණ ගමන් කිරීමෙන් කරඳහෙල කන්ද පාමුළට පැමිණිය හැකිය. තෙල කී කරත්ත පාරේ වාහනයක් ගමන් කළ හැක්කේ ටික දුරක් වුවද නියං සමයෙක පමණි. වර්ෂාවත් සමග මඩ ගොහොරුවක් බවට පත්වන බැවින් පයින් වුවද මෙහි යාම වැහි කාලයට අපහසුය. මෙම මාර්ගය ඇතිවූයේ 1936 න් පසුව බව කියති. ඊට පෙර මෙහි අඩි පාරක් වශයෙන් පැවතියේය. බක්මීටියාවට යාමට පෙර හමුවන කීතාන ගමේ මිනිස්සු ලුණු මිරිස් ගෙන ඒමට පොතුවිල් නගරයට ගියාහු මෙම අඩිපාරෙන් ජීවිතයද පරදුවට තබමින් වෙති. මුල් කාලයේ මෙහි වැදි ජනතාවක් පදිංචිව සිටියේය. වලස් විමානයක් ලෙස හැඳින්වෙන කරඳහෙලට එද මිනිස්සු නොගියහ. මහ හුලංනුගේ සිටි වැදි ජනයා ක්‍රමයෙන් අවුත් වර්තමාන හුලංනුගේ පදිංචි විය. එහිදී ඔවුන් අභාවයට ගියෙන් වර්තමානිකයෝ විවිධ පෙදෙස් වලින් පැමිණ පදිංචිවූ මිනිසුන්ගෙන් පැවත එන්නෝ වෙති. වැදි ජනයාගේ තරා තිරම ගැන අදද මෙහි පැරණිම ජනයා අතර විවිධ කථා ඇත. පැදුරු කබල්වල ඔතා මිනී වළලැම, මිනිසකු පණ අදින මොහොතේ ගෙයින් පිටත මැස්සක් ගසා එහි තැබීම, වැනි සිරිත් විරිත් මෙන්ම පොල්ගස කපා කුරුම්බා බීම වැනි හාස්‍යජනක සිද්ධි මේ අතරට එක්වී තිබේ. මෙහි සිටින පැරණිම තැනැත්තාවන කොන්ඩදෙනිය මුදියන්සේලාගේ අප්පුහාමි විදන මහතා පවසන අන්දමට කරඳහෙලට ආසන්නව පිහිටි කීතාන ගමේ එවක සිට ඇත්තේ පවුල් දහයකි. වර්තමාන හුලංනුගේ ජනපදය පිහිටුවූයේ 1943 දීය. ගැමි කාලයේ කඩ කීපයක් සමූපකාර ඒකකයක් හා කණිෂ්ඨ විද්‍යාලයයක්, හැරෙන විට මෙහි වෙනත් දියුණුවක් තවම දක්නට නොලැබේ. 1965 වර්ෂයේ මා එහි යනවිට තිබුණු තත්වයට වඩා කිසිදු වෙනසක් හෝ දියුණුවක් මෙම දහසය වසරටම ලබා නොතිබීම පුදුම සහගතවේ.

**වර්තමාන තත්වය:—**

අතීතයේ ඉතා උසස් මට්ටමේ පූජනීය ස්ථානයක් වූ කරඳහෙල කාලයාගේ පහරින් විනාශ වෙමින් ජනශූන්‍යව ගියෙන් පාලුවී ඝන වනයට බිලිවිය. හුලංනුගේ ජනපදය බිහි වීමෙන් පසුවත් මෙහි යාමට මිනිසුන් බියවූයේ එය වලස් විමානයකැයි පිළිගෙන තිබුනු නිසාය. 1948 දී පමණ භික්ෂුන් වහන්සේ නමක් පැමිණ කුඩා කුටියක් තනාගෙන මෙහි පදිංචි වූයෙන් නැවතත් මිනිසුන් එහි යන්නට එන්නට පටන්ගත් නමුත් වැඩිකල් නොගොස් එයද අභාවයට ගියේය. මේහි දියුණුව සඳහා උදව්වක් ගත යුත්තේ අප්පුහාමි විදන මහතා කියන හැටියට 'අමරින්දන් ගන්නා වගේ'ය.

'අමරින්දන් ගැනීම' යනු බලෙන් වදෙන් පොරෙන් ගැනීම අරුත්හි මෙහි ව්‍යවහාර වන වචනයකි. ඒ නිසා මෙම ස්ථානය නැවතත් වල් බිහි විය. ඉන්පසු වරින්වර භික්ෂූන් වහන්සේලා කීප නමක් සුලු සුලු කාලය බැගින් විසූ නමුත් ස්ථිර වාසයක් නොවීය: මෙයට ප්‍රධාන හේතුව ප්‍රත්‍යය පහසුව නැති වීමයි. දිළිඳුබවේ පත්ල සිපගත් ජනතාවක් මෙම පෙදෙසේ වෙසෙයි. ඔවුනට කිසිදු රැකියාවක් ස්ථිර ආදායම් මාර්ගයක් නැත. කරන ගොවිතැනද සඵල වීමට වඩා විඵලවේ. විහාරස්ථානයක් දියුණුකිරීම තබා නඩත්තු කිරීමටද ඔවුනට හැකියාවක් නැත. තෙල කී ප්‍රශ්න මේ නිසාම මතුවී ඇති බව පෙනේ. එහෙත් උදව්කළ නොහැකි නම් විරුඬකම් නොකර සිටීමද ඉතා උතුම් උදව්වක් බව අවට සම්භරුනට තේරුම් නොයාම ඔවුනගේ පමණක් නොව ජාතියේම අභාග්‍යයක් බව මේ ස්ථානයට ඇති බාධක ගැන දැනගත් නිසා කියයුතුවේ.

1972 ජූලි මාසයේ මාතර අකුරැස්සේ දියලපේ ඉන්දානන්ද ස්වාමීන් වහන්සේ මෙහි වැඩ කඳු පාමුළ කුටියක් තනාගෙන පදිංචි වූහ, එම කුටිය ගරා වැටුනෙන් වර්තමාන බුදු ලෙණට දකුණින් පහළ කොටසේ පිහිටි කුඩා ලෙණක ඇඳක් තබා ගෙන ඉතා දුකසේ අදද වැඩ සිටිති. අව්වෙන් වැස්සෙන් සුළඟින් මෙන්ම ඇතැම් මිනිස් ගුණමකුවන්ගෙන්ද අපමණ හිරිහැර විඳිමින් මෙම ස්ථානයේ උන්වහන්සේගේ වාසය පුදුම වීරක්‍රියාවකි. හරිහැටි ආහාරයක් නැත. කහට තේ කෝප්පය පවා සමහර විට පොල් කැල්ලක් හපමින් වැළඳිය යුතුය. ආගන්තුක හිමිනමක් පැමිණියහොත් විහාර ලෙණේ වැලිගොඩේ පැදුරු කඩමාල්ලක් එලා හිඳියයුතුය. මේවාගේ දහසක් දුක්විඳිමින් මෙම ස්වාමීන්වහන්සේ මෙම ස්ථානය රැක ගැනීමට ගන්නා ප්‍රයත්නයට මුලු ජාතියම ණයගැති බව අවංකවම කිවයුතුවේ.

එසේ වුවද දැනට මෙහි බුදු ලෙණේ මිදුල එළි කිරීමට වඩා ක්‍රියාවක් කිරීමට උන්වහන්සේට ශක්තියක් ලැබී නැත. වයස අවුරුදු 66 ක් වන උන්වහන්සේට මෙහි දියුණු කිරීමට දැඩි අධිෂ්ඨාන ශක්තිය මිස කායික ශක්තියක් නොමැති බව හැඟෙන මට නම් උන්වහන්සේ විඳින දුක සියසින් දුටු නිසාම දෑසට නැගෙන කඳුළු බිඳු නවතාගත නොහැකි බව අවංක වේදනාවකින් ලියා තැබිය යුතුම වේ.

**නාමය:—**

මෙහි ඇති අභිලේඛන සාධක අනුව හබුතගල විහාරය නමද, සාමාන්‍ය ව්‍යවහාරයේ කරඳේ විහාරය නමද තවත් විටෙක කරඳ හෙල විහාරය නමද යෙදේ. කඳුවැටිය කරඳ හෙල නාමද ව්‍යවහාර කෙරේ. මෙයට නුදුරින් කරඳහෙල ඔය ගලාබසී. ගොවින්ද පබ්බතයෙන් ගලන ගොවිඳු ඔය මැද කොටස කරඳඔය නමින්ද පහළ කොටස රොට ආර කිරිමැටි ආර ආදී ලෙසින් කොටස් බෙදෙතත් අවසන දක්වාම කරඳ ඔය නම රැකගනී. කරඳ නම ඇතිවීමට තුඩුදුන් හේතු කිසිවක් මට දැන ගැනීමට නොහැකි විය.

**පරීක්ෂණ:—**

කරඳහෙල කඳුගැටය පුරාවස්තු වලින් පිරී ඇති තැනකි. මෙහි පළමුවෙන්ම ගවේෂණයක් කර ඇත්තේ සී. ඩබ්ලිව්. නිකලස් මහතාය. එතුමාද මෙහි මුලුමනින්ම ගවේෂණය නොකළ බව ඔහුගේ වාර්තාවෙන් පෙනේ. එහෙත් කොටසක් නමුත් ගවේෂණයකර මෙහි ලිපි කීපයක්ද සමග තොරතුරු එළිදරව් කිරීමේ ප්‍රථම ගෞරවය ඒ මහතාට හිමිවිය යුතුවේ.

ඉන්පසු එක්තරා පුවත්පතක ලිපියක් පළවී තිබෙනු දුටුවෙමු. එම ලේඛකයා කරඳහෙලට තබා හුලංනුගේට වත් ගොස් නැතිබව ලිපියෙන්ම පැහැදිලිව පෙනිනි. කවුරුවත් සොයාගත්දේ ඒ මේ අතට පෙරලනු විනා අංඅලුතින් යමක් ගැන ගවේෂණය කිරීමට උගතුන්ගේ උනන්දුවක් නැත. ඊටත් වඩා සංවේගදායක වනුයේ මහන්සිවී වියදම් දරා දුක්විඳ ගවේෂණයන් කරන්නන්ට වඩා අනුන්ගේ දේ සොරාගෙන තමාගේ දේ මෙන් හුවා දක්වන හොරුන්ට සමාජයේ ප්‍රමුඛ තැන හැම අතින්ම හිමිවීමයි.

කෙසේ වෙතත් මෙතෙක් මේ ගැන ලියූ එකම ලේඛකයකු විසින් හෝ කරඳහෙල කන්ද මුලුමනින්ම ගවේෂණයකර නැතිබව මෙහි ඉදිරියට කියවෙන විස්තර අනුව පැහැදිලිවනු ඇත.

**අපේ පරීක්ෂණය:—**

කරඳහෙල කන්දේ නටබුන් පරීක්ෂණය සඳහා මා පළමුවෙන්ම ගියේ 1965 වර්ෂයේදීය. ලාහුගල ප්‍රදේශය සැහෙන පමණ ගවේෂණයකළ මට එද කරඳහෙල නටබුන් කොටසක් බලා ගැනීමට හැකිවිය. ලාහුගල මහ විදුහලේ නැවතී දින කීපයක් ගතකරමින් කළ මේ කටයුතු වලදී කරඳහෙල මුලුමනින්ම ගවේෂණය කිරීමට නොහැකි වූයේ එහි යාමට තිබූ දුෂ්කරතා නිසාය. නැවත වරක් එහි යාමට 1970 දී සූදානම් වූ නමුත් එයටද බාධාවිය. 1965 දී මවිසින් සොයාගත් තොරතුරු ඇඩංගුකර කෙටි ලිපියක් 1969 අගෝස්තු 5 දින ශ්‍රී ලංකාදීප පත්‍රයට සැපයීමි. මගේ "මාගම රාජධානියට" තොරතුරු රැස්කිරීමේදී මෙම ප්‍රදේශයේ පුරාවස්තු පිළිබඳ මා ලැබූ අත්දැකීම් අති විශාලය. 1970 දී මුද්‍රණය කළ එම ග්‍රන්ථයේ [2] හබුතගල විහාරය ගැන තරමක් තොරතුරු අඩංගු කෙළේද ඉඩ ලැබෙන හැටියටය.

නැවත වරක් 1981 දී (දෙසැ;) එහි ගොස් ගල්ලෙණක නතරවී ඉතා දුකසේ යැපෙමින් දින කීපයක් මුලුල්ලේ ගවේෂණ කටයුතු කළෙමි. මේ වාරයේ මුළු කඳුගැටය සම්පූර්ණයෙන් ගවේෂණය කළ හැකිවිය. එසේම නව තොරතුරු රැසක් සොයා ගැනීමට හැකිවිය. භූගතව ඇති නටබුන් හෝ මගේ අනවධානයෙන් මගහැරුණු දේ හෝ තවත් සමහර දේ තිබෙන්නට පුලුවන. ඒ බව මට වැටහේ. මෙහි විස්තර වන්නේ එම

ගවේෂණයෙන් ලත් තොරතුරු මීස මුළින් ස්වල්ප වශයෙන් ගවේෂණය කළ අයගේ අදහස් වලට හෝ විස්තර වලට වහල්වූ තොරතුරු නොවනබව විශෙෂයෙන් සඳහන් කරමි. සමහර විට මගේ අදහස් මුළින් අදහස් දක්වූ අයට එකඟ වන්නටද නො වන්නටද පුලුවනි. මෙහි ලා භූගත කැණීම්කර තොරතුරු එළිදරව් තරගත හොත් මෙයට වඩා විස්තර අපට දැන ගැනීමට හැකිවනු ඇත,

## නටබුන් තොරතුරු:-

1×. මෙහි මුලින් හමුවන්නේ ගොඩනැගිලිවල නටබුන්ය. මෙහි ගොඩනැගිලි කීපයක් තිබුනු බව පෙනෙන නමුත් ඒවායේ ස්වරූපය සිතා ගන්නට නොහැකි තරමට ඒවා විනාශ වී හා වෙනස්වී ඇත. කඳු ගැටය පාමුළ තැනිබිමේ අඩු තරමේ ගොඩනැගිලි අටක්වත් තිබිය යුතුවේ. මින් එකක කෙලින් තිබෙන ගල්කණු නවයක් ශෙෂවී තිබේ. මුදුනේ කරු බේරා තිබෙන මේවා ඉතාම පැරණි යුගයට අයත්වේ. එසේම වාම් රළු නිමාවන් ඇති ඒවාවේ. මෙය අසල ඇති පියගැට පෙළ හා වාම් සඳකඩ පහණක් පැරණිකම තහවුරු කරයි. මෙම ගොඩනැගිල්ලේ තවත් කණු රුසක් තිබෙන්නට ඇත. ඒවා විනාශවූ ලකුණු තිබේ. දැනට ඇති කොටස 27'0''×27'0'' ප්‍රමාන ගොඩනැගිල්ලක හැඩය පෙන්වයි. දැනට ඇති අයුරින් කුළුණක උස 4'10'' පමණය.

2×. මෙම ගොඩනැගිල්ල අසළින්, ඊට ඉහතින් තවත් විශාල ගොඩනැගිල්ලක සම බිමක් වෙ. මෙහි සියල්ල විනාශවී ගොස්ය. අසල 1'8''×1'8'' ප්‍රමාණ සිවුරුස් කෙසකිළි ගලකි. එය වෙනත් ස්ථානවල ඇති පැරණි කෙසකිළි ගල්වල ස්වරූපයට වඩා අමුතු ලක්ෂණ දක්වයි. මෙය අනුව මෙහි භික්ෂුණී ආරාමයක් වී දැයි යන සැකය ඇතිවේ. දිගටි කාණුව වැනි වලක එක තැනක් ගැඹුරු කර ඉන් දිය බැස යන ලෙසට මෙය සාද තිබේ. මෙම ගල කිසියම් සාහසිකයකු විසින් දෙකඩ කොට තිබේ.

3×. මෙයට පහළින් තවත් විශාල ගොඩනැගිල්ලක කුළුණු මුල්ගල් නවයක් දැනට මතුවී තිබේ. මේවා විශාලය. වාම්ය. මේවා තරමක් ඈත භාගයකට අයත් ගොඩනැගිල්ලකට අයත්විය හැකිසේ පෙනේ. සමහර විට මෙය උපොෂථාගාරයකට අයත් නටබුන් වීමට බොහෝ දුරට ඉඩ තිබේ. කෙසේ වෙතත් මෙය විශාලවූ ගොඩනැගිල්ලක ස්වරූපය අත්හැර නැත,

4×. මෙයට නැගෙනහිරින් පාරක සටහන් දක්නා ලැබේ. එහිම දෙරටුවක ලකුණුද ඇත. එම නටබුන් වලට නැගෙනහිරින් තවත් ගොඩනැගිල්ලක ශෙෂ තිබේ. මෙහි 2'11'×3'1'' ප්‍රමාණ ගල් පුවරුවක සිව්කොණේ සිට මැදට එනසේ කාණු ඉරක් බේරා මැද වලක් හාරා තිබේ.

මෙය කුමක් සඳහා යොදගත්තක් දැයි කීමට නොහැකිය. මෙහිම සිව් කොණ කුළුණු මුල්ගල් 4 ක් හා පියගැට පෙළක ගල්කුට්ටි තිබේ.

5×. මේ අසල තවත් ගොඩනැගිල්ලක කණුශෙෂ දක්නා ලැබේ.

6×. මෙයට දුරින් කැලයෙන් වැසුණු කොටස්වල තැන තැන ගල් කණු තුන හතර බැගින් තිබේ. මේවාද විවිධ ගොඩනැගිලි වලට අයත් ඒවා බව පැහැදිලිය. එසේම අසල ගෙවත්තක පැරණිම යුගයට අයත්වන ගල් කණු, පඩි කඳන්, හා ගල් පුවරු රැසක් විනාශ වෙමින් පවතී. මෙම ගොඩනැගිලි පාදන තුරු ඒ පිළිබඳ නියතව යමක්කීම අපහසු බව අමුතුවෙන් කිවයුතු නැත. මේවා කිසි දිනක කවර පුරා විද්‍යා කැනීමකට හෝ ක්‍රමවත් ගවේෂණයකට ලක්වූ ඒවා නොවේ.

**පියගැට පෙළ:-**

මේ කොටසේ පියගැට පෙළවල් කීපයක්ද තිබේ. එයින් ප්‍රධාන පියගැට පෙළ මුළින් කී කෙසකිළිගල දැනට ඇති ගලේ නෙළූ එකකි. අඩි 2 අඟල් 2 දිග හා අඩි 1 ක් පළල පියගැට 18 ක් මෙහි වේ. අනෙක් පියගැට පෙළවල් එතරම් විශාල නැත. එහෙත් සෑම පියගැට පෙළකම අත් වැලක් තිබූ බවට ගලේම කණු සිටවූ කපොලු දක්නා ලැබේ.

කන්ද මුදුනේ බිහිසුණු බෑවුමක ගලේ කැපූ ඉතා කුඩා පියගැට පෙළකි. මෙහි පියගැටයක් දිග අඩියකට වඩා නැත. එසේම පළල අඟල් හයකට වඩා නැත. මෙහිද අත්වැලක් තිබුණු බව පෙනේ. මෙයින් කඳු මුදුනට නැගිය හැකිවේ. එහෙත් අද එහි ගමන එතරම් සුවදායක නැත.

**ගල් වංගෙඩියක සටහන —**

මතු විස්තර කරන ස්තූපයට බටහිරින් පිහිටි ගලක භාරණ ලද ගල් වංගෙඩියකි. වංගෙඩි පෙත වූ වට රවුම අඩි 7 ක් වේ. මේ කොටස අඟල් 2 ක් ගැඹුර වේ. මැද වල අඩි 1 ගැඹුරවේ.

**ස්තූප;—**

මෙහි ස්තූප 3 ක නෂ්ඨාවශෙෂ තිබේ. මෙයින් දෙකක් කඳුමුදුනේවූ පර්වත කූට මත කරවනලද ඒවාවේ. ඒවා අද සේදී විනාශවී ගඩොළු කන්ද පහලට වැටී සටහන් පමණක් ශෙෂ වී ඇත. අනෙක පිහිටියේ කඳු පාමුළ මුළින් සඳහන් කළ ශිලා ගොඩනැගිලි අතරය. මෙම ස්තූපයේ දැනට ඇති කොටස අඩි 150 ක් වටූ රවුම වේ. එය අඩි 20 ක් උස් වේ.

ස්තූපය මැදින් හාරා විනාශකර ඇත. යූපස්ථම්භයේ කැබලි දෙකක් සෑ ගොඩැල්ල පාමුළ වැටී තිබේ. මෙහි දිග අඩි 7 කි. සලපතල මළුවේ ගල් ලෑලි සමහර තැනක මතුවී තිබේ. දොරටු 4 ක් විය, මෙයින් තුනක ශේෂ මතුවී ඇත. ප්‍රධාන දොරටුව නැගෙනහිරට විය. එය වටා සිරිපතුල් ගල් අටක් දක්නට ඇත. මෙම ගලක ප්‍රමාණය 2'5'' × 2'5'' තරමේ වේ. මේ වගීයේ ගල් අටක් තිබීම විශේෂයෙකි. සමහරවිට ඒවා පෙර තිබූ තැන්වල අද නොතිබෙනවා විය හැකිය.

ස්තූපයේ ගඩොළු මේ ප්‍රදේශයේ පැරණිම ස්තූපවල දක්නට ලැබෙන ගඩොළු ස්වරූපයමවේ. එනිසා එහි පැරණිකම ගැන සැකයක් නැත.

## ලෙන් කර්මාන්තය:—

1×. කරඳහෙල කන්දේ මුදුනේ මෙන්ම බෑවුම් වල පිහිටි ලෙන් පුදුම සහගත ස්වාභාවික නිර්මාණවේ. ගල් තලාවේ පහතම ඇති ලෙණ කටාරම් කොටා ඇත. මෙහි දැනට මැටි ගසා ගත් කොටසක ගරු ස්වාමීන් වහන්සේ වැඩ සිටිති.

2×. මේ ලෙණට පහලින් දකුණට වන්නට ලෙන් දෙකක් එක ලඟ පිහිටා තිබේ. මේවායේ ද කටාරම් කොටා ඇත.

3×. ඉහත කී ලෙන් දෙකට ඉහළින් පිහිටි ලෙණකි. දිගට ඇදී පෙණය විහිද සිටින නාගයෙකුගේ නියම ස්වරූපය පෙන්නුම් කරන මෙම ලෙණ නාග ලෙණ නමින් හැඳින්වෙයි. මෙහි නාග පෙණයක හැඩයටම කටාරම් කොටා ඇත.

මින් පසු කටාරම් නොකෙටූ ලෙන් කිහිපයක් දක්නට ලැබේ. මේවා අබ්භෝකාසිකාංගය පූරණ තෙවැනි කොටසට ගෘහ ස්වරූපයෙන් තොරසේ ප්‍රයෝජනයට ගැනීමට තිබූ ඒවායැයි සිතිය හැකිය.

මින් පසු නැවතත් කටාරම් කෙටූ ලෙන් තුනක් හමුවේ. කන්ද මුදුනේ වූ ලෙන් පේලිය මෙයින් අවසන්වේ.

4×. දෙවන වට රවුමට වැටෙන කොටසේදී හමුවන්නේ ලංකාවේ විශ්මය සහගත ලෙණකි. ලංකාවේ ලෙන් අතර මෙපමණ විශාල ලෙණක් මා දැක නැත. ඊසාන දිගට මුහුණ ලා එක දිගට පිහිටි පර්වතයක මෙය පිහිටියේය. ලෙණ දිගින් අඩි 512 කි. පුළුල අඩි 30 කි, උසම තැන අඩි 82 කි. දිගේ පමණට පුළුල නැතත් මෙහි විශ්මයාවහා තත්වයේ අඩුවක් නම් නැත. ලෙණ මිදුල සමතලය. ලෙණ තුල බිම තට්ටු අටකට පිහිටියේය. වහළ ගලේ තැවරූ පුරාතන බදම තට්ටුව අදද තැන තැන රැකී තිබේ. බැඳ තිබූ බිත්තිවල අත්තිවාරම් හා ගඩොළු තැන

තැඹූ විසිරී විනාශ වී ශේෂ දක්නා ලැබේ. මුළු ලෙණම කටාරම් කොටා ඇතත් ලිපියක් පිහිටුවා නැත. එහෙත් ලෙණේ ඉහල කොටසේ කටාරමට යටින් අංක එක සටහන කොටා තිබේ. කන්ද මුදුනේ වූ ස්තූප වලින් එකක් පිහිටියේ මෙම ලෙණ පිහිටි පර්වතය මතය. මෙයට රාජ ලෙණ නම සුදුසු බව යෝජනා කරමි.



අංක 1. සංකෙතය.

5×. රාජ ලෙණට බටහිරින් යාර සියයක් පමණ දුරින් එක දිගට යාව පිහිටි ලෙන් තුණකි. කටාරම් කොටා ඇත. පැරණි බිත්තිවල ගඩොළු විසිරී තිබේ. අඩි 200 ක් දිග ලෙණකි. මෙහි කටාරමට යටින් ඉතා පැහැදිලි ලෙසට ගැඹුරු ලෙසද අංක දෙක සංකේතය කොටා තිබේ. ලිපි නැත. මෙයට යෝධ ලෙණ නම යෝජනා කරමි.



යෝධ ලෙණ පසුකර කඳු ගැටයේ බටහිර බෑවුම අතට යන විට ඹබරගල යන නමින් හැඳින්වෙන පර්වතය හමුවේ. මෙහි විශාල වශයෙන් ඹබර බඳින නිසා මේ නම විය.

අංක 2. සංකෙතය.

6×. ඹබරගලට දුරින් බටහිරට මුහුණ ලා පිහිටි දිග අඩි 130 උස අඩි 60 පුළුල අඩි 31 පමණ ලෙණක් හමුවේ. මේ ලෙනේ පහල කොටසේ කටාරම යටින් ලිපියක් පිහිටුවා ඇත.

මෙම සියලු ලිපි ''කරඳහෙල'' යටතේ බලන්න.

තෙල කී ලිපියට අඩි 5 ක් පමණ දුරින් තවත් ලිපියක් පිහිටුවා තිබේ. මින් පසු කටාරම් කෙටූ ලෙන් කිහිපයක් හමු වෙතත් ඒවායේ ලිපි නැත.

7×. එම ලෙන් පසුකර දකුණු පසට මද දුරක් ගිය පසු පිපුණු හත්තක නියම හැඩය ගත් දර්ශනීය ලෙණක් හමුවේ. මෙය අඩි 101 ක් රවුම් වේ. කටාරම නැතත් මෙය නොතෙමේ. එහෙත් කටාරම කොටා තිබේ. මෙහිද ලිපියක් ඇත. එයට මුලින් අංක තුන සංකේතය කොටා ඇත. එය උසින් අඟල් 8 කි.



අංක 3. සංකෙතය



අංක 4 - 5සංකෙත

මෙහි ලිපිය යටින් අංක 4, 5 සංකෙත දෙකද කොටා තිබේ.

මේ ලෙණෙන් දෙවන වටයේ ලෙන් නිමවේ. තෙවන වටය කන්දේ නැගෙනහිර බෑවුම ආශ්‍රිතව පිහිටා ඇති ලෙන් කොටස වේ.

8 ×. රාජ ලෙණට නැගෙනහිරින් දර්ශණිය ලෙණකි. මේ එතරම් විශාල නැත. කටාරම යටින් අංක දෙක සංකේතය පැහැදිලිව පිහිටුවා ඇත.

මෙයින් පසු කටාරම් කෙටූ ලෙන් 28 ක් හමුවෙතත් මේ කොටසේ එම ලෙන්වල එකකවත් අභිලෙඛන පිහිටුවා නැත. මේවා අතර ඉතා දකුම්කලු ලෙන් ද ඇත.

9 ×. පිළිම ලෙණ: —

කරඳහෙළ කන්දට පිවිසෙන අභියස නැගෙනහිරට මුහුණ ලා පිහිටි ලෙණකි. මෙම ලෙණ දිග අඩි 175 කි. උස අඩි 35 කි. පළල අඩි 31කි ලෙණ සම්පූර්ණයෙන් කටාරම් කොටා ඇත. ලෙණ තුල 41'8'' × 10'8'' ප්‍රමාණ ආසනයක් ගඩොලින් බැඳ තිබේ. මෙය බිම් මට්ටමේ සිට අඩියකට වඩා උස නැත. ආසනය මත 41'4'' ප්‍රමාණ සැතපෙන බුඩ ප්‍රතිමාවක් මැටි හා ගඩොළු භාවිතයෙන් නිර්මාණය කර තිබේ. පිළිමයේ උරහිස 6'5'' කි. සිරිපතුලේ දිග 4' 6'' කි. පළල 2' 9'' කි. මෙහි උදරය හා ලැම සම්පූර්ණයෙන් භාරා විනාශ කර ඇත. මුහුණ ද පතුරු ගැලවී ඇස් කන්, නාස ආදිය නැත.

මුලු ප්‍රතිමාවම විකෘත වී තිබේ. ඒ හෙයින් මෙහි මිණුම් දැනට ඇති තත්වය වෙතාස් වීමට පුළුවන. මෙහි ගඩොලක ප්‍රමාණය 1'2'' × 0'9'' පමණ වේ. වැඩිකල් නොගොස් ප්‍රතිමාවේ සෙසු කොටසම විනාශ වී යනු ඇත. ප්‍රතිමාව දකින විට විශාල සංවේගයක් ඇතිවේ.

ඉදිරියේ ගස් කපා ඇති බැවින් ලෙණට හොඳින් හිරුරැස් වැටේ. නැගෙන හිරින් හිරු නගින විට මෙහි දර්ශණය කියා නිම කළ නොහෙන සිරියාවක් ගනී. ළහිරු රැසින් බබලන බුදු සිරුර හා සිවුර මොන තරම් චමත්කාර ජනක වන්නට ඇත්දැයි කවියෙකුට මිස මට කිව නොහැකිවීම ගැන මම දුක් වෙමි.

**ලෙණ තුළ පුරා වස්තු:—**

ලෙණ තුල ප්‍රතිමාව අභියස හුණුගලින් කරන ලද කුඩා පිළිමයක ලැම කොටසක් තිබේ. මෙය උස 0'7½'' '' පළල 0'11'' කි. පිළිමයේ සෙසු කොටස් දක්නට නැත. ප්‍රතිමාවේ සිරිපා යුවල අසල පහන් ගල් 2ක් තිබේ. මින් එකක් සඳකඩ පහනක හැඩයද අනෙක වටකුරු හැඩයද ඇතිසේ සාද ඇත.

ලෙනේ එක් පසෙක පැරණි උළු කැබලි වලන් කැබලි හා කොත් කැබලි රැසක් දක්නට ලැබේ. මේවා අතර ප්‍රතිමාවේ ශිරෝජාල රැසක්ද ඇත. සියල්ලම විනාශ වෙමින් පවතී. ලෙණ අබියස පැතිබැම්මක ශේෂ තිබේ. ලෙනේ බිත්තිවල ගඩොළු හැම තැනම විසිරී තිබේ. මෙහි වම්පස විශාල කොස් ගසක් හට ගෙන ඇත. ලෙණ මුලුමණින්ම වසා පැතිරී තිබූ විශාල ගසක් කපා මුල පුලුස්සා තිබේ. ලෙණ ඇතුලත නවරණ ලද බදම තට්ටු ගැලවී ගොස් තිබේ. මේ අතුරින් පැරණි වැදි චිත්‍ර රැසක් මතුවී පෙනේ. මේවා අතර සතුන්ගේ රූප, දඩයම් කරණ ආකාරය, සතුන්ගේ පිට උඩ යන මිනිසුන් ආදී විවිධ ගණයට අයත් ඒවා වේ. චිත්‍ර මත ''රස්තියාදු කාරයන්ගේ'' නම් ලිවීම් ආදී ''ජඩ'' වැඩ නිසා ඒවා විනාශ වෙමින් පවතී.

**ගල් කෙම්;—**

රාජ ලෙණටත් පිළිම ලෙණටත් අතර එකට සම්බන්ධව පිහිටි පර්වතය ඉතා විශාලය. මෙහි සිග්‍ර බෑවුම නැගෙනහිරටත් මද බෑවුම බටහිරටත් සිටින සේ පිහිටියකි. මෙහි මුදුන් තලය තරමක් විශාල තැන්නක සවරූපය ගනිති. ඒ මත විශාල ගල්කෙම් දෙකක් හා කුඩා කෙම් හතරක් පිහිටියේය. විශාල කෙම් දෙක ඉතා ගැඹුරුය. මෙහි ජලය කිසිදු කලෙක නොසිඳේ. කරඳමෙහළ අතීතයේ වැඩ සිටිය සිය ගණන් සංඝයාගේ ප්‍රයෝජනයට ජලය ලැබුනේ මේවායින් බවට සිතාගත හැකිය. අද වනසත්නගේ පිහිණුම් තටාක මේවාය.

**පොකුණු:—**

කඳු ගැටය පාමුල මුලින් කී ගොඩනැගිලි පෙදෙසේ පොකුණු 4 ක ශේෂ තිබේ. මේවා අද ගොඩවී කුඩා වගුරු බවට පත්ව ඇත.

**වෙනත් සෙල් ලිපි:—**

මුලින් කියන ලද ශෛලමය ගොඩනැගිලි කොටසේ මිටි ගල් තලා කිහිපයකම පිහිටුවන ලද පළමුවන සියවසට අයත් අභිලේඛණ කිහිපයක් ඇත. එයින් එක් ලිපියක් සම්පූර්ණයෙන් විනාශ වී තිබේ. මේ ලිපි සී. ඩබ්ලිව්. නිකලස් මහතා පිටපත්කර ඇත.[3] කියවිය හැකි ලිපි තුනක් මෙසේය.

**1. සී (ධම්) හබුතගල විහරශි ගබ්ඩනකිරි වවි**
**කණඩය ගගදිනි දහුලිය වවි දෙපති විසයි.**

(යහපතක් වේවා හබුතගල විහාරයෙහි ගබ්ඩත කිර වැව
කරවා සංඝයාට දෙන ලදී. දහුලිය වැවේ බදු දෙකද දෙන
ලදී.)

මෙහි ''දෙ'' යනු දෙකක් යන අර්ථයද ''පති'' යනු බද්ද යන අර්ථයද ගත්තේය, වැවේ ජලයෙන් බදු අයකරගත්බව පැරණි ලිපිවලද නොයෙක් විට සඳහන්ව ඇත. මෙහි වැවේ බදු දෙක කුමක්ද යනු අවිනිශ්චිතය. සමහර විට වැව් ජලයෙන් ලැබෙන බද්ද හා ඉන් අස්සද්දන කුඹුරු වලින් ලැබෙනු බද්දක්ද යන දෙක විය හැකිය.

**2 × හබුනගල විහරශි උවසික පුස තුමහ**
**හමණවිර වවි සඝ දිනි.**
(පුස්සා උපාසිකාව තමාට අයත් හමණවිර වැව
හබුතගල විහාරයෙහි සංඝයාට දුන්නාය.)

මෙහි වාක්‍ය යෝජනය ගියක සවරූපය ගනී.

**3 × මෙම ලිපිය සහ ගීයෙන් රචිත යැයි කියවේ.**
**හබුතගල විහරශි**
**කකවණ තිස මහරජහ**
**උවසික මත තුමහ වවි**
**සඝ දිනෙ ම (හ) ව — — — — —**
මත්තා උපාසිකාව තමාගේ මහවැව නම්වූ වැව කාකවණ්ණ
තිස්ස රජුගේ හබුතගල විහාරයේ සංඝයාට දුන්නාය.

**වැව්:—**

කරඳහෙල විහාරය වටා වැව් කීපයක් ඇත. මෙයින් කරඳහෙල වැව හැර සෙස්ස සම්පූර්ණයෙන්ම අබලන්වී කැලෑ බවට පත්වී තිබේ. කරඳහෙල වැව පිහිටියේ කන්දට දකුණු දිගිනි. බටහිර දිගින් කුඩා වැවක්ද. උතුරු දිගින් නබඩගස් වැවද, නැගෙනහිරි දිගින් ශ්‍රීමනී වැවද,

ගිණිකොන දිගින් කුඩා හා විශාල වශයෙන් වැව්දෙකක්ද පිහිටියේය. මෙහි පර්වත ලිපිවල එවක තිබූ වැව් කීපයක් ගැනද සඳහන්වේ. ගබ්ඩකතිරි වැව දහුලිය වැව, හමණවීර වැව හා මහවැව යනු එහි සඳහන් වැව් 4 වේ. සමහර විට වර්තමානයේ වෙනත් නම් වලින් හැඳින්වෙන්නේ සෙල් ලිපිවල සඳහන් මෙම වැව් කීපයම විය හැකිය.

**දායකවරු:—**

කරඳහෙල විහාරයේ මුල්ම දායකයා කාකවණ්ණ තිස්ස මහරජ බව එහි සෙල් ලිපියක ලියවී ඇත. ලෙන් කර්මාන්තයේද සමහරක් එතමා විසින් කරවන්නට ඇත. (මේ ගැන ඉදිරියේදී විවරණයවේ.) ලෙන් 3 ක් පුදන ලද දායකයන් ගැන බ්‍රාහ්මී ලිපි වලින් කියවේ. එනම් සෝමදේව, ඔහු බෑත (භදන්ත) උපාධිය දූරුවෙකි. උත්තිය, ඔහු ආචාර්යවරයෙකි. තිස්ස ඔහු කුම්භකාරයෙකි. යන මේ අය සමහර ලෙන් පිදූ දායකයෝ වෙති.

පර්වත ලිපි අනුව ගබ්ඩකතිරි හා දහුලිය වැව පිදූ දායකයන් ගැන සඳහන් නැත. හමණවීර වැවේ අයිතිකාරිය පුස්සා උපාසිකාවයි ඇය තම වැව සංඝයාට පිදූවාය. මත්තා උපාසිකාව අනෙක් දායිකාවයි. ඇය තමාට අයත් මහ වැව (මේ නම අපැහැදිලිය) සංඝයාට පිදූවාය.

**ප්‍රවාද:—**

රාජ ලෙණේ කාවන්තිස් රජු හා සේනාව නැවතී සිටීම පිළිබඳව රසවත් ප්‍රවාදයක් ඇත. දේවතා එළි සියගණනින් මෙහි ඒම යාම අමනුෂ්‍යයන්ගේ හොල්මන්, අවතාර ශබ්ද ආදිය පිළිබඳ කථා, මහවැවේ බඹාැනාගේ ඇදූමට ගිය මාරි හා මාරා වැද්දන්ගේ කථා ආදී රසවත් මෙන්ම ලොමු ඩැහැගන්වන ජනප්‍රවාද මේ අවට බෙහෙවින් අසන්නට ලැබේ.

කරඳහෙල විහාරයේ සිට ලාහුගල මගුල් මහා විහාරයටද එහි සිට දහරම්පල (ජයරම්පල) දුටු ගැමුණු මාළිගාවටද යාමට පුළුල් ගල් අතුරා හැදූ පාරක් තිබූබවට ඓතිහාසික ප්‍රවාදයන්ද අසන්නට ලැබේ. කාවන්තිස් රජු නිතර මේ මගින් කරඳ හෙල විහාරයට පැමිණිබවද මෙහි කියවේ.

# සමාලෝචනය.

කරඳහෙල විහාරයේ නටබුන් පිළිබඳව සළකා බලන විට වැදගත් ඉතිහාසයක් එයට සම්බන්ධව ඇති බව පෙනේ. මෙහි දක්වෙන අංක 3 දරණ පර්වත ලිපියෙන් කියවෙන පරිදි මෙම විහාරයේ ආදි කතෘ වරයා කාකවණ්ණ තිස්ස රජතුමා බවත් විහාරයේ නම හබුතගල විහාරය බවත් කියවේ. එතුමාගේ අභාවයෙන් අවුරුදු 200 කට පමණ පසු ලියවී ඇති

මෙම ලිපියේ සටහන සැක කිරීමට හේතුවක් නැත. ලාහුගල අවට ප්‍රදේශයේ ඇති බොහෝ නෂ්ටාව ශේෂවල මුල් කර්තෘත්වය හිමිව ඇත්තේ මහානාග රජ පවුලේ උදවියට බව මෙහි ගවේෂණ වලදී පැහැදිලි වීය. මහානාග යුවරජු පිහිටුවාගත් මාගම සියඹලන්දුව හා ලාහුගල අතර ඇති මාගම බව 1970 දී මවිසින් ලියන ලද මාගම රාජධානිය නැමති පොතින් හොඳ හැටි විස්තර කර ඇත. එහිලා තරමක විස්තරයක් කරඳහෙළ විහාරය ගැන කර ඇත්තේය.

එහෙත් වංශ කථාවේ[4] කාවන්තිස් රජු විසින් හබුතගල විහාරය නමින් විහාරයක් කළ බවට කිසිදු තොරතුරක් හමුනොවේ. වංශ කථාවලට රජවරුන් විසින් කරන ලද සියල්ල පිළිබඳ තොරතුරු ඇතුලත් වූනා යයි කිසිවිටක කියහැකි නොවේ. මෙබඳු ඌනතා කොතෙකුත් දක්නට ලැබෙන හෙයිනි.

මහාවංශයේ 33 වන පරිච්ඡේදයේ[5] වළගම්බා රජු පිළිබඳ විස්තර කථනයේදී හබුනගල්ලක නමින් අඥාත කතෘක විහාරයක් ගැන සඳහන් වෙයි. කනසිව මැරීමෙන් පසු ඇමතිවරුන් 8 දෙනෙකු සමග අච්ඡගල්ල විහාරයෙහි බුඩ පූජාවක් කිරීමට ගිය වළගම්බා රජු ආකාශචේතියදී කපිසීස ඇමැතියා මැරවීය. මෙයින් කළකිරුණ සෙසු ඇමති වරු 7 දෙන පලාගියෙන් සොරුන්ට අසුව අතරමගදී කරදර වී හම්බුගල්ලක විහාරයට ගියහ. එහිදී ඔවුන්ට තිස්ස තෙරුන් හමුවිනි. මේ තිස්ස තෙරුන් බහුශ්‍රැත කෙනෙකු බව මහා වංශයේ දක්වේ. සමහර වංශකථා පිටපතක කම්බුගල්ලක නමින් සඳහන් වෙතත් නිවැරදි පාඨය හම්බුගල්ලක බව සැළකිය හැකිය. මෙම විහාරයේ වැඩසිටි තිස්සතෙරුන් මහාවංශ ටීකා[6] කතුවරයා විසින් හඳුන්වන ලද්දේ "කුම්බුගල්ලක මහා තිස්ස ථෙර" වශයෙනි. එහිදු "කුම්බු" යනු "හම්බු" යැයි වියයුතු සේ පෙනේ. කුම්බිලක තිස්ස තෙරුන් හා හම්බුගල්ලක තිස්ස තෙරුන් යන දෙනම ඇමතියන් සත්දෙන රජු වෙතට කැඳවාගෙන ගොස් සමාදන කරවූහ.

මෙයින් පෙනී යන්නේ කරඳහෙළ විහාරයේ වැඩසිටි තිස්ස තෙරුන් වළගම්බා රජුගේ ද්‍රවිඩ සටනට සේනා සංවිධානයේදී සහාය වූ කෙනෙකු බවයි. ආකාශචේතිය, හම්බුගල්ලක විහාරය, ගිරිකුම්බීල විහාරය වැනි රෝහණයේ ශ්‍රේෂ්ඨ පූජනීය ස්ථාන රෝහණ රජ පවුලේ උදවිය විසින් කරවන ලද කාවන්තිස් රජුගේ සිට මෙම පරපුරේ සාමාජිකයන් විශේෂයෙන් සම්බන්ධකම් පැවැත්වූ තෙර වරුන් වැඩ සිටි ස්ථාන බව පැහැදිලි වේ. මේ කතාවෙන් අපට මතුකර ගතහැකි අනෙක් කරුණ නම් හම්බුගල්ලක නමින් විහාරයක් රෝහණයේ තිබූ බවයි. රෝහණයේ කිසිදු තැනක මේ නමින් වෙනත් විහාරයක් මේ තාක් හමුවී නැත. එමනිසා තෙල ශිලා ලිපියේ එන හබුතගල විහාරය මහාවංශයේ සඳහන් හම්බුගල්ලක විහාරයම බව පිළිගැනීම සාවද්‍ය විය නොහැකිය. මේ අදහස නිකලස් ශූරීන් ද සටහන් කර තිබේ.

එසේ නම් මහාවංශයේ සඳහන් වන හම්බුගල්ලක විහාරයේ ආදි කර්තෘවරයා අභිලේඛනයෙන් තහවුරු වන පරිදි කාවන්තිස් රජතුමාය. කරඳහෙළ විහාරයේ ඇති ලෙන් රැසක් හා සමහර ශිලාමය ගොඩනැගිලි මෙතුමා විසින් කරවන ලද ඒවා වෙයි.

සාමාන්‍යයෙන් ඇතැම් ලෙන්වල ඒවා කරවනලද රජවරුන් විසින් ඒ බව ලිපිවලින් සටහන්කර ඇතත් පැරණි සමහර ලෙන්වල එබඳු සටහන් තබා නැත, දේවානම්පියතිස් රජතුමා විසින් කරවනලද අටසැට ලෙන් එකකවත් එතුමා විසින් කරවන ලද බවක් සඳහන් නොවේ.[7] සිතුල්පව්ව කාවන්තිස් රජු විසින් කරවනලද බව පැවසෙතත් එහිදු ඒ බවට අභිලේඛන සටහනක් නැත කරඳහෙල විහාරයේ ලෙන්වලද දකින්ට ඇත්තේ ලිපි 3 කි. මෙහි ලෙන් කොටස් දෙකකට වෙන්කළ හැකිය. කඳු වැටියේ බටහිර පැත්තේ ලෙන් එක කොටසකටත් නැගෙනහිර හා ඊශානදිග පැතිවල ලෙන් තව කොටසකටත් වශයෙනි. බටහිර දිගින් පිහිටි ලෙන් කීපයක අභිලේඛන සටහන් ඇත. ඒවා කරවා ඇත්තේ සාමාන්‍ය පවුල් වලට අයත් උදවිය විසින් බව පෙනේ. නැගෙනහිර හා ඊශාන දිග ලෙන් වල එබඳු අභිලෙඛන කිසිත් නැත. එහෙත් මුලින් දක්වා ඇති අංක 3,5,8 දරණ ලෙන් වල විශෙෂ සංකෙතයක් දක්නා ලැබේ. මෙම සංකේත එම ලෙන් ගැන විස්තර කිරීමේදී මෙහි මුලින් දක්වා ඇත. මෙය විශෙෂ සැලකිල්ලට ලක්කළ යුතු එකකි. දැනට සොයා ගෙන ඇති අභිලේඛන සටහන් අතුරින් මෙම සටහන දක්නට ලැබෙන්නේ අම්පාර දිසාවේ මහඔයට සැතපුම් 15 පමණ දුරින් පිහිටි හෙනන්නේගල, හම්බන්තොට දිසාවේ යාල අභය භූමියේ කොට්ටදමුහෙල, මාතලේ දිසාවේ දඹුල්ල විහාරය යන ස්ථාන තුනේ ලිපි තුනකද, කුරුණෑගල දිසාවේ ගල්ලෙණ විහාරයේ ලිපි 10 ද වශයෙන් ස්ථාන හතරක පමණි.[8] මෙයින් හෙනන්නේගල හා කොට්ටදමුහෙල ලිපිවල මාලුවෙකුගේ සංකේතයද දඹුල්ල ලිපිය සමග තවත් සංකේතයක්ද දක්නට ලැබේ. එහෙත් කරඳහෙල සංකේතය සමග අමතර සංකේත කිසිවක් දක්නට නොලැබේ.

බ්‍රාහ්මී නොවන සංකේත (නොන් බ්‍රාහ්මි සිම්බෝල්ස්) ලෙස සැලකෙන මේවා හා තවත් එබඳුම සංකේත ආධාරකර ගෙන මහාචාර්‍ය පරණවිතාන මහතා ඉන්දු නිම්නයේ අක්ෂර කියවීමට ප්‍රයත්න කළේය.[9] එතුමා මෙහි මා දක්වූ සටහන වෙනත් තැන්වලින් ලබාතිබී එය "ග්‍රාමණී" යන්න අර්ථවත් කරතැයි සඳහන් කළේය. කරඳහෙල සංකේත පරණවිතාන මහතා දක නැතත් එම සංකේත වලින් එතුමාගේ මතය සම්පූර්ණයෙන් තහවුරුවන බව මගේ අදහසයි. මෙම සංකේත සඳහන්වන සියලුම ලිපි වලින් කියවෙන්නේ ගමිණි වරුන් සම්බන්ධ පූජා තොරතුරුය. එසේම ගමිණි සම්බන්ධයක් නැති එකද ලිපියක මේ සංකේතය මෙතෙක් හමුවී නැත. මගේ අදහස නම් මුළු සංකේතයෙන් අර්ථවත් වන්නේ ගමිණි

උපපදය දූරු රජවරුන්ගේ අත්සන බවයි. මෙහි අංක 2 සටහනේ ආධාරක කොටස සිවු හෙලය නිරූපනය කෙරේ. උඩ කොටසින් අධිපති බව නිරූපනය කෙරේ. ස්වස්තිකය ආධිපත්‍යයේ සංකේතයකි. කාවන්තිස් රජු ගමිණි කෙනෙකි. ඔහු හබුතගල විහාරය කරවූ බව අභිලේඛනයේ සඳහන් කරන්නේ මුත්තා උවැසිය විසින් මිස ඔහුම නොවේ. ඔහු මුලු රටේම ආධිපත්‍යය නොදරුවත් ඔහු එයට හිමියා නිසා මහරජ යන්න එහි යොද ඇත. ලිපිය ලියවූ කාලය පසු යුගයක වුවත් ඔහුගේ යුගයේම ඔහු මහරජ ලෙස පිළිගැනුනාට කිසිම සැකක් නැත. රජතුමාගේ අත්සන වශයෙන් සංකේත භාවිතය නුවර යුගයේද දක්නට ලැබෙන්නකි. නුවර යුගයේ ඇතැම් රජවරු සිය අත්සනට යෙදූවේ ශ්‍රී අක්‍ෂරය.[10] මේ අදහස ගැන දීර්ඝ කරුණු මෙහි ළා දක්වීමට අදහස් නොකරමි. කෙසේ වෙතත් කාවන්තිස් රජු තම 'ග්‍රාමිණි' යන්න අර්වත් කළ අත්සන මෙහි ලෙන් වල යොද ඒවා සංඝයාට පූජාකළ බව නිගමනය කිරීම බොහෝ දුරට නිවැරදි විය හැකි බව කිවයුතුවේ.

මෙම සංකේත ලෙන්වල පිහිටුවීමේ වෙනත් අර්ථයක් නැතිබවද කිය හැකිය. බ්‍රාහ්මී නොවන සංකේත ලෙස දක්වෙන වෙනත් සංකේතද එබඳු අත්සන්ම බව නිසැක යනු නිවැරදිය. අංක 7 ලෙස දක්වූ ලෙණේ ලිපියේද මුලින් අංක (3) සංකෙතයද ලිපියට යටින් අංක 4, 5 සංකේත දෙකද දක්නා ලැබේ. මෙම සංකේතයන් මෙතෙක් කිසිදු තැනකින් හමුවී නැත. මේ ගැන පරීක්‍ෂාකරගෙන යන හෙයින් මෙහිලා කිසිවක් දක්වීමට අදහස් නොකරමි.

ක්‍රි: පූ: 2 වන සියවසේ ආරම්භවූ කරදහෙල විහාරයේ දීර්ඝ සංවර්ධන ඉතිහාසයක් සොයා ගැනීම පහසු නොවේ. ක්‍රි: ව: 1, 2 සියවස් වල වැව් පූජා කිරීමෙන් එම වකවානුව දක්වා සංවර්ධනය වූ බව කිවහැකිය. මහාවංශයේ 35 පරිච්ජදයේ වසභරජු කළ සාසනික ක්‍රියා ප්‍රකාශ කිරීමේදී[11] ඔහු කුම්භිගල්ල විහාරයේ උපොෂථාගාරයක් කරවූ බව පැවසෙයි. වසභ බොහෝ වෙහෙර විහාර රෝහණයේ කරවා ඇත. කුම්භිගල්ල යනු හම්බුගල්ල යන්නේම අපර පදයක්බව මුලින්ද දක්වා ඇත. මෙය නිවැරදි නම් වසභ මෙහි උපොෂ්ථාගාරයක් කළබවත් මෙහි අංක 3 × ට දක්වා ඇති නටබුන් අතර වියහැකි බවත් සැලකීමට පුළුවන.

පිළිම ලෙණේ ඇති ප්‍රතිමාව නිරූපද්‍රැතව තිබුනානම් එහි නිර්මාන සමය ගැන යමක් අපට දැනගන්නට හැකිව තිබිනි. සාමාන්‍ය වශයෙන් මෙම ප්‍රතිමාව පානම පත්තුවේ බඹරගස්තලාවේ ලෙණේ හා ශාස්ත්‍රවෙල විහාර ලෙණේ ප්‍රතිමාවට සමාන යුගයක නිර්මානය වන්නට ඇති බවට නම් කල්පනා කළ හැකිය. මෙයින් පසු හබුතගල විහාරය පිළිබඳ තොරතුරු හමු නොවීම අපේ බලවත් අභාග්‍යයකි.

නැවතත් හබුතගල විහාරයේ නවෝදයක් ඇති කිරීම පිළිබඳව වයොවෘඩ පූජ්‍ය ඉන්දනන්ද ස්වාමීන් වහන්සේ ගන්නා උත්සාහයට බෞඩයන් සියලු ප්‍රශ්න අමතක කර අතදීය යුතු බව විශෙෂයෙන් සඳහන් කරමි.

**පරිශිෂ්ඨය:—**

සෙල් ලිපියක ඇති කරුණක් ගැන සැකයක් ඇති වූයෙන් හදිසියේ නැවතත් 81. 12. 27 දින කරදහෙලට ගියෙමි. මෙහිදී විහාර ලෙණේ මිදුල එළිකර තිබෙනු දුටිමි. ඒ ගැන විමසා බැලූ මට එහි සඳකඩ පහණක් දකගත හැකිවිය. මෙය නෙළුම් මල් රටාවෙන් යුක්ත ක්‍රි:වː 4,5 සියවසට අයත්සේ පෙනේ. බොහෝ දුරට මෙහි සටහන් ගෙවී ඇත.

කන්දේ බටහිර පැත්ත බොහෝ වනසතුන්ගෙන් ගැවසියේය. මේ කොටසේ තැනි පෙදෙස නැවත ගවේෂණය කළෙමි. එහිː නැගෙනහිරි බෑවුමේ මෙන්ම බොහෝ ශෛලමය ගොඩනැගිලි නටබුන් දක්නා ලැබේ. මේවා ඉතාම පැරණි යුගයට අයත්වේ. පැති බැම්මවල ශෙෂ ගොඩනැගිලි වල ගල්කණු ගල් පුවරු ආදිය මේ අතර වේ. පොකුණු දෙකක නටබුන්ද මේ අතර ඇත. මේවා සම්පූර්ණයෙන් කැළයෙන් වැසී ඇති බැවින්ද වන සතුන් සිටින බැවින්ද මෙහියාම ඉතා අනතුරු දයක වේ.

පර්වතය මුදුනේ මැටිගසා ඇති ලෙණේ ලිපියක් තිබෙන බව දඩයක් කරුවෙකු කී බව ඇසූයෙන් මුල් ගමන්වලදී එම ලෙණ පරීක්ෂාකර තිබුනද නැවතත් එහි ගොස් ඉතාමත් සැලකිල්ලෙන් බැලූවද ලිපියක් නම් නොවීය.

දුටු දෙයට වඩා නොදුටුදේ කියා මුළා කිරීමත් දුටු දේ නොකියා මග හැරීමත් අපේ බොහෝ බෞඩයන්ගේද සිරිතය. පුරාවස්තු පරීක්ෂණ වලට ගිය අයට උදව් කිරීම නොව නොමග යැවීම බොහෝ විට සිදුවේ. ජාතිය ගැන කැක්කුමක් නැති මූසළයින්ගේ මෙම ජඩ ක්‍රියාව මම තරයේ හෙලා දකිමි.

## පුළුකුණාව:-

මෙහි අන්තැනකද කෙටියෙන් සඳහන්කර ඇති පුළුකුණාවේ නටබුන් ගැන විස්තරය දක්වනු ලබන්නේ මගේ ගවේෂණ වලදී සොයාගත් තොරතුරු අනුවය,

පුළුකුණාකන්දේ හා පාමුළ පිහිටි නෂ්ටාවශෙෂ කොටස් කීපයකට වර්ග කළ හැකිය.

1 ගොඩනැගිලි.
2 ස්තූප.
3 ලෙන් කර්මාන්ත.
4 පියගැට පෙළවල් හා මාර්ග
5 පොකුණු - වශයෙනි.

1. කඳුගැටය පිහිටා ඇති ආකාරය අනුව ගොඩනැගිලි නටබුන් දෙකොටසකට බෙදිය හැකිය. (1) කන්දේ මැද තලාවේ පිහිටි ගොඩනැගිලි හා (2) කඳු පාමුල පිහිටි ගොඩනැගිලි වශයෙනි. මෙයින් පළමුකොට කඳු පාමුළ පිහිටි ගොඩනැගිලි පිළිබඳ කරුණු දැක්වීම වඩා යොග්‍යවේ.

1× 1. 1. දැනට පුළුකුණාව ගම්මානයට යන ගුරුපාර වැටී ඇත්තේ මේ නටබුන් තලය මැදිනි එය නටබුන් පිහිටි කන්ද පාමුළින්ම නැගෙනහිර අතට හැරේ. මේ පාර අසළ කඳු පාමුළ සමාන්තරසේ පිහිටි කණු දෙකකි. එකක සිට අනෙකට දුර අඩි 19' 8'' කි. පිළිවෙලින් කණු දෙකේ උස 2' 9'' හා 3' 4'' කි මෙය පැරණි ගොඩනැගිල්ලක ශෙෂයක් සේ සැලකිය හැකිය. වාම් වූ නිමාව පැරණි බව කියාපායි.

1. 1. 2* ඉහතින් කී කණු දෙක ඉදිරිපස මාර්ගයෙන් අනෙක් අතට පිහිටි ගොඩැල්ලෙකි. මේ අසල විශාල සියඹලා ගසෙක් වේ. ගොඩැල්ලේ අත්තිවාරම් පසින් යට වී තිබේ. එහි සිවුකොණ කැඩුණු කණු හතරක ශෙෂ තිබේ. මේවා පොළෝමට්ටමේ සිට අඩි 1½ ට වඩා උස නැත. ප්‍රමාණයෙන් 29'5'' × 25'' 0' පමණ වේ. කරත්ත යාම නිසා මෙහි නටබුන් තවත් විනාශ වී යයි. මෙය ඇතුළත තිබුනු කණුගල් දෙකක් ගෙන ගොස් ඇත. ඒවා කිසිවකු විසින් සාත්තමලේ (රහත්ගල) කන්දට ගෙනයනලදැයි කියති. කණුමුල්ගල් එකක්ද කැඩුණු කණුකැබලි නමයක්ද ගඩොළු ගොඩක්ද මේ කොටසේ තිබේ.

1. 1. 3 කන්දට නැගීමට ඇති අඩි පාරට දකුණු පසින්ද, මුළින් කී ගොඩැල්ලට බටහිරින්ද පිහිටි කන්ද පාමුලටවූ ගොඩනැගිල්ලක නටබුන් කොටසක්වේ. කන්ද සේදී ආ පසින් බොහෝ දුරට වැසී ඇති මෙහි මතුව ඇත්තේ ගල්කණු තුනක් පමණි. ඒවාද මැදින් කඩා දමා තිබේ.

1. 1. 4 ඉහතින් කී ගොඩැල්ලට ආසන්නව, එයට දකුණින් පිහිටි ගොඩනැගිල්ලකි. මෙහිද කණු පහක ශෙෂ හැර සෙසු කොටස් විනාශ වී ගොස් ඇත.

1. 1. 5 දනට; එනම් මා පරීක්‍ෂණයට දෙවන වරට ගියදින (82. 03. 07) භික්ෂූන් වහන්සේ නමක් පදිංචිවුනු ගල්ලෙණ අබියස ගොඩනැගිල්ලකි. මෙහි විවිධ අන්දමට පිහිටි කණු රැසක ශෙෂ නැගී සිටිනු පෙනේ. දනට ඉන් දෙළසක් තරමක් දුරට රැකී තිබේ. මෙයින් කණු හයක් තුන බැගින් දෙපේළියට සමාන්තරව සිටී. මෙය විශාල ගොඩනැගිල්ලකට අයත් ඒවා බව පෙනේ. මේ ගොඩනැගිල්ලේ නැගෙනහිරි අතින් අඩි 97 පමණ දිග පනාබැම්මක ශෙෂද දක්නා ලැබේ. මේ අතර කණුමුල් ගලක්දවේ.

1. 1. 6 ඉහතින් කී ගොඩනැගිල්ලට තවත් දකුණින් ගොඩනැගිල්ලකට අයත් කණු දෙකක් පමණක් දක්නා ලැබේ.

1. 1. 7 ලෙණ ඉදිරියෙන් ඇති ගොඩනැගිල්ලට පහතින් දකුම් කළ ගොඩනැගිල්ලක් බවට සැලකිය හැකි ශෙෂ රැසක් දක්නා ලැබේ. මෙය 50'0' × 50'0 පමණ වේ. ගරාවැටී ඇති බැවින් නියම ගණනක් දක්වීම අපහසුය. මේ කොටස ඇතුළත කණු 15 කි. ඒවා සියල්ල කැබලි වලට කැඩී ඇත. කණුවක පළල 1'5 × 1.3' පමණ වේ. මෙහි නැගෙනහිරි අතට තිබූ දෙරටුවක ශෙෂ තිබේ. ඒ අනුව දෙරටුව අඩි 9'8'' පමණ වේ. වාම් කොරවග්ගල් දෙකක් දෙපස වේ. ඒවා ගලවා ගැනීමට ප්‍රයත්න දරා ඇත. නිදන් ඇතැයි කියියම් පිරිසක් විසින් මේවා අසල හාරා ඇත. නිසැක ලෙසම මෙය බුදුමැදුරකි. මෙහි 1968 දී බුදුපිළිමයක හිස හැර බඳ කොටස තිබිනි. අද එය තිබුනු ලකුණක්වත් නැත. එය අසිංහල පිරිසක් විසින් ගෙන ගොස් විනාශකරණ ලදැයි කියති.

1. 1, 8 මේ අසළ ඇති තවත් විශාල ගොඩනැගිල්ලකි. එය අඩි 42,0' × 42'0' පමණවේ. මෙයට අයත් කණු දහසයක් තිබේ. ඒවා සියල්ලම කැඩී කැබලි වී ඇත.

1. 1. 9 මුළින් කී ගොඩනැගිල්ලට දකුණින් අඩි 10'0 × 10'0 පමණවූ කුඩා ගොඩනැගිල්ලක ශෙෂ තිබේ, එහි සිවුකොණ කුළුණු මුල්ගල් හතරකි. අනෙක් සියල්ලම විනාශ වී ඇත.

1. 1. 10 ඉහත කී ගොඩනැගිල්ලට මදක් පහතින් 40'0 × 40'0'' ප්‍රමාණ විශාල ගොඩනැගිල්ලක ශෙෂ ඇත. මේ කොටසේ කණු දහයකි. ඉන් දෙකක් හොඳින් සුරැකී ඇති අතර අනෙක්වා කැබලිවී ඇත. මෙහි දකුණු අතට දෙරටුවකි. එහි පියගැට පෙළ අඩි 7'0'' කි. එහි වාම් කොරවග්ගල් දෙකින් එකක් නැත. එය ගලවාගෙන ගොස් ඇත.

1. 1. 11 මේ ගොඩනැගිල්ල අසල තරමක ගඩොළු ගොඩැල්ලක් වේ. එය ස්තූපයක් විය නොහැකිය. සමහර විට සොහොන් ගැබක් වියයුතු යයි හැඟේ.

1- 1- 12 මුලින් කියන ලද 1- 1- 7 ගොඩනැගිල්ලට නැගෙන--හිරින් අඩි 18'8'' × 14'10'' පමණ දෙරටුවක ස්වරූපයගත් ගොඩැල්ලක් තිබේ. මෙය ඇතුළත කණු දහයක ශෙෂ තිබේ.

1- 1- 13 ඉහතින් කී ස්ථානයට නැගෙනහිරින් වැදගත් ගොඩනැගිල්ලකට අයත් නටබුන් රැසකි දැනට පවතිනා මට්ටමට මේ ගොඩැල්ල අඩි 140 ක් පමණ වටකුරුවේ මෙහි රවුමට කුළුණු මුල්ගල් 24 කි මේ එකක් අතර පරතරය 6'0'' හෝ 4'0'' වේ රවුමට කරන ලද ගොඩනැගිල්ලකි මෙහි කණු ලියෙන් කර තිබෙන්නට ඇත මෙම මුල්ගල් මුලින් තිබූ ආකාරයටම ඇතැයි සිතිය හැකිය මෙම ගොඩනැගිල්ලට ඇතුළුවීමට තිබූ දෙරටුව පිහිටියේ නැගනහිරි දෙසිනි එහි පියගැට පෙළ අඩි 7'3'' පුළුලවේ දෙරටුව පිහිටි පැත්තේ එයට ආසන්න වනසේ ගොඩනැගිල්ල තුළම මනාව නිමවන ලද ශෛලමය ආසනයකි. මෙය අඩි 14'3'' × 6'3'' ප්‍රමාණ වූවකි. පැරණි ආසනඝරවල ආසන වලට සම්පූර්ණයෙන්ම මෙය සමානය. (ආසනය තබා ඇත්තේ ගඩොළු අත්තිවාරමක් මත සවිකරන ලද කලුගල් මතය. එහි උස අඩි 3'10'' කි.) මේ ගොඩනැගිල්ල දූර්ලභ ගනයේ ආසනඝරයකැයි සිතිය හැකිය.

1- 1- 14 ඉහතින් කී වටකුරු ගොඩනැගිල්ලට පහතින් තවත් එම වර්ගයේ ගොඩැල්ලක් වේ. එහෙත් එය ඕවාල හැඩයෙන් යුක්තය. මෙහි කුළුණුමුල්ගල් 48 කි මෙහි එක එක පැත්තක මේවා දෙපේළියට සිටිනසේ පිහිටා තිබේ. ගොඩැල්ලේ මැද ගල්කණු බිම්මට්ටමටම කැඩී විනාශ වී ඇත. නැගෙන්හිරි පැත්තෙන් තිබුනු දෙරටුවක සටහන්ද ඇත. මේ ගොඩැල්ලේද ශෛලාසනයක් තිබී එය කිසියම් පිරිසක් විසින් ගෙන ගොස් කඩා පාරට යටකරන ලදැයි කියති. මෙම ගොඩැල්ල දැනට ඇති ප්‍රමාණයට අඩි 211 වටකුරුවෙයි.

1- 1- 15 මුලින් 1- 1- 13 ට කියන ලද ගොඩැල්ලට සමාන්තර වන සේ උතුරු දෙසින් පිහිටි ස්තූපයකි මෙය දැනට උස අඩි 30 කි වට අඩි 192 කි ගරා වැටී ශෙෂවූ කොටසවේ මෙහි මැදින් අඩි 16 වට, අඩි 20 ක් ගැඹුරු වලක් හාරා එහි ධාතු ගර්භයද විනාශකර ඇත. මෙය නිරුපද්‍රැතව තිබුනා නම් ඉතා දැකුම්කලු ස්තූපයක් වනවාට සැකනැත, මළුව වශයෙන් තිබූනු කොටස් බොහෝ සෙයින් විනාශකර තිබේ පාර කපා ඇත්තේ මෙය අසළින් නිසා එයින්ද වෙනස්වූ කොටස් ස්වල්ප විය නොහැකිය මෙය අද ' මියුගුණ සෑය'' නමින් හැඳින්වේ මෙය වටා

සිරිපතුල් ගල් 4 ක් තිබී ඇත. ඒවා මිරිස් ගල් සඳහා කිසියම් පිරිසක් විසින් ගෙනගිය බවට වයස 65 වූ අප්පුහාමි හීන්අප්පු මහතා කීවේය, ඔහු පුළුකුණාවට දුරින් 19 කොලනියේ පදිංචිව සිටී. ස්තූපය වර්ෂ 4කට පෙර (1977) කිසියම් පිරිසක් විසින් හාරන ලදැයිද කීය.

II කන්දේ මැද තලාවේ පිහිටි ගොඩනැගිලි- පුළුකුණාකන්ද මැද විශාල තලාවකි. එහි දකුණට හා උතුරට බෑවුම්වේ. මේ කොටසේ ගොඩනැගිලි රැසක් පිහිටි නමුත් ඒවා හඳුනා ගැනීමට නොහැකි තරමට විනාශකර ඇත. මුළු තලාවම නටබුන් සහිතය. මෙහි සියලු නටබුන් විනාශවනසේ හේන් ගොවිතැන් කර මයියොක්කා, කෙසෙල්, ඉරිඟු ආදිය වගාකර වෙනත් ජාතිකයෙකු ගෙයක් සාදගෙන පදිංචිව සිට ඇත. මෙහි නටබුන් සෑහෙන පමණ විනාශකර ඇත්තේ ඔහු විසින් බව පෙනේ.

1. 2. 1 කඳුමත තලාවේ උතුරු කෙළවරෙහි ගඩොළු හා කළුගල් කැට සහිත ගොඩැල්ලකි. මෙය වට අඩි 210 ක් වේ. මෙහි මැද අඩි 28'6''වට ඇති අඩි 12'6''ක් ගැඹුරැති වලක් හාරා තිබේ. මෙය ස්තූපයකි. එහි ගර්භය සහමුලින්ම විනාශකර ඇත. ධාතු ගර්භයේ ගල්ලෑලි කුළු ගසා කඩා දමා තිබේ. ගඩොලක ප්‍රමාණය 10'0×0'9 වේ. මෙම ස්තූප ගොඩැල්ලට අඩි 20 ක් දුරින් ස්තූපයේ ශෛලමය ඡත්‍රය කැඩී වැටී ඇත. ස්තූපය පාමුළ පියගැට පෙළක ශෙෂ දක්නා ලැබේ.

1- 2- 2 ඡත්‍රය වැටී ඇති ස්ථානයට අඩි 50 ක් දුරින් ගොඩනැගිල්ලක ශෙෂ ඇත. මෙහි ගල්කණු පහක් කෙළින් තිබේ. ඒවායේ එකකට එකක් දුර ප්‍රමාණයන් 20'4 , 8'3'' , 15'9' , 14'0 වේ. මේ කණු සිවුරැස්ය. ඒවා අහල් 10 × 11 පමණවේ. මේ ගොඩැල්ල අසල පියගැට පෙළක ගල් 9 ක් විසිරී ඇත. එයට අඩි 25  යි. අහල් 6 පමණ දුරින් දෙරටුපාල රූපයක ඉහල කොටසේ කැබැල්ලක් මට හමුවිනි. මෙය ඉතා කලාත්මක වේ.

1- 5- 1 මුලින් කියනලද ගොඩනැගිල්ලට අඩි 38 ක් දකුණින් විශාල පොකුණකි. මෙය දල වශයෙන් වට අඩි 564 පමණ වේ. මෙහි උතුරු පැත්තෙන් පොකුණට බැසීම සඳහා සාදන ලද පියගැට පෙළකි. එහි පාමුළ අඩි 7 කි. පියගැට 13 ක් දැනට තිබේ. පොකුණ වටා පුළුල් බැම්මක් බැඳ තිබේ. වැඩි ජලය උතුරා බැසයාම සඳහා ඇළ මාර්ගයක් දකුණු පසට කපා තිබේ. පොකුණ ගොඩවී ඇතත් දැනටද මද ජලයෙන් යුක්තවන අතර අඩි 20 පමණ ගැඹුරවේ.

1- 2- 3 පොකුණට අඩි 28 ක් දුරින් ගල්කණු දෙකකි. මෙහි එක කණුවක හඳකොටා තිබේ .

1. 2. 4 ඉහතින් කී කොටසට අඩි 66 ක් දුරින් විශාල පතා බැම්මක ශෙෂ දක්නා ලැබේ. මේ බැම්ම නිසා ගොඩනැගිලි තිබූ තලාවේ අංගණය සැකසෙන්නට ඇත.

1. 2. 5 පොකුණට දකුණින් අඩි 130 ක් දුරින් විශාල ගොඩනැගිල්ලක ශෙෂ දක්නා ලැබේ. මෙහි එක පැත්තකින් අඩි 26 ක් දිග පතා බැම්මකින් සවිරකර ඇත. ගොඩනැගිල්ලට අයත් ගල්කණු රැසක් විනාශ වී ඇති අතර දැනට කණු 11 ක් ශෙෂව තිබේ. මේවා උස 7',10'' , 6',9'' , 5',0'' , 1',0'' 6',7'' , 4',6'' , 4',8'' , 3',11'' , 6',0'' 3',0'' , 4',3'', පමණවේ. ගොඩනැගිල්ල අසළ නැගෙනහිරින් කණු 2 ක් ඇද වැටී තිබේ. ඒවා 6',1'' , 4',0'' පමණ උසවේ.

1. 2. 6 ඉහතින් කී ගොඩනැගිල්ලට අඩි 35 දකුණින් තවත් ගොඩනැගිල්ලක ශෙෂ තිබේ. මෙහි දැනට කණු 5 ක් ඇත. ඒවා උස 6'3'' , 5'4'' , 3'3'' , 4'9'' , 6'4'' ප්‍රමාණවේ. මේ ගොඩනැගිල්ල හැරුණුවිට තවත් ගොඩනැගිලි කීපයක ශෙෂ කණු ආදිය තැන තැන විසිර තිබේ. ඒවා සියල්ල කැබලිවලට කඩා විනාශකර ඇත්තේය.

## පියගැට පෙලවල් හා මාගී:

1. 4. 1 කන්ද පාමුළ සිට කන්දේ මත තලාවට නැගීම පිණිස සාද තිබුණු ප්‍රධාන මාගීය සුවිසල් පියගැට පෙළකි. මෙය අඩි 600 පමණ දිගට තිබෙන්නට ඇත. කොටස්කීපයකට සිටින සේ කරවන්නට ඇතැයි සැලකිය හැකිය. මෙහි පියගැට හා දෙපස අල්ලා තිබුනු ගල් පුවරු සියල්ලම ගැලවී සමහරක් විනාශව ඇති අතර සමහරක් පසින් යට වී තිබෙනු පෙනේ. මෙහි සැලැස්ම පාද මතුකරන තුරු සවිර යමක් කීම අපහසුය. අද කන්දට නැගෙන අඩිපාර වැටී ඇත්තේ මෙම පියගැට පෙළ තිබූ සෙව්වෙනි.

1. 4. 2 ලෙන්වලට හා ගොඩනැගිලිවලට යාමට තිබුනු කුඩා පාරවල් හා පියගැට පෙළවල් වැඩි වටිනා කමක් නොමැති වෙනත් කන්ද උතුරු පැත්තෙන් තලාවට පිවිසීමට තිබුනු මාගීය සැලකිය යුත්තකි. මෙහි කන්ද දෙපසින් උස්වනසේ පිහිටි අතර මැදින් බැවුම්වී තැන්නක ස්වරූපය ගෙන කඳු පාමුළ දක්වා විහිදේ. මේ කොටස අඩි 100 ට වඩා පුළුල්වේ මෙය පලන ලද ගල්ලැලි අතුරා කරන ලද මාගීයක ස්වභාවය ගනී. කාලයක් තිස්සේ සේදී යාම නිසා බොහෝ සෙයින් විනාශවී ඇතත් මාගීය හොඳින් හඳුනා ගැනීමට හැකිවන ශෙෂ තවමුත් දක්නා ලැබේ.

1. 4. 3 කඳු තලාවේ දකුණු අතට වනයේ පිහිටි ගල් පර්වතවල කපන ලද පියගැට කීපය බැගින් ඇති පියගැට පෙලවල් තුනක් දක්නට ලැබේ. මේවා ඉතා පුරාණ යුගයේ නිර්මාණය කරන ලද ඒවා බව පෙනේ. කන්දේ බොහෝ තැන කුඩා පියගැට පෙළවල් රැසක්ම ඇත. ඒවා ලෙන් වලට යාමට කරවන ලද බව පෙනේ.

## ලෙන් කර්මාන්තය:-

පුළුකුනාවේ තටබුන් අතුරින් වැදගත් තැනක් ලෙන් කර්මාන්තයට හිමිවේ. කඳුවැටියේ හැම පැත්තකම විවිධ ප්‍රමාණයේ ලෙන් පිහිටා ඇත. මේවායින් සමහරක කටාරම් කොටා ලිපි පිහිටුවා ඇත. සමහරක කටාරම ඇතත් ලිපි නැත. සමහර ලෙන් ස්වාභාවික ලෙසම තිබේ. මෙම ලෙන් වර්ගය ඉතා වැදගත්ය. ගල මැදින් හාරණලද්දක්සේ පෙනෙන එබඳු ලෙන් කීපය ඉතා දක්ෂකළුවේ. මේවා වඩා විශාල නොවූවත් තනි අයකුගේ වාසයට ප්‍රමාණවත්ය. සියලුම වර්ගවලට අයත් ලෙන් 70 ක් පමණ කඳුවැටියේ ඇත. මේ ආසන්නව තනිව පිහිටි පර්වත තල ගණනක් තිබේ. ඒ සෑම එකකම මුදුන්වල ගඩොළු ගොඩවල් තිබේ. මේවා වෘත්තාකාරය. ස්තූප හෝ සොහොන් කොත් විය හැකිය. මේවා ගරා වැටී විනාශවී ගඩොළු පමණක් තරමක් ශේෂවී තිබේ. එබඳු වර්ගයේ එක ස්තූපයක් අසල තිබී භස්මාවශේෂ ස්වල්පයක් මට හමුවිය. මෙය මෙහි ඵුස්සදෙව තෙරුන්ගේ ලෙණ හැටියට සෙල්ලිපියක සඳහන් වන ලෙණ අබියස ගල්තලය මතවූ ගඩොළු ගොඩැල්ලේ තිබිනි. එය වැස්සට සෝදගොස් ගඩොළු කැට අතර හිරවී තිබිනි. මගේ අදහස මෙය ලෙණේ විසූ ඵුස්සදෙව මහරහතන් වහන්සේගේ භස්මාවශේෂ බවයි. ලෙන්වලතිබී පිටපත්කළ ශිලා ලේඛන 14 ක් පළකර ඇත.[1] මීට අමතරව මවිසින් සොයාගත් ලිපි 3 ක්[2] මුලින් දක්වා ඇත. තවත් ලිපි තිබිය හැකිය. පළකර ඇති ලිපි පහත සඳහන්වේ.

1* එක උතිරික බණක ඵුශදෙව තෙරහ මනොරමෙ.

අංගුත්තර නිකාය භාණක ඵුස්සදෙව තෙරුන්ගේ මනොරම්‍ය (ලෙණ දෙන ලදී)

2* මනොරමෙ.

මනොරම්‍ය ලෙණ (දෙන ලදී)

3* බත නමලිය ලෙණෙ

ස්වාමි නාමලීගේ ලෙණ (දෙන ලදී)

4* **බත තිශ බුතිය ච බත කුඩක තිශහ ච**
සවාමි තිෂ්‍යභූතියගේ ද සවාමි

5* **වරුණ ගුතහ ලෙණෙ ශගශ.**
වරුණ ගුප්තගේ ලෙණ සංඝයාට (දෙන ලදී)

6* **අශිය අනුඩිය ලෙණෙ.**
ආයුෂ්මත් අනුලාගේ ලෙණ (දෙන ලදී)

7* **ගපති විශකහ ලෙණෙ**
ගෘහපති විශාඛගේ ලෙණ (දෙන ලදී)

8* **සුමනහ ලෙණෙ**
සුමනගේ ලෙණ (දෙන ලදී.)

9* **උපශික කණය ලෙණෙ ශගශ**
උපාසිකා කෘෂ්ණාගේ ලෙණ සංඝයාට (දෙන ලදී)

10* **පුත පිතහ තිශරකිතහ ලෙණෙ ශගශ දිනෙ**
පුත්‍රාගේ (ද) පියාගේ(ද) තිෂ්‍යරක්ෂිතගේ (ද) ලෙණ සංඝයාට දෙන ලදී.

11* **උපශික ශමිදතය ලෙණෙ ශගශ**
උපාසිකා සවාමිදත්තාගේ ලෙණ සංඝයාට (දෙන ලදී)

12* **අශ චිත ගුතහ අශ උපතිශහ**
ආයුෂ්මත් චිත්‍ර ගුප්තගේ (ද) ආයුෂ්මත් උපතිෂ්‍යගේ (ද ලෙණ දෙන ලදී,)

13* **ශගශ අශ ඝිනුහ ච මහගණක වහලිය ච ලෙණෙ.**
සංඝයාට ආයුෂ්මත් දියණියගේද මහා ගණකාධිකාරී වහලි ගේද ලෙණ (දෙන ලදී)

14* **උපශික කණදශිකය ලෙණෙ ශගශ.**
උපාසිකා කෘෂ්ණදර්ශිකාගේ ලෙණ සංඝයාට (දෙන ලදී)

# සමාලොචනය.

පුළුකුණාවේ ඉතිහාසය පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීම ඉතා දුෂ්කර කරුණකි. මෙහි ඇති එකම ලිපියකින්වත් ඒ ගැන යමක් දත නොහේ. සමහර විට පසින් යටවී ඇති නටබුන් අතර ශිලා ලිපි තිබීමට බැරි නැත. ක්‍රමික කැණීම් වලින් තොරතුරු පාද ගන්නා තුරු[3] යමක් කිව හැක්කේ අනුමාන වශයෙනි. දැනට හමුවී ඇති ලෙන්ලිපි අනුව මෙහි

ආරම්භය ක්‍රිස්තු පූර්ව යුගයේ සිදුව ඇති බවත් විසිරී ඇති විවිධ නටබුන් අනුව වරින්වර සංවර්ධනය වූ බෞද්ධ ආරාමයක් බවත් සපිරලෙසම සඳහන් කළ හැකිය. මේ ස්ථානයේ පහත් තැනිබිමේ ඇති ස්තූපය හඳුන්වනු ලබන්නේ මියුගුණු සෑය නමිනි. කඳු කොටස හඳුන්වනු ලබන්නේ විහාරකන්ද නමිනි. අසල පිහිටි දෙමළ ගමේ නමින් සියල්ලම පුළුකුණාව යනුවෙන් වර්තමානයේ හැඳින්වේ. මුලින්ම සඳහන් කළ නම අප අතර කුහුලක් ඇති කරයි. දැනට පැතිරීඇති ප්‍රවාදයක කියැවෙන හැටියට මෙම පූජනීය ස්ථානය දුටුගැමුණු රජතුමා කරවූ බවත් මෙහි ථෙරපුත්තාභය තෙරුන් වැඩසිටි බවත් කියැවේ. දුටුගැමුණු රජු මියුගුණු සෑය විශාල කර බැඳවූ බව වංශකථාවල[4] සඳහන් වෙයි. ඒ ප්‍රකට මහියංගණ ස්තූපය බව දැනට පිළිගෙන තිබේ. පුළුකුණාවේ ඇති මියුගුණු සෑයත් ඔහු අතින් තැනුනක් නම් එය විමසා බැලිය යුතු වැදගත් කරුණකි.

දුටුගැමුණු රජුගේ ද්‍රවිඩ සංහාරයේදී පළමු සටන කෙරුනේ මහියංගණයේදීය.[5] මෙම මහියංගණය අද ඒ නමින් සලකන ස්ථානය ලෙස පිළිගෙන ඇතත් එය අභේද්‍ය සාධක මත පිහිටියක් නොවේ. දුටුගැමුණු රජුගේ සටන් ගමන් මගද දැනට පිළිගෙන ඇති පිළිවෙළට සංශෝධන ඉදිරිපත්වී තිබේ.[6] මා සිතන අන්දමට දුටුගැමුණු රජු ගියේ දීඝවාපිය හරහාය. ඔහු දීඝවාපියේ දෙමළ රජුන් දෙදෙනකු පරාදකර අම්බර ගාමය අසල මහා අම්බිලපිට්ටියිපියංගණයේදී යොධ බල විමසා බැලීය.[7] මෙම කරුණු ඒ අන්දමින් සිදුවිනි නම් ඔහු සටන් කළ එක් බිමක්; එනම් මියුගුණු බිම වර්තමාන පුළුකුණා භූමිය විය යුතු සේ පෙනේ. ගැමුණු-තිස්ස යුද්ධය පවත්නා අතර මහවැලි නදිය දිගට බලකොටුවල සිටි ද්‍රවිඩයෝ රෝහණයට ඇතුළුව ඉදිරිය කරා ගමන් කරන්නට ඇතැයි සැලකීමට පුළුවන. දුටු ගැමුණු - ද්‍රවිඩ සටන් සිදුවූයේ මහවැලි නදිය දිගටම යයි සැලකීම එතරම් සුදුසු නොවේ. වඩමන්තොට දක්වා ඉදිරියට ගිය රජුගේ සේනාව නැවත මලයරට දක්වා අවුත් එහිසිටි දමිළ බලකොටුද විනාශ කරන ලද බවට සාධක තිබේ.[8]

පුළුකුණාවේ ලෙන් ලිපි ක්‍රිස්තු පූර්ව යුගයට වැටෙයි. මේවායින් එකකවත් රාජකීය සම්බන්ධයක් දක්වන සටහනක් නැත. ගිහියකු විසින් දැරිය හැකි වැදගත් තනතුරක් වන ''මහ ගණක'' තනතුර දැරුවකු හැරෙන විට සෙසු සියලු දායක පිරිස සාමාන්‍ය මට්ටමේ වූ අයම වෙති. අංගුත්තර නිකාය භාණක ඵුස්සදෙව තෙරුන් වහන්සේ ගැන එක ලිපියක සඳහන්ව තිබේ. මේ නමින් තෙරවරු කීපනමක් ගැන පොතපතේ සඳහන්ව ඇත. එයින් එක් නමක් කාළකන්දර විහාරවාසී ඵුස්සදෙව තෙරණුවෝය.[9] මුන්වහන්සේ සද්ධාතිස්ස රජුගේ සහෝදරියකගේ පුතෙකි. තවත් තෙර-නමක් නම් ත්‍රිපිටක ඵුස්සදෙව තෙරණුවෝය.[10] උන්වහන්සේ කාවන්තිස් රජු දවස සිටි කෙනෙකි. සමන්ත පාසාදිකා විනයට්ඨ කථාවේ[11] කටඅන්ධකාරවාසී ඵුස්සදෙව නමින්ද සාරසංග්‍රහවේ[12] කාලන්ධකාලවාසී

ඵුස්සදෙව නමින්ද සද්ධර්මරත්නාකරයේ[13] රුහුණේ කාලකන්ද විහාරවාසී ඵුස්සදෙව නමින්ද විසුද්ධිමග්ගයේ[14] කටකන්දරවාසී ඵුස්සදෙව නමින්ද රහතන් වහන්සේ නමක් ගැන සඳහන් වෙයි. තවද ජාතක අටුවාවේත්[15] දීඝනිකායට්ඨ කථාවේත්[16] ඵුස්සදෙව නමින් තෙර නමක් ගැන සඳහන් වෙයි. මේ කථාවල දක්වෙන සිද්ධි සසඳා බලන විට මේවායින් කියැවෙන්නේ එකම තෙර නමකි. මේ සිද්ධි සද්ධාතිස්සරජුගේ යුගයේ හෝ ඊට පෙර සිදුවූ ඒවා බව පෙණෙන නිසා ඵුස්සදෙව තෙරවරුන්ද එම යුගයේම සිටි අය බවට සැක නැත.

සද්ධාතිස්ස රජුගේ සහෝදරියකගේ පුත්‍රයකුවූ ඵුස්සදෙව තෙරුන් තෙල කී ධර්ම කථාවලට සම්බන්ධ තෙරුන් යයි සැලකීමට පුළුවන. දෙකුන්දරවැවෙන්[17] ලැබුනු බ්‍රාහ්මී ලිපියක ප්‍රමුඛ ඵුස්සදෙවගේ දියණියකවූ අභි අනුරාධා නම් කුමරියක් සරණ පාවා ගෙන සිටි ආයෂි ඵුස්සදෙව නම් කුමාරයකු ගැන සඳහන්වේ. ඔහු කාගේ කවුදැයි සඳහන් නොවේ. සමහරවිට සද්ධාතිස්ස රජුගේ සොයුරියකගේ පුත්‍රයා ඔහුදැයි විමසා බැලීමට සාධක හමුවී නැත. ඇතැම් රජකුමාරවරු කලක් ගිහිජීවිතය ගතකර පසුව පැවිදි වූ බවට කොතෙකුත් සාධක තිබේ.

මේ හැර කොරවග්ගල[18] හා මිහින්තලයේ[19] ඇති ලෙන් ලිපි දෙකක ඵුස්සදෙව තෙරවරු දෙනමක් ගැන සඳහන්වඇත. මූන්වහන්සේ ලා එක නමක්වත් "අංගුත්තරභාණක" පැවිය දරූ බවක් ඒ සටහන් වලින් හෙළි නොවේ. එහෙත් උන්වහන්සේලා සියලු දෙනාම ක්‍රි: පූර්ව යුගයේ ජීවත්ව සිටි අය වෙති. ගැමුණු රජුගේ යොධයකුවූ ඵුස්සදෙවද පැවිදිව රහත්වූ බව ප්‍රකාශවේ. මේ අනුව මෙහි විසූයේ උන්වහන්සේද යන්න විමසා බැලීම වැදගත්වේ. පුළුකුණාවට ආසන්නව ඇති සාන්තමලේද[20] බොහෝ ආරාමික නටබුන් තිබේ. වටා පිටාවේ පිහිටි සියලු කඳුගැට වල සවල්ප වශයෙන් හෝ නටබුන් තිබීමෙන් පෙනියන්නේ මේ මුලු ප්‍රදේශයේම ක්‍රි: පූර්ව යුගයේ ඉතා දියුණු සිංහල බෞද්ධ බලයක් තිබූ බවය. පුළුකුණාවට බටහිරින් පිහිටි රජගල, පියන්ගල විහාර මාගම් පරපුරේ රජ දරුවන්ගේ කෘතීන් බව අභිලේඛන වලින් තහවුරුවී ඇත්තේය. එමෙන්ම පුළුකුණාවේද සමීප වකවානුවේ බෞද්ධ ආරාමයක් ආරම්භ වන්නට ඇත. එය වරින්වර සංවර්ධනයට පත්වූයේය.

මෙහි ඇති ආසනඝර දෙක ඉතා විශාල වැදගත්කමකින් යුක්තවේ. මේ වර්ගයේ දුර්ලභ නිර්මාණ ලෙස මේවා සැලකිය හැකිය. එහෙත් මෙහි කිසිදු ගොඩනැගිල්ලක නිර්මාතෘවරයකු ගැන දැන ගැනීමට සාධකමෙතාක් හමුනොවීම මෙහි ඉතිහාසය එළිදරව්කර ගැනීමට බාධකයකි.

දීඝවාපි රාජ්‍යය වල්බිහිවීමත් සමග තෙල පුදතැනද වනයට බිලිව මිනිස් පහසින් තොර විනි.

අභිලේඛන ඇතත් උපකරණ නොමැති නිසා පිටපත්කර ගැනීමට නොහැකිවූ ස්ථාන මේ තැන්වල ලිපි සමහරක් පරීක්‍ෂාකර ඇතත් මෙහි සඳහන් ලිපි පරීක්‍ෂාකර නොමැති ඒවාවේ.

**1. හලඹගල විහාරය;-**

නිකවැරටියේ සිට අඹන්පොල පාරේ බෝගොල්ලා ගමින් හැරී කිː මීː 4 පමණ දුරින් පිහිටි තැනකි. පර්වත ලිපියකි.

**2 මුතුගල්ල:-**

පොළොන්නරු දිසාවේ, මනම්පිටිය පූතානි මාර්ගයේ 58 කණුවෙන් හැරී කි: මී: 6 පමණ ගියපසු හමුවන මුතුගල ගම්මානයේ ඌරඩිකුලම් වැව ඉස්මත්තේ බොහෝ නටබුන් ඇති තැනකි. පර්වත ලිපි 2 මට හමුවිය.

**3. වෙහෙරගල:-**

ත්‍රිකෝණමඩු සඤ්ගොව්පල අසලය. මනම්පිටිය පූතානි මාර්ගයේ වැලිකන්ද හන්දියෙන් හැරී යායුතුය. ලෙන්ලිපි හා විවිධ නටබුන් රැසක් ඇති තැනකි.

**4. කඩවත් මඩුව:-**

පොළොන්නරු දිසාවේ මනම්පිටිය පූතානි මාර්ගයේ කි: මී: 109 කණුව ළඟින් කි: මී: 1 පමණ දුරින් පිහිටි බෝධිරාජාරාමය විවිධ නටබුන් ඇති තැනකි. පුවරු ලිපියක් තිබේ.

**5. සිරිඹෙඩ:-**

ඉහතින් කී මාර්ගයේම 108 කණුව අසළින් යාර 300 පමණ දුරිනි. ලෙන් ලිපියකි. අපැහැදිලිය. විවිධ නටබුන් ඇති තැනකි. දණ්ඩිය ජත්‍ර ගලක් මෙහි තිබේ.

**6 හෙඹරව:-**

මයියංගණයට උතුරින් පිහිටි හෙඹරව විදුහල අසල බෝධිය ළඟ ගලක ඇති ලිපියකි.

**7. වෙහෙර පොකුණ:-**

දඹාන් - කඩුපහර ඇල්ල පාරේ 8 කණුව අසල ඇති බොහෝ නටබුන් ඇති තැනකි. වටිනා ටැම් ලිපියක් හා පර්වත ලිපි දෙකක් ඇත.

**8. හෙනන්නේගල:-**

කුඩා විලට කි: මී: 6 පමණ දුරින් දෙහි අත්ත කණ්ඩියට ආසන්නව පිහිටි බොහෝ නටබුන් පිරි ගල්තලාවකි. මෙහි පර්වතයේ කොටා ඇති ලිපි 10 ක් මට හමුවිය. තවත් තිබිය හැකිය.

**9. හබරත්තෑව:-**

දමනේවෙල අරලගන්විල මාර්ගයේ 9 කණුව අසල පුරන්වගිය හේනක අඩි 4 උස වැම් ලිපියකි. මෙහි තුන් පැත්තක අකුරු තිබේ.

**10. දේවගල:-**

මනම්පිටිය අරලගන්විල මාර්ගයේ 5½ කණුව අසලින් නැගෙනහිරි අතට කි: මී; 3½ පමණ දුරින් පිහිටි විවිධ නටබුන් ඇති තැනකි. ලෙන් ලිපි 2 ක් තිබේ.

**11. වේළු වෙහෙර:-**

බදුල්ල දිසාවේ කන්දකැටියේ පිහිටි ස්ථානයකි. විවිධ වර්ගයේ ලිපි හයක් පමණ තිබේ.

**12. මැද බැද්ද;-**

බලංගොඩට කි: මී: 25 පමණ දුරින් පිහිටියේය. වෙහෙරගල ලෙන් ලිපියකි.

**13. මැද බැද්ද -**

වැවක් අසල පුවරු ලිපියක කොටසක් තිබේ.

**14. නාමළුව**

මොනරාගල දිසාවේ මහකලු ගොල්ලෙන් කි:මී: 6 පමණ දුර හැඩඔය ඉවුරේ පිහිටි විවිධ නටබුන් ඇති තැනකි. පර්වත ලිපි 12 ට වැඩිය ඇත.

**15. බුදුගල්ලෙණ:-**

මුලින් දක්වා ඇති පරිදි බුදුමැදුර ලෙණ අබියස පර්වතයේ කෙටූ ලිපියකි.

**16. කන්දේගම කන්ද:-**

පොලොන්නරු දිසාවේ මාදුරුඔය වැඩ බිමට නුදුරින් ඇති අරණ්‍යසේනාසනයේ දංගෙය අසල පර්වතයේ බෑවුමේ කොටා ඇති ලිපියකි.

**17. සැලව එළිය:-**

අම්පාර දිසාවේ පානම සැලව එළිය කුඹුරුයායේ පුවරු ලිපියකි. මෙය කුඩුම්බිගල තපෝවනයට ගෙනගොස් තබා තිබේ.

**18. ගල්පොකුණ ආරණ්‍යය:-**

අනුරාධපුර දිසාවේ කැබිතිගොල්ලෑව පුල්මුඩේ පාරේ පිහිටි ස්ථානයකි. මෙහිද විවිධ නටබුන් තිබේ. පර්වත ලිපි පහක් තිබේ.

**19. මීගහපිටිය:-**

මොනරාගල දිසාවේ ඔබ්බේගොඩ මාරි අරාව මාර්ගයේ මීගහපිටිය හන්දිය අසල පිහිටි ලෙන් දෙකකි. මෙහි ලිපි දෙකක් තිබේ.

**20. වේරගොඩ.-**

මොනරාගල දිසාවේ සියඹලාන්දූවට ආසන්න ස්ථානයකි. පර්වත ලිපියක් ඇත.

**මුරුංගාහිටිකන්ද -**

අනුරාධපුර දිසාවේ මඩාටුගම නගරයට සැතපුම් 2 පමණ ඊශාන දිගින් පිහිටි පර්වතයකි. ලෙන් ලිපි 3 කි. එකක "ශගශ" යන්න පමණක් පැහැදිලිව පෙනේ.

**සඳගල්පාය:-**

අනුරාධපුර දිසාවේ කැකිරාව - තලාව පාරේ කැකිරාව ම:ම: විදුහල අසල නටබුන් බහුල තැනකි. පර්වත ලිපිය විනාශවෙමින් තිබේ. මෙහි බොහෝ පුරාණ දේ කඩා අලුත් කෙරේ.

**කඹුගම්පලගම;-**

පැරණි හල්මිල්ලෑව කුරුණෑගල දිසාවේ ගල්ගමුව උප දිසාපති කොටසේ කලාවැව - තඹුත්තේගම ජයමාවතේ කලංකුට්ටිය හන්දියෙන් සැතපුම් 2 පමණ දකුණට පිහිටි පර්වත තලාවකි. පර්වතලිපිය විනාශවෙමින් පවතී.

**ගල්ලෙන් විහාරය:-**

අනුරාධපුර දිසාවේ, ඉහතකී ජයමාවත එප්පාවල පාරේ, නල්ල උලව්විය හන්දියෙන් සැතපුම් 2 ක් පමණ උතුරට පිහිටි දඹිණිය පර්වත දෙකකි. ස්තූපය අසල ගලේ පර්වත ලිපි 2 කි.

### හල්මිල්ලගල දුමුගැමුණු විහාරය:-

අනුරාධපුර දිසාවේ, අනුරාධපුර - පුත්තලම පාරේ නොච්චියගම හන්දියෙන් සැතපුම් 1 පමණ දුර විශාල පර්වත තලාවකි. මෙහි ලිපිය පතුරු ගැලවී බොහෝ විනාශවී ඇත,

### ඉහලගල:-

අනුරාධපුර දිසාවේ ගලදිවුල්වැව - හල්මිල්ලැව පාරේ සැතපුම් 4 කණුවෙන් දකුණට පාරට පෙනෙන දුර, කුරුළුපෙත්තාගල රජමහා විහාරයට මදක් දුරින් පිහිටි පර්වතයේ පොකුණ ළඟ ලිපි දෙකකි.

### බිලිබැව:-

අනුරාධපුර දිසාවේ ඔට්ටප්පුව රජමහා විහාරයට සැතපුමක් පමණ දුරින් පිහිටි බිලිබැව ප්‍රකට වැව් ලිපියට යාර 100 ක් පමණ දුරින් පසින් යටවී ගිය වැව් ලිපියක් මතුවී තිබේ. මෙය ඇලක් කපන විට මතුවී ඇත.

## අංකිත ස්ථාන සටහන්, විමර්ශන කොටස

1. එපිග්‍රපියා සෙයිලනිකා ඛාණ්ඩ කීපය Ephigraphia Zeylanica (E.Z.) හා සෙල්ලිපි සංහිතා I Inscription of Ceylon Vol. I (TC) සමහර ලිපි Ancient Inscription in Ceylon (Edward Muller) (AIC) Ancient Ceylon (H. Parker) (AC) The Journal of the Royal Asiatic Society (Ceylon Branch) (JRASCB)
University of Ceylon Review (UCR) Ceylon Journal of Science Sec (G) (CJS) ආදී ග්‍රන්ථ හා සඟරා කලාප වල පළවී තිබේ.

2. ඌණ පූරණ සහිතො මහා වංසො පි. බුඩදත්ත මහා ථෙරෙන සංසොධිතො (1959) XI - 5 (ම.ව.) හා ථූපවංසාදියේද දක්වේ.

3. EZ Vol. IV P 165

4. ම. ව. XLV. 53 . 54 පූජාවලිය 780 පිට

5. ම. ව. XXXVIII. 49

6. ම. ව. XXII - 8

7. ම, ව. XIX - 53, 61

8. JRASCB Vol. V. P2 PP 145. ලංකා ඉතිහාසය 1 කාණ්ඩය 1 භාගය ලෙඛක හිමිගේ "මාගම රාජධානිය" මේ ගැන දීර්ඝ විස්තරයක් කර ඇත.

9. මිහින්තලේ උත්තිය රජුගේ ලිපිය හා පිච්චින්දියාවේ දෙවානම් පියතිස්ස රජුගේ වෛද්‍යවරයාගේ ලිපිය

10. ASCAR 1950 P. 28 හා IC, P-37

11. ASCAR 1933. P 53

12. ම. ව. XXII 4 පාලිපූපවංසො පණ්ඩිත ඤාණවිමල මහා ථෙර සංශොධනය 1962 - 47 පිටුව - පූජාවලි 34 පරි: රසවාහිනි, කාකවණ්ණතිස්සවත්ථු

13. ස්තූපවංශය, දෙවුන්දර වාචිස්සර ථෙර සංශොධනය. සද්ධර්මාලංකාරය මකුළුදූවේ පියරතන ථෙර සංශොධනය.

14. AIC P 73

15. IC, අංක 84.

16. UCR VII, No 4. 1949 P 238 ම. ව. XXII - 7 - 0
ධාතුවංශය, කුමාරතුංග සංස්කරණය 23, 24 පිටු පූජාවලි 34 පරි:

17. JRASCB Vol V P2. PP 140 ලෙඛක හිමිගේ "හබුතගල විහාරය" පොත.

18. කාවන්තිස්ස රජුගේ අභාවයෙන් පසු ලියැවුනු කඳෙහෙල ලිපියේ ඔහු "මහරජ" වශයෙන් දක්වේ.

19. ම. ව. XXII, 1, 71

20. ASCAR. 1935; 14 - 1939 - 71
JRAS Vol. 36. No. 98

21. ASCAR. 1911 - 12 No. 97. 23

22. IC අංක 301

23. අංක 19 බලන්න.

24. IC අංක 655, 832, 960

25. AC. P. 454, CJS. Vol. II P2. PP 115-

26. ධා. ව. 29 පිටුව.

27. ලංකා ඉතිහාසය 1. කාණ්ඩය 1. භාගය 144 පිටුව

28. දුටුගැමුණු මහ රජතුමා (1980) 14 පිටුව.
29. ධා. ව, 39 පිටුව.
30. VAMSATTHAPPAKASINI (1935) G. P. Malalasekara
P 307 (V A M)
31. CJS Vol II P3. PP 202 - 204
Kegalla Report by H. C. P. Bell. (1892) P 71
32. ලෙබක හිමිගේ හඳගිරිය හෙවත් සඳගනා නුවර ග්‍රන්ථයේ මේ ගැන විස්තර එයි.

පහතින් දක්වනු ලබන්නේ මෙහි සඳහන් ස්ථාන පිළිබඳව වරින් වර කතෘ හිමියන් විසින් පුවත් පත් සඟරාවලට ලියන ලද ලිපි, වාර්තා හා ප්‍රසිද්ධකර ඇති පොත්පත් පිළිබඳ විස්තරයකි. වැඩි තොරතුරු එම ලෙඛන බැලීමෙන් දැනගත හැකිය.

**පියන්ගල :-**

1978 ජූනි 20 පිටවූ "පියන්ගල වන සෙනසුන" පොත.
1980. 2. 15 බුදුසරණ පත්‍රයේ පළවූ "පියංගල තපොවනය', ලිපිය.
1981. 01. 18 සිළුමිණ වාර්තාව,
1982. 05. 04 දිවයින "දුටුගැමුණු රජුගේ බිසව රන්මැණිකාද', ලිපිය.
1983. 06. 29 දවස වාර්තාව.

**සමන්ගල :-**

1971. 01. 26 බුදුසරණ "ගොඨාභය මිහානාගගේ පුත්‍රයෙක්ද රුහුණු රජ පවුල පිළිබඳ නවත් තොරතුරු"- වාර්තාව.
1978. 11. 10 පිටවූ "සමන්ගල මහ අරණ" පොත.
1979. 05. 03 බුදුසරණ "සමන්ගල මහ අරණ" ලිපිය.
1981. 03. 03 දිනමිණ "මහානාග වංශකථා පුවත වෙනස් කරන ශිලා ලෙඛනයක්" මුල්පිට වාර්තාව.

**මලයඩි කන්ද :-**

2514 වප් අමාවක බුදුසරණ - "රුහුණු රජ පවුල පිළිබඳ වැදිගල් සෙල් ලිපියක්" වාර්තාව.
1979. 07. 16 බුදුසරණ "මලයඩිකන්ද තපෝවනය" ලිපිය.
1981. 04. 22 දවස ' පැරණි සෙල් ලිපි රැසක් හමුවේ." වාර්තාව

**කුඩුම්බිගල:-**

1979. 10. 09 දවස ''කුඩුම්බිගල තපෝවනය'' ලිපිය.
1980. 08, 26 පිටව් 'කුඩුම්බිගල තපෝවනය' පොත

**කරඳහෙල;-**

1969, 08, 05 ශ්‍රී ලංකාදීප හබුතගල විහාරය ලිපිය
1970. පිටවූ ''මාගම රාජධානිය'' පොත.

1982. 01. 24 බුදුසරණ ''කාවන්තිස් රජතුමාගේ අත්සන යෙදූ ශිලා ලිපියක්.''

1982. 01. 24 බුදුසරණ ''කාවන්තිස් රජුගේ අත්සන සොයා ගනී.'' වාර්තාව,

1982. 03. 22 දිවයින ''කාවන්තිස් රජුගේ අත්සන හමුවෙයි.'' වාර්තාව.

1982, 04, 03 දිනමිණ ''කාවන්තිස් රජුගේ අත්සන් සංකේතය'' ලිපිය. 82..... ..... දිවයින ''කරඳ හෙලින් හෙළිවන රුහුණු ඉතිහාසය'' ලිපිය. ''කරඳහෙල විහාරය - හෙවත් හබුතගල විහාරය'' , රෝනියෝ කළ පොත 1982........1983.05.13 ලංකාදීප ''කරඳහෙල නටබුන්'' - ලිපිය.

**බුද්ධංගල:-**

1979. 07. 02 බුදුසරණ ''ඓතිහාසික බුද්ධංගල තපෝවනය.'' ලිපිය.

1979. 09. 12 බුදුසරණ ''බුද්ධංගල තපෝවනය'' ලිපිය

විද්‍යාරණ්‍ය - බුද්ධංගල කලාපය 1979, ''රුහුණු රටෙහි එකම වටදාගෙය පිහිටි බුද්ධංගල මහවන සෙනසුන.'' ලිපිය

1980 පිටවූ ''බුද්ධංගල තපෝවනය පොත.

1983. 06. 17 දිවයින ''බුද්ධංගල වන අරණයි. පොසොන් මහේ මහ උළෙලයි.'' ලිපිය

**ඕමුණගල;-**

1979. 11. 02 දිනමිණ ''මහඔය කැලෙන් සෙල්ලිපි හමුවේ'' වාර්තාව.

1980. 03. 16 සිළුමිණ ''ඕමුණගල කන්දේ නටබුන්'' ලිපිය

1981. 11. 17 දවස ''නන්දිමිත්‍රගේ නමේ තතු සෙල් ලිපියක් හෙළිකරයි'' වාර්තාව

**පුළුකුණාව:-**

1982. 3, 15 දිවයින "රහත් නමක් වැඩසිටි වෙහෙරක් සොයා ගනී." වාර්තාව
1982, 04, 16 දවස "වටිනා නටබුන් විනාශ කරලා" වාර්තාව
1982. 05. 13 දිවයින "විනාශවී යන පුළුකුණාව නටබුන්" ලිපිය
1982. 12. 20 දිවයින "රහත් නමකගේ භෂ්මාවශෙෂ හමුවේ." වාර්තාව.
1983. 01. 06 දවස "ඵුස්සදෙව නම ඇති ලිපියක්" වාර්තාව.

**ශාස්ත්‍රවෙල:—**

1981. 06 07 සිළුමිණ වාර්තාව.
1981. 08. 31 දවස වාර්තාව.
1983. 05. 26 පිටවූ "ශාස්ත්‍රවෙල මණිනාග පබ්බත බොධිගිරි විහාරය" පොත.

**බුදුපැමුන්කන්ද.-**

1982. 01. 25 දවස "මහ කැළය මැද කන්දෙන් ලෙන් විහාරයක නටබුන්" වාර්තාව.
1982. 06. 26 දිනමිණ "මහ වන මැද ශිලා ලිපියක්" වාර්තාව.
1982. 03. 01 දිනමිණ "සියඹලාන්ඩුවෙන් ගල්ලෙණක් මතුවේ" වාර්තාව.
1983. 01. 21 බුදුසරණ "බුදුපැටුන් කන්ද තපොවනය" ලිපිය
1983. 02. 10 දිවයින "අභිලෙඛන වලින් සනාථවන කතරගම රජපරපුර" ලිපිය.

**වැලියාය.—**

1979. 12. 25 දිනමිණ "මොණරාගලින් සෙල්ලිපි මතුවේ." වාර්තාව.
1981. 09. 18 දිනමිණ මයුරගිරි තපෝවනය ලිපිය.
1981. 10. 04 දිනමිණ "මයුරගිරි තපෝවන නටබුන්" වාර්තාව.

**ඕළුවා පොකුණ:—**

1982. 02. 23 දිවයින 'කැළයක් මැදින් නටබුන් රැසක්" වාර්තාව
1982. 07. 14 දිනමිණ "සෙල්ලිපියක් හා ලෙණක් මහවනමැදින් සොයාගනී." වාර්තාව.

**රහත්කන්ද;—**

1981. 11. 20 දිනමිණ "රහත්කන්ද තපෝවනය" ලිපිය

**ආඬියාකන්ද:—**

1981. 05. 06 දිනමිණ ''ලංකා සිතියමේ හැඩයේ ගල්ලෙණක් හමුවේ.'' වාර්තාව.
1981. 05. 10 සිළුමිණ ''ආඬියාකන්ද තපෝවනය'' ලිපිය.
1981. 12. 10 පිටවූ "රිටිගල ආඬියාකන්ද තපෝවනය'' පොත.

**හුණුවල:—**

2513 ඉල් අමාවක බුදුසරණ ''වළගම්බා රජු සැඟවී සිටි හුණුවල ගල්ලෙන් රජමහා විහාරය'' ලිපිය.

**සංවැල්ල:—**

1980. 09. 17 බුදුසරණ "අරුම පුදුම භාස්කම් ඇති සංවැලි රජමහා විහාරය'' ලිපිය.

**බලංගොඩ:—**

" අධ්‍යාපන සියවස් සමරුව " රත්නපුර අධ්‍යාපන දෙපාර්තමේන්තුව, 1969. "සපරගමුව ක්‍රි: පූ: යුගයේ ලංකා ඉතිහාසය සමග බැඳෙන අයුරු බිඳක්" ලිපිය.
සුදර්ශන පැල්මඩුලු ධර්මසංගායනා ශත සංවත්සර කලාපය 1969 "වර්තමාන සපරගමුවේ ක්‍රි: පූ: ඉතිහාසය පිළිබඳ සටහනක් හා එහි බ්‍රාහ්මී ලෙන් අභිලේඛන'' ලිපිය.
දිණමිණ වෙසක් කලාපය. 1970 "ඉපැරණි රාජධානියක්වූ හඳගිරිය " ලිපිය, " ගිරිනුවර රාජධානිය හඳගිරියද " 1971විද්‍යොදය විශ්ව විද්‍යාලයේ ඉතිහාස අංශයෙන් ප්‍රකාශ කළ ලිපිය. බුදුසරණ - 2513 නවම් අටවක, 2513 මැදින්පුර අටවක 2513 මැදින් අව අටවක, 2513 බක් අව අටවක, 2514 වෙසක් අමාවක, 2514 පොසොන් අව අටවක යන පත්‍රවල පළවූ ''සඳගනා නුවර නටබුන් ලිපි පෙළ.
1979. 09. 18 පිටවූ ''හඳගිරිය හෙවත් සඳගනා නුවර'' පොත.
බුදුසරණ 1979. 11. 03 මහ සුදර්ශන ලෙන් විහාරය'' ලිපිය.
1979. 03. 10 දිනමිණ ''බලංගොඩින් සෙල්ලිපි රැසක්'' වාර්තාව
1979. 03. 12 දවස ''පැරණි සෙල්ලිපි රැසක් හමුවෙලා'' වාර්තාව
1980, 02. 01 දිනමිණ "බලංගොඩින් පැරණි පුරාවස්තු මතුවේ" වාර්තාව
1980. 02. 08 ලංකාදීප, ''බුදුදහම පැමිණීමටත් පෙර මෙරට බෞද්ධ ආයර්‍ය පරපුරක් සිටියේලු." ලිපිය. 80. 09. 06 දිනමිණ නටබුන්වී ගිය වෙහෙරක් හමුවේ. වාර්තාව,
1980. 11. 09 රිවිරැස චන්දන ග්‍රාම රාජ්‍ය සුලමුල හෙළිකරති. වාර්තාව, 81. 03. 01 සිළුමිණ "කිරිමකුළුගොල්ල නටබුන්"

ලිපිය ධර්ම ශාස්ත්‍රීය සංග්‍රහය, 1981 රත්නපුර බෞද්ධ සංගමයේ අර්ධශත සංවත්සර කලාපය, වෙලි වලවේ - කටුපත් ඔයත්හි ඉහළ කොටසෙහි කළ ඓතිහාසික ගවේෂණයක ලිපිය.

1982. 06. 10 දිවයින හඳගිරියේ දළද මාලිගාවක් තිබුණේද ලිපිය

1982. 07. 22 දිවයින චන්දනගාම මාලිගය ලිපිය.

1982. 07. 08 දිවයින "අෂ්ටඵලරුහ බෝධිය" ලිපිය

1982. 11. 09 දවස "බලංගොඩින් තව නටබුන්" වාර්තාව

1982. 11. 11 දිනමිණ "වෙලිඔයෙන් අරමක නටබුන්" වාර්තාව

1983. 04. 28 දිවයින "පුරාවස්තු රැසක් සොයාගනී"

## අංකිත සටහන් විස්තර (හබුතගල විහාරය)

1 JRAS . CB. Vol, V. P II. PP 140
2 මාගම රාජධානිය 27 පිටුව.
3 අංක 1 සටහනමය
4 මහාවංශ XXII, 23 හා XXIV. 8
5 මහාවංශ XXXII. 68 හා 72
6 VAMSATTHAPAKASINI (P.T.S.) P 618 අඩොලිපි
7 EPIGRAPHIA ZEYLANIKA. Vol. V. P 209
8 INSCRIPTION OF CEYLON Vol. I. P. XXVI
9 "ශ්‍රී සුමංගල" අනුස්මරණ කලාපය.
10 නුවරයුගයේ අත්ලිපිවල මෙය දක්නා ලැබේ.
11 මහාවංස - XXXV, 86

## අංකිත සටහන් විස්තර (පුළුකුණාව)

1 ASCAR 1935 P. 9. No, 35, 41 සහ INSCRIPTIONS OF CEYLON Vol. I. P. 32 (I.C.)
2 1982. 03. 06 සිට 9 දක්වා දෙවන වරට පුළුකුණාව ගවේෂණය කළෙමි.
3 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සුළු කැණීමක් කර ඇත. 1961 - 62 වාර්තාව 22 පිටුව.
4 මහා වංශ I. 41, 42 ථූපවංස මියුගුණු දගැබ් කථාව.
5 මහාවංස XXV, 7
6 ඓතිහාසික ලේඛන සංග්‍රහය, අංක 2, 1962 විද්‍යාලංකාර වි: වි;- 1 පිට සිට.
7 සහස්සවත්ථුප්පකරණ, ගරු බුඩදත්ත නාහිමි - 104 පිට

8 එම 106 පිට.

9 එම 115 පිට, සිහල වත්ථුප්පකරණ, ගරු බුඩදත්ත නාහිමි 20 පිට.

10 ධාතුවංසය කුමාරතුංග සංස්.- 63 පිට.

11 සමන්තපාසාදිකා III, 376 පිටුව.

12 සාරසංග්‍රහ 33 පිටුව.

13 සඩර්මරත්නාකරය. 364 පිටුව.

14 විසුඩිමග්ග. 168 පිටුව.

15 ජා: අ: V. 163. පිටුව.

16 සුමංගල විලාසිනී. 131 පිටුව.

17 U, C.R. VIII No. 4 P 261

18 එම ප්‍රශදෙවතෙරහ මනපදගනෙ.

19 IC. P.5..... ...ඉම විහර කරිත ප්‍රශදෙව තෙරහ .. ......

20 මේ ස්ථානය අද හින්දු කෝවිලක් ලෙස පවත්වාගෙනයයි. පැරණි නම ''රහත්ගල''ය.

මහජන පුස්තකාලය
නගර ශාඛාව

10 වැනි පිටුවේ ඡායාරූපය
පොතේ කතෘ ශාස්ත්‍රවෙල විහාරයේ මුහුද අයිනේ ගවේෂණයක යෙදෙන අයුරු.

16 වැනි පිටුවේ ඡායාරූපය
බුදුගල්ලෙන විහාරයේ සෙල්ලිපියක් පරීක්ෂණ කරන අයුරු.

විමර්ශන අංශය



## කතෘ ගැන,

පේරාදෙනියේ විශ්ව විද්‍යාලයෙන් බී. ඒ. ගෞරව උපාධියත්, විද්‍යොදය විශ්ව විද්‍යාලයෙන් බී. ඒ. ගෞරව උපාධිය හා එම්. ඒ. උපාධියත් උසස් ලෙස ලබා ප්‍රවීන විභාගාදියද සමත්ව ඇති ගරු එල්ලාවල මේධානන්ද හිමි, විද්‍යොදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයවල කලක් කථිකාචාර්ය වරයකු ලෙසද කටයුතු කර ඇති කෙනෙකි. දැනට ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ තනතුරක් දරණ උන්වහන්සේ ර/ ඇල්ලෙපොල ඉහා විද්‍යාලයේ විදුහල්පති ලෙස කටයුතු කරති, රත්නපුර සස්කෘතික මණ්ඩලයේ පුරාවිද්‍ය කමිටුවේ සභාපති පදවියද, බලන්ගොඩ රාජ්‍ය සංසථා බෞද්ධ සමිතියේ සභාපති පදවියද, ශ්‍රීලංකා පුරාවිද්‍යා සංගමයේ යාවජීව සාමාජික පදවියද, දරණ ගරු මේධානන්ද හිමි, කලක සිට පුරාවිද්‍යා ගවේෂණවල නිරතව බොහෝ නව සොයා ගැනීම් කර ඇත. කුඩාකල සිටම පුවත්පත් සඟරා වලට නොයෙක් විධියේ ශාස්ත්‍රීය ලිපි ලේඛන සපයා ඇති උන්වහන්සේ ග්‍රන්ථ රැසක්ද ලියා ඇත. කවියකු මෙන්ම ධර්ම කථිකයකු, දක්ෂ විදුහල්පතිවරයකු වශයෙන්ද, බොහෝ ජනාදරයට පාත්‍රවී සිටින ගරු එල්ලාවල මේධානන්ද හිමි, නාපාවල ශ්‍රී සුමංගලාරාමය, සංවැලි රජමහා විහාරය, යන උභය විහාරාධිපති ගරුතර නාපාවල සෝරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය වරයාය,